
# ජනාධිපති කාර්යාලය
# சனாதிபதி செயலகம
# Presidential Secretariat



කාර්ය සාධන වාර්තාව
செயலாற்றுகை அறிக்கை
Performance Report

# 2015


මෛත්‍රී
පාලනයක්...
ස්ථාවර රටක්



## අතිගරු ජනාධිපතිතුමාගේ පණිවිඩය

කාර්ය සාධනයෙහි පූර්ව කොන්දේසිය වන්නේ සැලසුම්කරණයයි. සැලසුමකින් තොරව කාර්ය සාධනයක් අපේක්ෂා කළ නොහේ. එය සාර්ථක ජීවිතයක් විෂයෙහි මෙන්ම වැඩබිම්, කම්හල්, කාර්යාල ආදී කවර ක්ෂේත්‍රයකට වුවද අදාළය. විශේෂයෙන්ම සඳහන් කළ යුත්තේ රටක් ලෙසින් ගත් කළ සැලසුම්කරණය අනිවාර්ය සාධකයක් බවය.

එහෙත් අප එක් වකවානුවක දුටුවේ කිසිදු සැලසුම්කරණයකින් තොරව කිසිදු පාරදෘෂ්‍යභාවයකින් තොරව කටයුතු සිදු කෙරුණු අයුරුය. ඒ නිසාම නාස්තිය, දූෂණය, රාජ්‍ය සම්පත් අවභාවිතය සමඟ රට ගමන් කරමින් තිබුණේ පරිහානියේ ආගාධය කරාය.

2015 ජනවාරි අටවැනිදා ජනතාව අවනතිය කරා ගමන් කරමින් තිබූ රට යහමඟට ගැනීම උදෙසා ගත් තීන්දුව ඓතිහාසිකය. අප මේ නිරතව සිටිනුයේ ජනතාව විසින් අපට පැවරූ රට හරිමඟට ගැනීමේ වෙහෙසකර ප්‍රයත්නයේය.

එහිලා අපට සෘජු තීරණ ගැනීමට සිදුවනු ඇත.රාජ්‍ය  සේවයේ පවත්නා කල්මැරීමේ ක්‍රමවේද ඉවත් කර කඩිනම්, ඵලදායී ක්‍රියාශීලී පිළිවෙත් සමඟ අනුගතවන්නට සිදුවනු ඇත.අතීතයේදී සිදු වූ වැරදි යළි සිදු නොවනු පිණිස කටයුතු කරන්නට සිදු වනු ඇත.

ජනාධිපති කාර්යාලය ආදර්ශවත්ව, පරමාදර්ශීයව, ඵලදායී ලෙස කඩිනම්ව මිලියන විසිදෙකක් තරම් වන ජනතාව සඳහා සේවයට කැපවිය යුත්තේ රටේ නියාමන යාන්ත්‍රණය කේන්ද්‍රීයව පවතින්නේ මෙම කාර්යාලයේ ක්‍රියාකාරීත්වය තුළ බැවිනි.

ඔබ අප සැම ඒ වගකීම සපුරා ඉටු කිරීමට බැඳී සිටින්නෙමු.

අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය



## ජනාධිපති ලේකම්තුමාගේ පණිවිඩය

ජනාධිපති කාර්යාලයේ කාර්යයභාරය අනෙකුත් අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතනයන්හි කාර්යයභාරයට සාපේක්ෂව සුවිශේෂී වූවකි. ජනාධිපතිවරයාට සෘජුවම වගවීම සේම ජනාධිපතිවරයාගේ දැක්ම රටට ජනතාවට ලබාදීම අප වෙත පැවරෙන ප්‍රධාන කාර්යය භාරයන්ය.

ජනතාවගේ විශේෂ අවධානයට ලක්වන රජයේ ආයතන අතර ජනාධිපති කාර්යාලය ප්‍රධාන ආයතනයක් වෙයි. එසේම ජනතාවගේ හුදු මහත් අවශ්‍යතා ඉටු කරගැනීමට ඇති පහසුම හා ප්‍රධානතම ආයතනයවීම නිසාම ජනාධිපති කාර්යාලය සැමවිටම ජනතා අවශ්‍යතා පෙරමුණෙහිලා කටයුතු කළ යුතු අතර කාර්යක්ෂමතාවය ඉහළ මට්ටමින් පවත්වා ගත යුතුව තිබේ.

ඉහත කාරණා පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී ජනාධිපති කාර්යාලයේ කාර්යය සාධනය ඉතා ප්‍රශස්ථ මට්ටමක පවත්වා ගෙන යාමට හැකිවීම අප සැමගේ සතුටට හේතුවන්නකි. ජනාධිපතිතුමාගේ සෘජු මැදිහත්වීම සමග අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක විශේෂ ව්‍යාපෘති පහක් ඉතා සාර්ථකව ජනතාව අතරට ගෙන ගොස් ජනතා සුබසාධනය සැලසීමට ලැබීම අප ලැබූ සුවිශේෂී ජයග්‍රහනයකි. ඒ අතර රාජ්‍ය තාන්ත්‍රික සබඳතා වර්ධනය කර ගනු වස් ක්‍රියාත්මක විශේෂ විදෙස් රාජ්‍ය තාන්ත්‍රික පිළිගැනීම්, සාකච්ඡා සඳහා ජනාධිපති කාර්යාලය සැමවිටම සැදී පැහැදී සිටීම වැදගත්ම කාර්යයක් සේ සලකයි.

ජනාධිපති කාර්යාලය වෙත පැවරී ඇති මේ සුවිශේෂී කාර්යය භාරයන් නිසාම ඉහළ නිලධාරියාගේ සිට පහළම සේවකයා දක්වා දැඩි විනයකින් හා සංයමයකින් කටයුතු කිරීම වැදගත් බව අප අවධාරණය කළ කාරණයක් වන්නේය. එය ඒ අයුරින්ම ආරක්ෂා කරමින් පසුගිය වසර තුළ දැක්වූ සාමූහික ප්‍රයත්නය ප්‍රශංසනීය ය.

එසේම මුදල් පරිපාලනයේ විනය පිරිහීම සම්බන්ධව පසුගිය කාලයේ වූ අපවාදයන් වලින් ජනාධිපති කාර්යාලය නිදහස් කර ගැනීමට අතිගරු ජනාධිපතිතුමාගේ මඟ පෙන්වීම ද කාර්යය මණ්ඩලයේ දැඩි අධීක්ෂණය ද හේතු වූ බව පැවසිය යුතුමය.

නව වසර එළැඹෙන්නේ රටේ සමස්ත සංවර්ධනයේ සුවිශේෂී අවස්ථා රාශියක් ඉලක්ක කොටගෙනය. එබැවින් අපගේ කාර්යයභාරය ද ඊට සාපේක්ෂව වඩාත් කාර්යක්ෂම විය යුතු වෙයි. ඒ සඳහා ඔබ සියලුදෙනාට ශක්තිය ධෛර්යය ලැබේවායි ද මම ප්‍රාර්ථනය කරමි.

**පී.බී. අබේකෝන්**
ජනාධිපති ලේකම්

# පටුන

පිටු අංක

01. හැඳින්වීම ........................................ 1 - 2
02. ලේකම් කාර්යාංශය ........................................ 3 - 14
03. පෞද්ගලික ලේකම් අංශය ........................................ 15
04. කාර්ය මණ්ඩල ප්‍රධානී අංශය ........................................ 16 - 22
05. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සහ ව්‍යවස්ථාපිත කටයුතු අංශය ........................................ 23 -26
06. අභ්‍යන්තර පාලන අංශය ........................................ 27 - 32
07. මානව සම්පත් සංවර්ධන අංශය ........................................ 33 – 36
08. ආයතන සම්බන්ධීකරණ අංශය ........................................ 37 - 42
09. ප්‍රතිපත්ති සම්බන්ධීකරණ හා ප්‍රගති සමාලෝචන අංශය ........................................ 43 - 49
10. මූල්‍ය කළමනාකරණ අංශය ........................................ 50 - 52
11. අභ්‍යන්තර විගණන අංශය ........................................ 53 - 54
12. ජනාධිපති අරමුදල් අංශය ........................................ 55 - 57
13. සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය ........................................ 58 - 78
14. මහජන සම්බන්ධතා අංශය ........................................ 79 -80
15. මාධ්‍ය අංශය ........................................ 81 - 83
16. ප්‍රතිසන්ධාන අංශය ........................................ 84
17. ප්‍රවාහන අංශය ........................................ 85 - 87
18. නීති අංශය ........................................ 88 - 91
19. වෛද්‍ය සේවා ඒකකය ........................................ 92
20. ජනාධිපති විමර්ශන ඒකකය ........................................ 93
21. ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව ........................................ 94





# ජනාධිපති කාර්යාලය

## ශ්‍රී ලංකාව

## 01.හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා රාජ්‍ය නායකයාද, විධායකයේ ප්‍රධානියා සහ සන්නද්ධ හමුදාවල ආඥාපතිද වේ. ශ්‍රී ලංකා ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයාට පැවරී ඇති යුතුකම්, වගකීම් සහ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා පරිපාලනමය සහ ආයතනික රාමුව ජනාධිපති කාර්යාලය විසින් සපයනු ලබයි. වර්තමාන ජනාධිපති කාර්යාලය පිහිටා ඇත්තේ ගාලු මුවදොර පැරණි පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේය. අප රටේ දේශපාලන ප්‍රගතියේ ඉතා වැදගත් ආයතනික සංධිස්ථානයක් නියෝජනය කරන මෙම ආකර්ෂණීය මන්දිරය ඇතැන්ස් නුවර "ඇක්‍රොපොලිස්" කඳුමුදුනේ ඇති ග්‍රීක් දෙවිඳුවට කැප වූ ප්‍රධාන සිද්ධස්ථානය වන පාතීනන් දේවස්ථානයට අනුරූපීව නිර්මාණය කර ඇත. එහි ශෛලිය පංචවිධ ශෛලියන්ගෙන් එකක් වූ 'අයෝනික ශෛලිය' ගුරු කොටගෙන ඇත. 1930 ජනවාරි 29 ආණ්ඩුකාර ශ්‍රීමත් හර්බට් ස්ටැන්ලි විසින් මෙම ගොඩනැගිල්ල විවෘත කරන ලදී.

ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායක ප්‍රතිසංස්කරණ සමඟ සිදු වූ විපර්යාසයන් සමඟ මෙම ගොඩනැගිල්ල රාජ්‍ය මන්ත්‍රණ සභාව (1931-1947) නියෝජිත මන්ත්‍රී මණ්ඩලය (1947-1972) ජාතික රාජ්‍ය සභාව (1972-1978) සහ පාර්ලිමේන්තුව (1978-1982) ලෙස හඳුන්වනු ලැබීය. ශ්‍රී ජයවර්ධනපුරයට පාර්ලිමේන්තුව ගෙනයෑමෙන් පසු මෙම ඓතිහාසික මන්දිරය 1983 සැප්තැම්බර් 08 දා සිට ජනාධිපති ලේකම් කාර්යාලය ලෙස හඳුන්වයි. මෙම මන්දිරය ඉදිකිරීමේ ව්‍යාපෘතියට මුල්ගල තබන ලද්දේ 1912 ආණ්ඩුකාරවරයා වූ අතිගරු ශ්‍රීමත් හෙන්රි මැකලම් මැතිඳුන් විසිනි.යුධ හමුදා නිවස්නය සහ බේරේ වැව අතර ගාළුමුවදොර උතුරු කෙළවර පිහිටි වගුරු බිම ගොඩ කිරීමෙන් පසු ගාළුමුවදොර මාවතේ බටහිරට මුහුණ ලා විධානාත්මක ස්වරූපයකින් මන්දිරය ඉදි කෙරිණි.

ජනාධිපති කාර්යාලයේ පරිපාලන කටයුතු සම්බන්ධයෙන් ප්‍රධානියා වනුයේ සිවිල් සේවයේ ජ්‍යෙෂ්ඨතම නිලධාරියකු හා ශ්‍රී ලංකා පරිපාලන සේවයෙහි ප්‍රධානියා බවට නිල බලයෙන් පත්වන්නා වූ ජනාධිපති ලේකම්වරයාය. රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම අරභයා සියලු අංශ සම්බන්ධීකරණය හා සමාලෝචනය කිරීමේ කටයුතු, සුවිශේෂිත ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රගතිය අධීක්ෂණය හා පසුවිපරම් කිරීම, ප්‍රත්‍යක්ෂ ලෙස දැකිය හැකි මහජන අභිලාෂයන් හා දුක්ගැනවිලි පිළිබඳ කටයුතු කිරීම හා විදේශ සම්බන්ධතා සම්බන්ධයෙන් කටයුතු කිරීම ජනාධිපති කාර්යාලයේ ප්‍රධාන කාර්යයන් වේ.

**ජනාධිපති කාර්යාලය පහත දැක්වෙන අංශ වලින් සමන්විත වේ.**

- *ලේකම් කාර්යාංශය*
- *පෞද්ගලික ලේකම් අංශය*
- *කාර්ය මණ්ඩල ප්‍රධානී අංශය*
- *ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සහ ව්‍යවස්ථාපිත කටයුතු අංශය*
- *අභ්‍යන්තර පාලන අංශය*
- *මානව සම්පත් සංවර්ධන ඒකකය*
- *ආයතන සම්බන්ධීකරණ ඒකකය*
- *ප්‍රතිපත්ති සම්බන්ධිකරණ හා ප්‍රගති සමාලෝචන අංශය*
- *මූල්‍ය කළමනාකරණ අංශය*
- *අභ්‍යන්තර විගණන අංශය*
- *ජනාධිපති අරමුදල් අංශය*
- *සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය*
- *මහජන සම්බන්ධතා අංශය*
- *මාධ්‍ය අංශය*
- *ප්‍රතිසන්ධාන කාර්යාලය*
- *ප්‍රවාහන ඒකකය*
- *තොරතුරු තාක්ෂණ ඒකකය*
- *නීති අංශය*
- *වෛද්‍ය සේවා ඒකකය*
- *ජනාධිපති විමර්ශන ඒකකය*
- *ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව*

# 02. ලේකම් කාර්යාංශය

## *හැඳින්වීම*

අතිගරු ජනාධිපතිතුමා වෙනුවෙන් ජනාධිපති ලේකම්තුමා විසින් ඉටු කරනු ලබන කාර්යයන් වඩාත් පහසු කරලීම හා ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම මෙම අංශය මඟින් සිදුවේ. ඒ අනුව, අංශය මඟින් සිදු කෙරෙන ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

## *පොදු අරමුණු / කාර්යයන්*

- උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාවට අදාළ කාර්යයන් ඉටු කිරීම.
- විදේශීය රාජ්‍ය නායකයන් පැමිණෙන අවස්ථාවලදී අතිගරු ජනාධිපතිතුමාගේ/ ජනාධිපති ලේකම්තුමාගේ උපදෙස් පරිදි උත්සව සංවිධානය හා සම්බන්ධීකරණ කටයුතු ඉටු කිරීම.
- විදේශ කටයුතු අමාත්‍යාංශය හා සිදු කෙරෙන ලිපි සම්බන්ධ කටයුතු.
- ජනාධිපති ලේකම් කාර්යාංශය විසින් කැඳවන රැස්වීම් සඳහා ආරාධනා සැකසීම, රැස්වීමේ පහසුකම් විමසා බලා අවශ්‍ය කටයුතු කිරීම, රැස්වීම් සටහන් පවත්වාගෙන යාම, පසුවිපරම් කිරීම ඇතුළු සියලු සංවිධාන කටයුතුවලට සහායවීම.
- අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ රැස්වීම් සම්බන්ධීකරණය.
- අතිගරු ජනාධිපතිතුමාගේ/ජනාධිපති ලේකම්තුමාගේ උපදෙස් පරිදි චක්‍රලේඛ නිකුත් කිරීම.
- දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු පත්වීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- සර්ව පාක්ෂික සමුළුව හා සර්ව ආගමික සමුළුවට අදාළ සංවිධාන කටයුතු හා සම්බන්ධීකරණ කටයුතු.
- අතිගරු ජනාධිපතිතුමා වෙත වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කළයුතු පුද්ගලයන්ගෙන් එම වත්කම් බැරකම් ප්‍රකාශ ලබාගැනීම සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- ජනාධිපති පරිසර නියමු රන් පදක්කම්ලාභීන්ගේ සම්මුඛ පරීක්ෂණවල විනිශ්චය මණ්ඩල සභාපති ධුර කටයුතු කිරීම.

- අතිගරු ජනාධිපතිතුමා හා ජනාධිපති ලේකම් වෙත ඉදිරිපත් වන විවිධ පැමිණිලි/ඉල්ලීම් ආදී විවිධ කටයුතු සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමාගේ / ජනාධිපති ලේකම්තුමාගේ උපදෙස් පරිදි ක්‍රියා කිරීම.
- ජනාධිපති කාර්යාලය හා ඒ යටතේ ඇති ආයතනවල නිලධාරීන්ට අදාළව සහනදායී මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධ කටයුතු.
- අතිගරු ජනාධිපතිතුමා විසින් සහ ජනාධිපති කාර්යාංශය මඟින් එදිනෙදා සිදුකරනු ලබන සුවිශේෂී කාර්යයන් පිළිබඳ මාසික වාර්තාවක් පිළියෙල කිරීම.
- අතිගරු ජනාධිපතිතුමා විසින් විවිධ අවස්ථාවල දෙනු ලබන උපදෙස් පරිදි සියලුම අමාත්‍යාංශයන්හි නිල වාහන සම්බන්ධ කටයුතු කිරීම.
- ජනාධිපති කාර්යාලයේ සියලුම චක්‍රලේඛ/අභ්‍යන්තර ලිපි, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛ/මුදල් චක්‍රලේඛ හා වෙනත් වැදගත් සුවිශේෂී චක්‍රලේඛ/ලිපි සම්බන්ධ ගොනු යාවත්කාලීනව පවත්වාගෙන යාම.

## *2015 වර්ෂයේ සාක්ෂාත් කර ගැනීම්*

- **අති උතුම් ශුද්ධෝත්තම ෆ්‍රැන්සිස් පාප් වහන්සේගේ ශ්‍රී ලංකා සංචාරය**



අති උතුම් ශුද්ධෝත්තම ෆ්‍රැන්සිස් පාප් වහන්සේ ශ්‍රී ලංකාවට සැපත්වීම නිමිත්තෙන් 2015 ජනවාරි මස 13 වන දින ජනාධිපති කාර්යාලයේ පැවති උත්සවයේ සහ ජනාධිපති මන්දිරයේ එතුමා සහ අතිගරු ජනාධිපතිතුමන් අතර පැවති ද්විපාර්ශවික සාකච්ඡාවේ සම්බන්ධීකරණ කටයුතු මෙම අංශය මඟින් සිදු කරන ලදී.

- **අතිගරු ජනාධිපතිතුමා විසින් පොලිස් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ පවත්වන ලද සාකච්ඡාව**

2015 පෙබරවාරි මස 13 වන දින අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පොලිස් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ සාකච්ඡාවක් පවත්වන ලද අතර, මහජන සාමය හා ආපදා කළමනාකරණය සහ ක්‍රිස්තියානි කටයුතු අමාත්‍යතුමා, එම අමාත්‍යාංශයේ ලේකම්, පොලිස්පතිතුමා ඇතුළු පොලිස් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් සහ නියෝජ්‍ය පොලිස්පතිවරුන් 37 දෙනෙක් එම රැස්වීම සඳහා සහභාගී විය. පොලිස් දෙපාර්තමේන්තුව සඳහා නිසි උසස්වීමේ ක්‍රමවේදයක් සකස් කිරීමේ අවශ්‍යතාවය, පොලිසිය මඟින් සලසන සේවාවන් විධිමත් කිරීම, ආපදා කළමනාකරණ කටයුතු විධිමත් කිරීම, දඩ මුදල් ගෙවීමට කෙටි ක්‍රමයක් යෙදීම හා පොලිස් අභ්‍යාස විද්‍යාලය ස්ථාපිත කිරීම ඇතුළු විවිධ කරුණු ගණනාවක් පිළිබඳව මෙහිදී සාකච්ඡා කරන ලදී.

- **විදේශීය තානාපතිවරුන් හා එක්සත් ජාතීන්ගේ සහ ඊට සුවිශේෂී වූ අනෙකුත් ජාත්‍යන්තර සංවිධානවල නියෝජිතයින් සමඟ සාකච්ඡාව**

2015 පෙබරවාරි මස 13 වන දින විදේශීය තානාපතිවරුන් හා, එක්සත් ජාතීන්ගේ සහ ඊට සුවිශේෂී වූ අනෙකුත් ජාත්‍යන්තර සංවිධානවල නියෝජිතයින් අතිගරු ජනාධිපතිතුමන් සමඟ පවත්වන ලද සාකච්ඡාව සඳහා විදේශීය තානාපතිවරුන් 45 දෙනෙක් හා අනෙකුත් ජාත්‍යන්තර සංවිධානවල නියෝජිතයින් 24 දෙනෙක් සහභාගී වූ අතර, එම සාකච්ඡාව සම්බන්ධීකරණය හා සංවිධානය කිරීම මෙම අංශය මඟින් සිදු විය.

- **අතිගරු ජනාධිපතිතුමාගේ ඉන්දීය නිල සංචාරය**



2015 පෙබරවාරි මස 15 වන දින සිට 18 වන දින දක්වා අතිගරු ජනාධිපතිතුමන් සිදු කරන ලද ඉන්දීය නිල සංචාරයේ සම්බන්ධීකරණ කටයුතු විදේශීය කටයුතු අමාත්‍යාංශය සමඟ එක්ව සිදු කරන ලදී.

## ➢ අතිගරු ජනාධිපතිතුමා හා ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ නිලධාරීන් සමඟ පැවති සාකච්ඡාව

2015 පෙබරවාරි මස 26 වන දින අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ නිලධාරීන් සමඟ පැවති සාකච්ඡාවේ සංවිධාන කටයුතු හා සම්බන්ධීකරණ කටයුතු මෙම අංශය මඟින් සිදු කරන ලද අතර, මෙම සාකච්ඡාවේදී ශ්‍රී ලංකා පරිපාලන සේවයේ කාර්යභාරය, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පුරප්පාඩු පිරවීම, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ වැටුප් විෂමතා නිවැරදි කිරීම, ශ්‍රී ලංකා පරිපාලන සේවය සඳහා වෘත්තීමය ආයතනයක් පිහිටුවීම, අවිධිමත් ලෙස නිලධාරීන් ස්ථාන මාරු කිරීම වැළැක්වීම, ශ්‍රී ලංකා පරිපාලන සේවා නිලධාරීන් විදේශීය දූත මණ්ඩල පුරප්පාඩු සඳහා පත් කිරීම, ප්‍රසම්පාදන කටයුතු විධිමත් කිරීම හා ඉඩම් විෂයය සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීම යන කරුණු සාකච්ඡාවට භාජනය විය.

## ➢ ඉන්දීය අග්‍රමාත්‍යතුමාගේ ශ්‍රී ලංකා නිල සංචාරය



දෙදින නිල සංචාරයක් සඳහා ශ්‍රී ලංකාවට පැමිණි ඉන්දීය අග්‍රාමාත්‍යතුමා ජනාධිපති කාර්යාලයට පැමිණීම වෙනුවෙන් 2015 මාර්තු මස 13 වන දින පැවති උත්සවයේ පිළිගැනීමේ කටයුතු, ද්වි පාර්ශවික සාකච්ඡාව, ගිවිසුම් අත්සන් කිරීම සහ ඉන්දීය අග්‍රාමාත්‍යවරයා වෙනුවෙන් පැවති විශේෂ රාත්‍රී භෝජන සංග්‍රහයේ කටයුතු සම්බන්ධීකරණය කිරීම ලේකම් කාර්යාංශය මඟින් සිදු විය.

- **කටාර් රාජ්‍ය නායක, ශයික් තමීම් බින් හමාද් අල් තානි මැතිතුමාගේ ශ්‍රී ලංකා නිල සංචාරය**



2015 මාර්තු මස 24 වන දින ශ්‍රී ලංකාවට සැපත් වූ කටාර් රාජ්‍යයේ නායක, ශයික් තමීම් බින් හමාද් අල් තානි මැතිතුමාගේ රාජ්‍ය සංචාරය වෙනුවෙන් ජනාධිපති කාර්යාලයේ පැවති පිළිගැනීමේ උත්සවය, ද්විපාර්ශවික සාකච්ඡාව සහ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම යන අංගයන් මෙම අංශය මඟින් සංවිධානය කෙරිණි

- **අතිගරු ජනාධිපතිතුමාගේ චීන නිල සංචාරය**

2015 මාර්තු මස 25 වන දින සිට 29 වන දින දක්වා අතිගරු ජනාධිපතිතුමා නිරත වූ චීන නිල සංචාරයේ සම්බන්ධීකරණ කටයුතු විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ එක්ව සිදු කරන ලදී.



## ➢ අතිගරු ජනාධිපතිතුමාගේ පාකිස්ථානු නිල සංචාරය



අතිගරු ජනාධිපතිතුමා විසින් 2015 අප්‍රේල් මස 05 වන දින සිට 07 වන දින දක්වා නිරත වූ පාකිස්ථානු නිල සංචාරයේ සම්බන්ධීකරණ කටයුතු විදේශ කටයුතු අමාත්‍යාංශය හා එක්ව සිදු කිරීම මෙම අංශය මඟින් සිදු විය.

## ➢ භූතාන අග්‍රමාත්‍යතුමාගේ ශ්‍රී ලංකා නිල සංචාරය

2015 අප්‍රේල් මස 09 වන දින සිට 12 වන දින දක්වා ශ්‍රී ලංකාවේ සිව්දින නිල සංචාරයක යෙදුනු භූතාන අග්‍රාමාත්‍යතුමා අප්‍රේල් මස 09 වන දින ජනාධිපති කාර්යාලයට පැමිණීම නිමිත්තෙන් පැවැත් වූ නිල පිළිගැනීමේ උත්සවය, ද්විපාර්ශවික සාකච්ඡාව සහ ගිවිසුම් අත්සන් කිරීම යන අංගයන් සම්බන්ධීකරණය කිරීම සිදු විය.



## ➢ අතිගරු ජනාධිපතිතුමා හා ලංකා වාණිජ මණ්ඩලයේ නිලධාරීන් සමඟ පැවති සාකච්ඡාව


අතිගරු ජනාධිපතිතුමන් හා ලංකා වාණිජ මණ්ඩලයේ නිලධාරීන් සමඟ 2015 ජූනි මස 23 වන දින පැවැත්වූ සාකච්ඡාවේ සම්බන්ධීකරණ කටයුතු සහ සංවිධාන කටයුතු ලේකම් කාර්යාංශය මඟින් සිදු කරන ලදී.

## ➢ අතිගරු ජනාධිපතිතුමාගේ මාලදිවයින් නිල සංචාරය



මාලදිවයින් රාජ්‍යයේ 50 වන නිදහස් සැමරුම වෙනුවෙන් 2015 ජූලි මස 26 වන දින සිට 27 වන දින දක්වා අතිගරු ජනාධිපතිතුමන් විසින් සිදු කරන ලද දෙදින නිල සංචාරයේ සම්බන්ධීකරණ කටයුතු විදේශ කටයුතු අමාත්‍යාංශය හා එක්ව සිදු කරන ලදී.

## ➢ නව අමාත්‍ය මණ්ඩලය දිවුරුම් දීමේ උළෙල



2015 සැප්තැම්බර් මස 04 වන දින පැවති නව අමාත්‍ය මණ්ඩලය දිවුරුම් දීමේ උත්සවයේ සංවිධාන හා සම්බන්ධීකරණ කටයුතු මෙම අංශය මඟින් සිදු කරන ලදී.

## ➢ රාජ්‍ය හා නියෝජ්‍ය අමාත්‍යවරුන් දිවුරුම් දීමේ උළෙල

2015 සැප්තැම්බර් මස 09 වන දින පැවති රාජ්‍ය හා නියෝජ්‍ය අමාත්‍යවරුන් දිවුරුම් දීමේ උත්සවයේ සංවිධාන කටයුතු හා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

## ➢ අතිගරු ජනාධිපතිතුමාගේ නිව්යෝර්ක් නිල සංචාරය



2015 සැප්තැම්බර් මස 23 වන දින සිට ඔක්තෝබර් මස 02 වන දින දක්වා නිව්යෝර්ක් නුවර පැවති 70 වන එක්සත් ජාතීන්ගේ මහා සම්මේලනයට සහභාගී වූ අතිගරු ජනාධිපතිතුමන්ගේ එම නිල සංචාරයේ සම්බන්ධීකරණ කටයුතු විදේශ කටයුතු අමාත්‍යාංශය හා එක්ව සිදු කරන ලදී.

- **අතිගරු ජනාධිපතිතුමාගේ තායිලන්ත නිල සංචාරය**



අතිගරු ජනාධිපතිතුමා විසින් 2015 නොවැම්බර් මස 01 වන දින සිට 04 වන දින දක්වා සිදු කරන ලද තායිලන්ත නිල සංචාරයේ සම්බන්ධීකරණ කටයුතු විදේශ කටයුතු අමාත්‍යාංශය හා එක්ව සිදු කරන ලදී,

- **උතුරු හා නැගෙනහිර පළාත්වල නැවත පදිංචි කිරීමේ කටයුතු පිළිබඳ සාකච්ඡාව**

උතුරු හා නැගෙනහිර පළාත්වල නැවත පදිංචි කිරීමේ කටයුතු කඩිනම් කිරීම සම්බන්ධව 2015 නොවැම්බර් මස 11 වන දින පැවති සාකච්ඡාවේ සියලු සම්බන්ධීකරණ කටයුතු ලේකම් කාර්යාංශය මඟින් සිදු කෙරිණි.

- **අතිගරු ජනාධිපතිතුමාගේ මෝල්ටා නිල සංචාරය**




2015 නොවැම්බර් මස 26 වන දින සිට 29 වන දින දක්වා අතිගරු ජනාධිපතිතුමන් විසින් සිදු කරන ලද මෝල්ටා රාජ්‍යයේ නිල සංචාරයේ සම්බන්ධීකරණ කටයුතු විදේශ කටයුතු අමාත්‍යාංශය හා එක්ව සම්බන්ධීකරණය කිරීම මෙම අංශය මඟින් සිදු විය.

- **අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රංශ නිල සංචාරය**




අතිගරු ජනාධිපතිතුමන් විසින් 2015 නොවැම්බර් මස 29 වන දින සිට දෙසැම්බර් මස 01 වන දින දක්වා සිදු කරන ලද ප්‍රංශ නිල සංචාරයේ සම්බන්ධීකරණ කටයුතු විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ එක්ව සිදු කිරීම.

- **අතිගරු ජනාධිපතිතුමාගේ වතිකානු රාජ්‍යයේ නිල සංචාරය**



2015 දෙසැම්බර් 13 වන දින සිට 15 වන දක්වා වතිකානු රාජ්‍යයේ නිල සංචාරයක නිරත වූ අතිගරු ජනාධිපතිතුමන්ගේ එම සංචාරයේ සම්බන්ධීකරණ කටයුතු විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ එක්ව සිදු කරන ලදී.

- **නත්තල් දිනය වෙනුවෙන් පැවති විශේෂ රාත්‍රී භෝජන සංග්‍රහය**

2015 වර්ෂයේ නත්තල් උත්සවය නිමිත්තෙන් දෙසැම්බර් මස 22 වන දින ජනාධිපති මන්දිරයේ පැවති විශේෂ නත්තල් රාත්‍රී භෝජන සංග්‍රහයේ සම්බන්ධීකරණ කටයුතු හා සංවිධාන කටයුතු සිදු කිරීම වෙනුවෙන් මෙම අංශයේ දායකත්වය ලබා දෙන ලදී.



## ➢ සර්ව පාක්ෂික සමුළු රැස්වීම්



ශ්‍රී ලංකාවේ සංහිඳියාව, වගවීම හා මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම සඳහා 2015 ඔක්තෝම්බර් මස 22 වන දින හා නොවැම්බර් මස 17 වන දින පැවැත්වූ සර්ව පාක්ෂික සමුළු රැස්වීම්වල සම්බන්ධීකරණ හා සංවිධාන කටයුතු සිදු කිරීම මෙම අංශය මඟින් සිදු කරන ලදී. 2015 නොවැම්බර් මස 17 වන දින පැවති දෙවන සර්ව පාක්ෂික සමුළු සාකච්ඡාවේදී පක්ෂ නියෝජිතයන් අතිගරු ජනාධිපතිතුමාගෙන් කරන ලද ඉල්ලීම පරිදි එක් එක් දේශපාලන පක්ෂ යොමු කළ අදහස් හා යෝජනා අනුසාරයෙන් සකසන ලද සාරාංශගත වාර්තාවක් භාෂාත්‍රයෙන් අදාළ පාර්ශවයන් වෙත ඉදිරිපත් කරන ලදී.

## ➢ අමාත්‍යාංශ ලේකම්වරුන් සමඟ පැවති සාකච්ඡා

අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2015.06.23 දින අමාත්‍යාංශ ලේකම්වරුන් සමඟ එක් රැස්වීමක් ද, ජනාධිපති ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් 2015.01.24, 2015.05.12 හා 2015.11.02 යන දිනයන්හි රැස්වීම් 03 ක් ද පවත්වන ලද අතර, එම රැස්වීම්වල සංවිධාන කටයුතු සිදු කරන ලදී.

## ➢ සහනදායී මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීම

පහත සඳහන් නිලධාරීන් සඳහා සහනදායී මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීම මෙම අංශය මඟින් සිදු කෙරිණි.

- විනිසුරු බී.එල්.කේ.විමලචන්ද්‍ර මහතා - කොමසාරිස්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
- ගරු බී.පී.අලුවිහාරේ මැතිතුමා - ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු
- ආර්. එම්. විජේරත්න මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රී ලංකා පදනම
- ඩී. අයි. ද .එස්. බාලපටබැඳිගේ මහතා - සභාපති, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
- සී. එන්. පලිහවඩන මහතා - නියෝජ්‍ය අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

## ➢ මාසික වැඩසටහන් පිළිබඳ වාර්තාව

අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන්, ජනාධිපති ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් හා ජනාධිපති කාර්යාලය මඟින් සංවිධානය කරනු ලබන විවිධ වැඩසටහන්, රැස්වීම් සහ උත්සව අවස්ථාවන්ට අදාළව සාරාංශගත තොරතුරු 2015 දෙසැම්බර් දක්වා මාසිකව සකස් කර ජනාධිපති ලේකම්තුමා වෙත ඉදිරිපත් කිරීම.

## ➢ චක්‍රලේඛ නිකුත් කිරීම

පහත අංක දරණ චක්‍රලේඛ නිකුත් කිරීම මෙම අංශය මඟින් සිදු කෙරිණි.

| අනු අංකය | චක්‍රලේඛයේ නම | චක්‍රලේඛ අංකය | දිනය |
|---|---|---|---|
| 01. | දූෂණ, වංචා හා රජයේ සම්පත් අපහරණය කිරීම පිළිබඳ ලිපිලේඛන | SP/SB/01/15 | 2015.02.02 |
| 02. | පසුගිය රජයේ අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන් සහ මන්ත්‍රීවරුන් වෙත නිල ප්‍රවාහන පහසුකම් ලබා දීම | SP/SB/02/15 | 2015.02.05 |
| 03. | පසුගිය රජයේ අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන් සහ මන්ත්‍රීවරුන් වෙත නිල ප්‍රවාහන පහසුකම් ලබා දීම (උක්ත චක්‍රලේඛයට සංශෝධන වශයෙන් නිකුත් කර ඇත) | SP/SB/02/15 | 2015.02.09 |
| 04. | පසුගිය රජයේ ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන් සඳහා නිල ප්‍රවාහන පහසුකම් ලබා දීම | SP/SB/03/15 | 2015.02.13 |
| 05. | පළාත් සභාවන්හි නිලධාරීන් රේඛීය අමාත්‍යාංශවල කටයුතු සඳහා සහභාගි කරවා ගැනීම | SP/SB/04/15 | 2015.03.06 |
| 06. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 50 (ආ) වගන්තිය පිළිබඳව ඔබේ අවධානය යොමු කරවමි | SB/02/ චක්‍රලේඛ | 2015.06.29 |
| 07. | රාජ්‍ය අංශයේ උත්සව, සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීම | SP/SB/07/15 | 2015.09.25 |
| 08. | රජයේ කාර්යාලයීය වෙබ් අඩවි යාවත්කාලීන කිරීම | SP/SB/08/15 | 2015.12.15 |
| 09. | ක්‍රීඩා හා ශරීර සුවතා ප්‍රවර්ධන ජාතික සතිය හා විශේෂ දිනය ක්‍රියාවට නැංවීම - 2016 ජනවාරි 25-30 | SP/SB/09/15 | 2015.12.31 |
| 10. | ලිපි, චක්‍රලේඛ, ප්‍රතිපත්තිමය තීරණ, රැස්වීම් වාර්තා සහ සාකච්ඡා සටහන්වල පිටපත් යොමු කිරීම. | SB/2/1/A/10 | 2015.05.20 |

### ➢ *ජනාධිපති පරිසර නියමු රන්පදක්කම් ලාභීන්ගේ සම්මුඛ පරීක්ෂණවල විනිශ්චය මණ්ඩලවල කටයුතු*

2015 වර්ෂයේදී පහත සඳහන් ස්ථානයන්හි පැවති පරිසර නියමු පදක්කම් පිරිනැමීම සඳහා වන සම්මුඛ පරීක්ෂණන්හි විනිශ්චය මණ්ඩල කටයුතුවල නිරත විය.

| දිනය | ස්ථානය |
|---|---|
| 2015 මැයි මස 11 සහ 12 | කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 2015 මැයි මස 18 | අල් අලීෂා ජාතික පාසල අම්පාර |
| 2015 මැයි මස 21 සහ 22 | පොල්ගොල්ල මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් කාර්යාලය |
| 2015 ජූලි 06 සහ 07 | බිබිල, මැදගම ජාතික පාසල |
| 2015 ජූලි 30 | විශාඛා විද්‍යාලය, බම්බලපිටිය |
| 2015 සැප්තැම්බර් 28 හා 29 | අනුරාධපුර, පදවි, ඊයාය 05 කණුව, මධ්‍ය මහා විද්‍යාලය |
| 2015 ඔක්තෝබර් 01 හා 02 | මධ්‍යම පරිසර අධිකාරිය, මධ්‍යම පළාත් සභාව |

### ➢ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සම-සභාපතිවරුන් පත් කිරීම

**01.** දිස්ත්‍රික්ක 25 සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සම-සභාපතිවරුන් 67 දෙනෙකු පත් කිරීමට කටයුතු කර ඇත.

**02.** ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සඳහා එක්සත් ජනතා නිදහස් සන්ධානය වෙනුවෙන් සම-සභාපතිවරු 53 දෙනෙකු ද, කළුතර දිස්ත්‍රික්කයේ බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සඳහා එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් සම-සභාපතිවරයෙකු ද පත් කිරීමට කටයුතු කර ඇත.

# 03. පෞද්ගලික ලේකම් අංශය

### *හැඳින්වීම*

අතිගරු ජනාධිපතිතුමාගේ දෛනික වැඩසටහන්/උපදෙස් හා නියෝග /ලිපි හා වාර්තා සම්බන්ධයෙන් උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව ක්‍රියා කිරීම.

### *පොදු අරමුණු/ කාර්යයන්*

- අතිගරු ජනාධිපතිතුමාගේ දෛනික වැඩසටහන්/ උපදෙස් හා නියෝග/ ලිපි හා වාර්තා සම්බන්ධයෙන් උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව කටයුතු කිරීම

- අතිගරු ජනාධිපතිතුමා සම්බන්ධ වන උත්සව, රැස්වීම් හා හමුවීම් අවස්ථා සටහන් තබමින් දින පොත සැකසීම. ඒ අනුව දෛනික වැඩසටහන් පෙළගැස්වීම, සම්බන්ධීකරණය හා අදාළ අංශ හා නිලධාරීන් දැනුවත් කිරීම

- අතිගරු ජනාධිපතිතුමාගේ නියෝග අනුව එතුමාගේ අත්සනට ලිපි සැකසීම

- අතිගරු ජනාධිපතිතුමාගේ අවධානයට යොමුවිය යුතු ලිපි/වාර්තා, උත්සව ආරාධනා ආදිය සටහන් සහිතව එතුමාට ඉදිරිපත් කිරීම හා ඒ සඳහා ලබා දෙන නියෝග අනුව කටයුතු කිරීම

- අතිගරු ජනාධිපතිතුමා වෙත මහජන නියෝජිතයින් හා ජනතාව විසින් එවනු ලබන ලිපි සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම

- ලැබෙන තැපැල හා සම්බන්ධ තොරතුරු යාවත්කාලීන කිරීම/ලිපිගොනු සැකසීම හා පවත්වාගෙන යාම

# 04. කාර්ය මණ්ඩල ප්‍රධානී අංශය

*මෙහෙවර*

**පවත්නා භෞතික, මූල්‍ය හා මානව සම්පත් ප්‍රශස්ථ ලෙස උපයෝගී කර ගනිමින් රාජ්‍ය ප්‍රතිපත්තිවල අරමුණු අපේක්ෂිත ගුණාත්මකභාවයෙන් සඵල කර ගැනීම**

## *හැඳින්වීම*

ජනාධිපති කාර්ය මණ්ඩලය කළමනාකරණය කිරීම, අතිගරු ජනාධිපතිතුමාගේ ආරක්ෂක කටයුතු සම්බන්ධීකරණය කිරීම, කොළඹ හා පිට පළාත්වල උත්සව හා රැස්වීම් සම්බන්ධීකරණය කිරීම හා අතිගරු ජනාධිපතිතුමාට ලැබෙන ලිපි, ව්‍යාපෘති යෝජනා හා අනෙකුත් පණිවුඩ එතුමාගේ උපදෙස් අනුව ක්‍රියාත්මක කිරීමට ක්‍රියාමාර්ග ගැනීම, ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී කාර්යාලයේ ප්‍රධාන වගකීම වේ.

## *පොදු අරමුණු/කාර්යයන්*

- ජනාධිපති කාර්ය මණ්ඩලය විධිමත්ව කළමනාකරණය කිරීම
- අතිගරු ජනාධිපතිතුමාගේ ආරක්ෂාව තහවුරු කිරීම
- අතිගරු ජනාධිපතිතුමාගේ කොළඹ හා පිට පළාත්වල රැස්වීම් හා උත්සව සම්බන්ධීකරණය
- අතිගරු ජනාධිපතිතුමාගේ රැස්වීම් හා සාකච්ඡා ඵලදායී ලෙස පැවැත්වීම තහවුරු කිරීම සඳහා සම්බන්ධීකරණය
- අතිගරු ජනාධිපතිතුමාට ලැබෙන ලිපි, ව්‍යාපෘති යෝජනා හා අනෙකුත් පණිවුඩ සම්බන්ධව ක්‍රියාමාර්ග ගැනීම
- "පිබිදෙමු පොළොන්නරුව" දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන හා පාරිසරික හා බලශක්ති ක්ෂේත්‍රයන්හි ව්‍යාපෘති සම්බන්ධීකරණය

## 2015 වර්ෂයේ සාක්ෂාත් කරගැනීම

### I. ජනාධිපති කාර්ය මණ්ඩලය විධිමත්ව කළමනාකරණය කිරීම.

ජනාධිපති කාර්යාලයට අනුයුක්ත සියලු කාර්ය මණ්ඩල සඳහා විෂයානුබද්ධ දැනුම, කාර්යාලයීය ක්‍රම හා විනය හා ආකල්ප වර්ධනය සඳහා වැඩමුළු පැවැත්වීම සහ පසුවිපරම් කිරීම.

### II. අතිගරු ජනාධිපතිතුමාගේ ආරක්ෂාව තහවුරු කර තිබීම.

කාර්යාලයේ සහ නිල නිවසේ, ක්ෂේත්‍ර රාජකාරීවලදී ආරක්ෂක ප්‍රධානීන් සමඟ සාකච්ඡා කර සම්බන්ධීකරණ වැඩපිළිවෙලක් සකස් කිරීම. අතිගරු ජනාධිපතිතුමාගේ හා කාර්යාලයේ තොරතුරු අනවශ්‍ය පාර්ශවයන් වෙත යොමුවීම වැළැක්වීම සඳහා ක්‍රියාපිළිවෙලක් සකස් කිරීම.

ජංගම දුරකථන හා ඉලෙක්ට්‍රොනික උපකරණ කාර්යාලය තුළට රැගෙන ඒම පාලනය කිරීම. කාර්යාලයට පැමිණෙන අමුත්තන් පැමිණීම හා පිටවීම අධීක්ෂණය කිරීමේ වැඩපිළිවෙලක් ස්ථාපනය කිරීම.

### III. අතිගරු ජනාධිපතිතුමාගේ කොළඹ හා පිට පළාත්වල රැස්වීම් හා උත්සව සම්බන්ධීකරණය.

අතිගරු ජනාධිපතිතුමා කොළඹ හා පිට පළාත්වල සහභාගී වන රැස්වීම්වල සූදානම, එයට සහභාගී වීමේ යෝග්‍යතාවය හා එහි දී කථාවක් පැවැත්වීමේ යෝග්‍යතාව, ආරාධනා කර ඇති හා සහභාගී වීම තහවුරු කර ඇති ආරාධිතයින් පිළිබඳ තොරතුරු, රැස්වීමේ අරමුණ, රැස්වීම හෝ උත්සව භූමියට ප්‍රවේශවන මාර්ග විස්තරය, මාධ්‍ය ආවරණය හා ආරක්ෂක විධිවිධාන පිළිබඳව පූර්ණ අවබෝධය ලබා ගනිමින් ඒ පිළිබඳ ගරු ජනාධිපතිතුමා දැනුවත් කිරීම.

මෙම අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා ජනාධිපති සම්බන්ධීකරණ ලේකම්වරුන්ට දිස්ත්‍රික්කවල වගකීම් පවරා ඇති අතර එම නිලධාරීන්ගෙන්ද ජනාධිපති ආරක්ෂක අංශ නිලධාරීන්ගෙන්ද තොරතුරු ලබාගැනීමට හා ලබාගන්නා තොරතුරු දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් තහවුරු කර ගැනීමේ වැඩපිළිවෙලක්ද ක්‍රියාත්මක කිරීම

## IV. අතිගරු ජනාධිපතිතුමාගේ රැස්වීම් හා සාකච්ඡා ඵලදායී ලෙස පැවැත්වීමට තහවුරු කිරීම.

අතිගරු ජනාධිපතිතුමා සහභාගී වන ජනාධිපති කාර්යාලයේ පැවැත්වෙන රැස්වීම්වල අරමුණු, ඉදිරිපත් විය හැකි ගැටලු හා ඉල්ලීම්, සහභාගී වන පාර්ශවයන්, රැස්වීමේ අරමුණු අනුව සෘජුවම සම්බන්ධවන ආයතන පිළිබඳව පූර්ව අවබෝධයකින් යුතුව අතිගරු ජනාධිපතිතුමා දැනුවත් කිරීම.

අතිගරු ජනාධිපතිතුමා රැස්වීමට ප්‍රවේශවීමට පෙර න්‍යාය පත්‍රය, සහභාගී වන්නන් පිළිබඳ තොරතුරු, රැස්වීමේ අරමුණුට අදාල පසුබිම් තොරතුරු සහිත ගොනුවක් සහ සටහනක්, සටහන් තබා ගැනීමේ ලිපිද්‍රව්‍ය මේසය මත සූදානම්ව ඇති බව තහවුරු කර ගැනීම සහ අවස්ථාවෝචිත පරිදි මාධ්‍ය ආවරණ සූදානම තහවුරු කිරීම.

## V. අතිගරු ජනාධිපතිතුමාට ලැබෙන පෞද්ගලික ලිපි, ව්‍යාපෘති යෝජනා හා අනෙකුත් පණිවුඩ සම්බන්ධව ප්‍රතිචාර දැක්වීම.

අතිගරු ජනාධිපතිතුමා වෙත ලැබෙන මහජන ඉල්ලීම් හඳුනාගෙන වර්ගීකරණය කර අදාළ අංශ වෙත යොමු කිරීම. යොමුකළ ලිපි සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග පසුවිපරම් කිරීම. මහජන අවශ්‍යතා ඉටුකිරීමට ඇති බාධා හඳුනාගෙන ඒවා ඉවත් කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග ක්‍රියාත්මක වීම පිළිබඳව පසුවිපරම් කිරීම. මහජන අවශ්‍යතා ඉටුවීම තහවුරු කරගැනීම.

## VI. "පිබිදෙමු පොළොන්නරුව" දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන හා වෙනත් පාරිසරික හා බලශක්ති ඇතුළු ව්‍යාපෘති සම්බන්ධීකරණය.

"පිබිදෙමු පොළොන්නරුව" දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන (සාරාංශය)

| ක්ෂේත්‍රය / ව්‍යාපෘතිය | ව්‍යාපෘති ගණන |
|---|---|
| පාසැල් ආශ්‍රිත සංවර්ධන කටයුතු | 28 |
| පාසැල් සඳහා සනීපාරක්ෂක පහසුකම් | 86 |
| පාසල් වලට මේස පුටු කට්ටල ලබාදීම | 48,500 |
| පිරිවෙන් සංවර්ධනය | 02 |
| රෝහල් ආශ්‍රිත සංවර්ධන කටයුතු | 02 |
| වන ජීවී සංරක්ෂණය | 02 |
| වන සංරක්ෂණ | 01 |
| ගොවිජන සේවා | 12 |
| මහවැලි බී කලාපයේ මාර්ග හා ඇළ මාර්ග සංවර්ධනය | 08 |
| පොදු පහසුකම් | 11 |

## "පිබිදෙමු පොළොන්නරුව" දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන යටතේ 2015 වර්ෂයේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

### 1. පාසැල් ආශ්‍රිත සංවර්ධන කටයුතු

1.1 කදුරුවෙල මුස්ලිම් මධ්‍ය මහා විද්‍යාලයේ තෙමහල් පංති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම.

1.2 විලයාය මධ්‍ය මහා විද්‍යාලයේ තෙමහල් පංති කාමර ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම.

1.3 මනම්පිටිය දෙමළ මහා විද්‍යාලයේ දෙමහල් පංති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම.

1.4 වැලිකන්ද මහා විද්‍යාලයේ දෙමහල් පංති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම.

1.5 මැදිරිගිරිය ජාතික පාසලේ තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම.

1.6 විජිත මධ්‍ය මහා විද්‍යාලයේ දෙමහල් පංති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම.

1.7 මින්නේරිය ජාතික පාසලේ සිසුන් 800 ක් සඳහා ශ්‍රවණාගාරය ඉදිකිරීම.

1.8 මහසෙන් මධ්‍ය මහා විද්‍යාලයේ තාක්ෂණික ඒකකය සමඟ තෙමහල් පංති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම.

1.9 ඇතුමල්පිටිය ප්‍රාථමික විද්‍යාලයේ දැනට පළමු මහල පමණක් සම්පූර්ණ කර ඇති පංති කාමර ගොඩනැගිල්ලේ දෙවන මහල ඉදිකිරීම.





1.10 ලංකාපුර ජයන්ති කණිෂ්ඨ විද්‍යාලයේ පංති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම.

1.11 සුංගාවිල මුස්ලිම් මහා විද්‍යාලය පංති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම.

1.12 සුගලාදේවි ප්‍රාථමික විද්‍යාලයේ පංති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම.

1.13 සිරිපුර මධ්‍ය මහා විද්‍යාලයේ දෙමහල් පංති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම.

1.14 සිරිපුර ප්‍රාථමික විද්‍යාලයේ වැසිකිළි පද්ධතිය ඉදිකිරීම.

1.15 නිකවතලන්ද මහා විද්‍යාලයට විධිමත් ජල සැපයුම් පද්ධතියක් ලබාදීම.

1.16 දිවුලන්කඩවල මහා විද්‍යාලයේ පංති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම.

1.17 සූරියගම ප්‍රාථමික විද්‍යාලයේ පංති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම.

**1.18** ගල්ඔය කණිෂ්ඨ විද්‍යාලයේ නිල නිවාසයක් සහ ගුරු නිවාස වැසිකිළි දෙකක් ඉදිකිරීම.

**1.19** හිඟුරක ප්‍රාථමික විද්‍යාලයේ පංති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම.



**1.20** අතරගල්ලෑව මහා විද්‍යාලයේ සිසු වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම.

**1.21** අතරගල්ලෑව මහා විද්‍යාලයේ පානීය ජලය සඳහා ළිඳ හා නළ පහසුකම් ලබාගැනීම.

**1.22** නාමල්වැව ප්‍රාථමික විද්‍යාලයේ පංති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම.

**1.23** බකමූණ මහසෙන් මහා විද්‍යාලයේ පංති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම.

**1.24** විලයාය ප්‍රාථමික විද්‍යාලයේ දෙමහල් පංති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම.

**1.25** අල්ඉක්රා ප්‍රාථමික විද්‍යාලයේ දෙමහල් පංති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම.

**1.26** කිරිමැටිය කණිෂ්ඨ විද්‍යාලයේ දෙමහල් පංති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම.

**1.27** ඉරහඳ කෙටුවැව විද්‍යාලයේ දෙමහල් පංති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම.

**1.28** මඩුදමන ප්‍රාථමික විද්‍යාලයේ දෙමහල් පංති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම.

## 2. ආගමික ක්ෂේත්‍රයේ සංවර්ධනය

**2.1** දිඹුලාගල කාශ්‍යප ආරණ්‍ය සේනාසනයේ දෙමහල් ධර්ම ශාලාව ඉදිකිරීම.

**2.2** බැදිවැව මහින්දාරාම විහාරස්ථානයේ භික්ෂු නේවාසිකාගාරය අලුත්වැඩියා කිරීම.

## 3. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සංවර්ධනය

**3.1** මැදිරිගිරිය රෝහලේ හෙද නේවාසිකාගාරය ඉදිකිරීම.

**3.2** මනම්පිටිය ප්‍රාදේශීය රෝහලේ බාහිර රෝගී ප්‍රතිකාර, හදිසි ප්‍රතිකාර, සායනික හා පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම.

## 4. වනජීවී සංරක්ෂණය

**4.1** 286 සිංහපුර වැලිකන්ද ත්‍රිකෝණමඩුව වන පිවිසුම දෙපස කි.මී. 46ක විදුලිවැට ඉදිකිරීම.

4.2 නුවරගල කලුකැලේ විදුලිවැට ඉදිකිරීම.

## 5. වන සංරක්ෂණය

**5.1** පටපිළිකන්ද ක්ෂේත්‍ර පුහුණු මධ්‍යස්ථානය අලුත්වැඩියා කිරීම.

## 6. ගොවිජන සේවා - කෙත් ඇළ ප්‍රතිසංස්කරණය කිරීම

6.1 ඉලුක්පිටිය අමුණ හා ඇළ.
6.2 පාලු වැව පෝෂිත ඇළ.
6.3 කඩවල වැව පෝෂිත ඇළ.
6.4 කටුකැලියාව සමඟි ඇළ මාර්ගය.
6.5 අක්කර 60 අමුණ හා ඇළ.
6.6 පුදුර් අමුණ හා ඇළ මාර්ගය.
6.7 කිරිමැටිපිට වැව හා ඇළ.
6.8 ගණන්ගොල්ල අමුණ හා ඇළ.
6.9 ජනසවි අමුණ හා ඇළ.
6.10 පැරකුම් ගම ඇළ මාර්ගය.
6.11 කටුකැලියාව ගම මැද ඇළ මාර්ගය.
6.12 දිගන්නෑව වැව හා ඇළ මාර්ගය.

## 7. මහවැලි බී කලාපයේ මාර්ග හා ඇළ මාර්ග සංවර්ධනය

7.1 පැළෑටියාව සහ ඇල්ලේවැව ඒකකයන්හි ඇති ඇළ පද්ධතිවලට අදාල මාර්ග පද්ධති පුනරුත්ථාපනය කිරීම.
7.2 දිඹුලාගල කොට්ඨාශයේ ඇති ඇළ පද්ධතිවලට අදාල මාර්ග පුනරුත්ථාපනය කිරීම.
7.3 පිඹුරත්තෑව ඒකකයේ ඇති ඇළ පද්ධතිවලට අදාල මාර්ග පුනරුත්ථාපනය කිරීම.
7.4 අරුණපුර ඒකකයේ ඇති ඇළ පද්ධති පුනරුත්ථාපනය කිරීම.
7.5 අලුත්වැව ඒකකයේ ඇති ඇළ පද්ධතියට අදාල මාර්ග පුනරුත්ථාපනය කිරීම.
7.6 සේනපුර කොට්ඨාශයේ රුහුණුකෙත ඒකකයේ ඇළ පුනරුත්ථාපනය කිරීම.
7.7 සිංහපුර කොට්ඨාශයේ ඇති ඇළ පද්ධතිවලට අදාල මාර්ග පුනරුත්ථාපනය කිරීම.
7.8 මැණික්දෙණිය ඒකකයේ ඇති ඇළ පද්ධතියට අදාල මාර්ග පුනරුත්ථාපනය කිරීම.

## 8. පොදු පහසුකම් සංවර්ධනය

8.1 ලක්ෂඋයන කණිෂ්ඨ විද්‍යාලයේ බහුකාර්ය ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිම කිරීම.
8.2 පැරණි ධවල මන්දිර ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම.
8.3 වැලිකන්ද ගුරු නේවාසිකාගාරයේ ඉතිරි වැඩ නිම කිරීම.
8.4 වැලිකන්ද ගුරු නේවාසිකාගාරය සඳහා ගෘහ උපකරණ ලබාදීම.
8.5 ඇළහැර ආදාහනාගාරයේ ඉතිරි වැඩ නිම කිරීම.
8.6 ලක්ෂ උයන ප්‍රජා ශාලාව ඉදිකිරීම.
8.7 ලක්ෂ උයන ප්‍රජා ශාලාව සඳහා අවශ්‍ය උපකරණ ලබාදීම.
8.8 රාජකීය විද්‍යාලය නවීකරණය කිරීම.
8.9 දිඹුලාගල ආයුර්වේද ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිම කිරීම I අදියර.
8.10 දිඹුලාගල ආයුර්වේද ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිම කිරීම II අදියර.
8.11 ගිරිතලේගම මහා විද්‍යාලයේ ශ්‍රවණාගාරයේ ශබ්ද විකාශන පද්ධතිය සඳහා කාමර වෙන් කිරීම.

ඉහත සඳහන් ව්‍යාපෘති සඳහා රු.මි. 400ක් 2015 වර්ෂයේ දී වැය කර ඇත.

- **ගම්පහ පහළ යාගොඩ සංවර්ධන වැඩසටහන**

1. ගම්/ ස්වර්ණපාලි මහා විද්‍යාලය වැඩිදියුණු කිරීම.
2. පහල යාගොඩ කේන්ද්‍ර කරගත් මාර්ග පද්ධතිය පුළුල් කිරීම හා ව්‍යාප්ත කිරීම.
3. පහල යාගොඩ හා අවට නගර යා කෙරෙන ප්‍රවාහන පද්ධතිය වැඩිදියුණු කිරීම.
4. යාගොඩ - ඔරුතොට වෙල්යායට අදාල වාරි ගැටළු විසඳීම හා කෘෂිකාර්මික ඵලදායීතාවය ඉහල නැංවීම.
5. පහල යාගොඩ පානීය ජල පහසුකම් ව්‍යාප්ත කිරීම.
6. පහල යාගොඩ ප්‍රදේශයේ තරුණ තරුණියන්ගේ වෘත්තීය පුහුණුව හා කුසලතා ප්‍රවර්ධනය.
7. පහල යාගොඩ කේන්ද්‍ර කරගත් ග්‍රාමීය කර්මාන්ත ස්ථාපනය කිරීම.

# 05. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සහ ව්‍යවස්ථාපිත කටයුතු අංශය

**මෙහෙවර**

*යහපාලනයට අනුකූලව නව ශ්‍රී ලංකාවක් ගොඩ නැගීමට ශ්‍රී ලාංකීය සමාජයේ සියලුම කොටස්වලට නායකත්වය හා මාර්ගෝපදේශකත්වය සැපයීම.*

## *හැඳින්වීම*

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හා විවිධ අණපනත් මඟින් අතිගරු ජනාධිපතිතුමා විසින් ක්‍රියාත්මක කළ යුතු බවට සඳහන් කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය සහය ලබා දීම .

## *පොදු අරමුණු / කාර්යයන්*

ඉහත කී බලතල හා වගකීම් ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන වලට අනුකූව කාර්යක්ෂමව හා අනලස්ව ඉටු කිරීම.

## *2015 වර්ෂයේ සාක්ෂාත් කරගැනීම්*

| *1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් හා වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධාන අනුව අතිගරු ජනාධිපතිතුමන් විසින් සිදු කරනු ලබන විවිධ තනතුරු සඳහා පත් කිරීම* | |
|---|---|
| • අමාත්‍ය මණ්ඩල අමාත්‍යවරුන් | 46 |
| • රාජ්‍ය අමාත්‍යවරුන් | 19 |
| • නියෝජ්‍ය අමාත්‍යවරුන් | 23 |
| • පළාත් ආණ්ඩුකාරවරුන් | 09 |
| • අග්‍රවිනිශ්චයකාරතුමා | 01 |

| | |
|---|---|
| • ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් | 02 |
| • අභියාචනාධිකරණ විනිසුරුවරුන් | 03 |
| • මහාධිකරණ විනිසුරුවරුන් | 14 |
| • අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකවරුන් | 01 |
| • උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් | 02 |
| • මහාධිකරණ කොමසාරිස්වරුන් | 03 |
| • ජනාධිපති නීතිඥවරුන් | 02 |
| • ශ්‍රී ලංකා විනිශ්චය ආයතනයේ සාමාජිකයන් | 02 |
| • ස්වාධීන කොමිෂන් සභා සාමාජිකයන් | |
| ➢ මානව හිමිකම් කොමිෂන් සභාවේ සාමාජිකයන් | 05 |
| ➢ සීමා නිර්ණය කොමිෂන් සභාවේ සාමාජිකයින් | 03 |
| ➢ ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ සාමාජිකයන් | 05 |
| ➢ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් | 09 |
| ➢ ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජිකයන් | 07 |
| ➢ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ සාමාජිකයින් | 03 |
| ➢ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් | 01 |
| ➢ මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයන් | 03 |
| ➢ මුදල් කොමිෂන් සභාවේ සාමාජිකයන් | 05 |
| ➢ විගණන සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් | 05 |
| • අමාත්‍යාංශ ලේකම්වරුන් | 45 |
| • පළාත් ප්‍රධාන ලේකම්වරුන් | 04 |
| • ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 වන ව්‍යවස්ථාව අනුව ජනාධිපති සමාව ලබා දීම | 06 |
| • සන්නද්ධ හමුදා නිලධාරීන් | |
| ➢ යුධ හමුදාපති | 01 |
| ➢ නාවික හමුදාපති | 01 |
| ➢ ගුවන් හමුදාපති | 01 |
| ➢ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී | 01 |
| • විගණකාධිපති | 01 |
| • විශ්ව විද්‍යාල කුලපතිවරුන් | 02 |
| • විශ්ව විද්‍යාල උපකුලපතිවරුන් | 06 |

| | |
|---|---|
| • ශ්‍රී ලංකා විදුලි සන්දේශ නියාමන කොමිෂන් සභාවේ සාමාජිකයන් | 03 |
| • පොදු කොන්ත්‍රාත් ගිවිසුම් රෙජිස්ට්‍රාර් | 01 |
| • බාලදක්ෂ මූලස්ථාන කොමසාරිස් වරුන් | 03 |
| • බාලදක්ෂ දිස්ත්‍රික් කොමසාරිස්වරුන් | 06 |
| • ජාතික ශිෂ්‍යභට බලකායේ අධ්‍යක්ෂ | 01 |
| • මධ්‍යම පරිසර අධිකාරියේ සාමාජිකයන් | 03 |
| • ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් | 01 |
| • රණවිරු සේවා අධිකාරියේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් | 05 |
| • ජාතික ළමාරක්ෂක අධිකාරියේ සාමාජිකයන් | 13 |
| • ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් | 08 |
| • ජාතික මූලික අධ්‍යයන ආයතනයේ පර්යේෂණ සභාවේ සාමාජිකයන් | 02 |
| *11.ඉඩම් ඔප්පු ,දීර්ඝ කාලීන බදුකර* | |
| • දීර්ඝ කාලීන බදුකර නිකුත් කිරිම | 267 |
| • සංවර්ධනය කල ඉඩම් සඳහා දීමනාපත්‍ර නිකුත් කිරීම | 166 |
| • රණවිරු ඔප්පු නිකුත් කිරීම | 22 |
| • සුනාමි දීමනාපත්‍ර නිකුත් කිරීම | 1113 |
| • විහාරස්ථාන සඳහා දීමනාපත්‍ර | 66 |
| • ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත ඉඩම් ලබා දීම | 02 |
| • නාගරික සංවර්ධන අධිකාරිය වෙත ඉඩම් පැවරීම | 03 |
| • නිවාස සංවර්ධන අධිකාරිය වෙත ඉඩම් පැවරීම | 07 |
| • විකල්ප ඉඩම් ලබාදීම | 09 |
| • මහවැලි බදුකර | 52 |
| • මහවැලි දීමනාපත්‍ර ලබා දීම (සංවර්ධන කල ඉඩම් සඳහා ) | 52 |
| • මහවැලි දීමනාපත්‍ර ලබා දීම (ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ) | 5856 |
| • මහවැලි විහාරස්ථාන | 08 |
| • ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය ඇවර කිරීම මත සේවය අහිමි සේවකයින්ට දීමනාපත්‍ර මත ඉඩම් ලබා දීම | 37 |
| • නව රන්බිම දීමනාපත්‍ර | 7900 |
| • රජයේ ඉඩම් ආඥා පනතේ 3 වගන්තියෙන් අවලංගු කිරීම | 19 |

| | |
|---|---|
| • රජයේ ඉඩම් ආඥා පනතේ 4 (1) වගන්තියෙන් අවලංගු කර, 4(3) වගන්තියෙන් නව දීමනාපත්‍ර ලබා දීම | 1532 |
| • මධ්‍යම පාන්තික ඉඩම් | 13 |
| • රජයේ ඉඩම් ආඥා පනතේ 104 වගන්තියෙන් අවලංගු කිරීම | 32 |
| *111. ප්‍රසම්පාදන අභියාචන මණ්ඩල* | |
| • ප්‍රසම්පාදන අභියාචන මණ්ඩල රැස්වීම | 33 |
| *1V. සන්නද්ධ හමුදා සාමාජිකයන්ට වීර පදක්කම් ප්‍රදානය කිරීම* | 551 |
| *V. ත්‍රිවිධ හමුදා අක්ත පත්‍ර ප්‍රදානය කිරීම* | 190 |
| *V1 අධිකාරීපත්‍ර ප්‍රදානය කිරීම (ගුවන්)* | 149 |
| *V11. අධිකාරීපත්‍ර ප්‍රදානය කිරීම (නාවික)* | 16 |
| *V111. අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන මහජන නියෝජිතයින්ගේ සහ නිලධාරීන්ගේ විදේශ නිවාඩු සඳහා අනුමැතිය ලබා දීම* | 390 |
| *IX. මහජන නියෝජිතයින්ගේ රාජ්‍ය වියදම් කළමනාකරණය සම්බන්ධයෙන් මහජන නියෝජිතයින් කටයුතු කල යුතු ආකාරය පිළිබඳ චක්‍රලේඛ නිකුත් කිරීම* | 01 |

# 06. අභ්‍යන්තර පාලන අංශය

*මෙහෙවර*

*ජනාධිපති කාර්යාලයේ කාර්යක්ෂමතාව නංවාලීමේ අරමුණින් සියලුම අංශ හා ඒකක වල අවශ්‍යතා අප්‍රමාදව සපුරාලීමට අවශ්‍ය පරිපාලනමය සහාය ලබා දීම*

## *හැඳින්වීම*

**ජනාධිපති කාර්යාලය හා ජනාධිපති කාර්යාලයේ සියළුම අංශ හා ඒකක වෙත පැවරී ඇති කාර්යභාරයන් ඵලදායීව, කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍ය කාර්යාල ඉඩකඩ, භෞතික සම්පත් හා සේවාවන් සැපයීම, කළමනාකරණය කිරීම මෙම අංශය මඟින් සිදු වේ.**

## *පොදු අරමුණු / කාර්යයන්*

- **සියළුම අංශ හා ඒකකවලට අදාළව කාර්යාල ඉඩ පහසුකම් උපකරණ හා සේවාවන් සැපයීම.**
- **විශේෂ රාජ්‍ය උත්සව සංවිධානය කිරීම හා ඊට අදාළ පහසුකම් සැලසීම සඳහා අවශ්‍ය අභ්‍යන්තර හා බාහිර පාර්ශවයන් සමඟ කටයුතු කිරීම**
- **අතිගරු ජනාධිපතිතුමා නියෝජනය කරමින් ප්‍රභූන්ගේ අවමංගල්‍ය කටයුතු සඳහා ලැබෙන උපදෙස් පරිදි කටයුතු කිරීම හා අදාළ වියදම් පියවීම.**
- **ජල /විදුලි /දුරකථන බිල්පත් ප්‍රමාදයකින් තොරව පියවීමට අවශ්‍ය කටයුතු කිරීම තුලින් දඩ මුදල් ගෙවීම් අවම කිරීම**
- **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත් කිරීම, භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම, භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව අපහරණය කළයුතු භාණ්ඩ වෙන්දේසි කිරීම/ විනාශ කිරීම සිදු කර නිසි පරිදි වට්ටෝරු භාණ්ඩ ලේඛන පවත්වාගෙන යාමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම .**

- සියලුම අංශ/ඒකක වලින් ලේඛනාගාරය වෙත එවනු ලබන ලිපිගොනු විධිමත්ව අසුරා තැබීම /නඩත්තු කිරීමට අවශ්‍ය කටයුතු ඉටු කිරීම.

- කාර්යාලයේ තැපැල් ඒකකය මඟින් ලැබෙන හා පිටතට යැවෙන තැපැල විධිමත්ව, අප්‍රමාදව හා වගකීමෙන් යුතුව අදාළ අංශ/ඒකක වෙත යොමු කිරීමට කටයුතු කිරීම.

- ජනාධිපති කාර්යාලයේ සියලුම ගොඩනැගිලි වල නඩත්තු හා අලුත්වැඩියා කටයුතු නාවික/හමුදා ඉංජිනේරු අංශයේ සහයෝගයෙන් ප්‍රමුඛතාවය අනුව ඉටු කිරීම.

- වාර්ෂික ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ වසරට අදාළ ඇස්තමේන්තු සකස් කිරීම, සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම, ඊට අනුකූලව භාණ්ඩ ඇණවුම් කිරීම, භාණ්ඩ නිකුත් කිරීම.

- ජනාධිපති කාර්යාලය විසින් සකස් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සන්දේශ, අමාත්‍ය මණ්ඩල පත්‍රිකා, අමාත්‍ය මණ්ඩල සන්දේශ පිළිබඳ නිරීක්ෂණ, ගැසට් නිවේදන, චක්‍රලේඛ, පාර්ලිමේන්තු ප්‍රශ්නවලට පිළිතුරු, විවිධ ආයතන, හා පුද්ගලයින් වෙත යොමු කෙරෙන ලිපිලේඛන හා ලැබෙන ලිපිලේඛන සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාත්‍රයට පරිවර්තනය කිරීම හා කථන පරිවර්තන සේවා සැපයීම.

## *2015 වර්ෂයේ සාක්ෂාත් කරගැනීම*

### 01. රාජ්‍ය තාන්ත්‍රික උත්සව

රාජ්‍ය තාන්ත්‍රික උත්සව කටයුතු සංවිධානය කිරීම හා එහි සියලු කාර්යයන් සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම මෙම අංශය මඟින් ඉටු කරනු ලබන සුවිශේෂී කාර්යයක් වේ. රාජ්‍ය තාන්ත්‍රික උත්සවයන්හි පහත කාර්යයන් කෙරෙහි දැඩි අවධානයක් යොමු කරමින් අදාළ පාර්ශවයන් වෙත උත්සවයේ වගකීම් පැවරීම, ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම, අධීක්ෂණය හා පසුවිපරම් කටයුතු කිරීම මෙම අංශය මඟින් ඉටු කරනු ලබයි.

- විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ මූලික සාකච්ඡාවක් පැවැත්වීමට කටයුතු කිරීම.

- අනතුරුව ජනාධිපති ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් ත්‍රිවිධ හමුදා, රථවාහන පොලිස් සහ අදාළ අනෙකුත් පාර්ශවයන් සමඟ සාකච්ඡා පැවැත්වීම

- හමුදා ආචාර පෙළපාලිය සඳහා විශේෂ පීඨිකාව සැකසීම, රතු පලස් එලීම, හමුදා සම්මාන මුර ආචාර පෙළපාලිය හා කාලතුවක්කු සම්මාන මුර ආචාර පිරිනැමීම සඳහා කටයුතු සංවිධානය කිරීම



- රාජ්‍ය නායක හමුව, ද්විපාර්ශ්වික සාකච්ඡා හා ද්විපාර්ශ්වික ගිවිසුම් අත්සන් කිරීමේ කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම

- සංග්‍රහ, සැරසිලි කටයුතු සංවිධානය කිරීම

- අවශ්‍ය අවස්ථාවලදී විවිධ ආයතන අතර සියළුම සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම

## 2015 වර්ෂයේ ජනාධිපති කාර්යාලයේ පැවති රාජ්‍ය තාන්ත්‍රික උත්සව අවස්ථාවන්

- **2015 .01.13** - අති උතුම් ශුද්ධෝත්තම ප්‍රැන්සිස් පාවුළු පාප් වහන්සේගේ සංචාරය
- **2015.03.13** - ඉන්දියානු අග්‍රාමාත්‍යතුමාගේ සංචාරය
- **2015.03.24** - කටාර් රාජ්‍යයේ නායක, ශයික් තමීම් බින් හමාද් අල් තානී මැතිතුමාගේ සංචාරය
- **2015.04.09** - භූතානයේ අග්‍රාමාත්‍යතුමාගේ සංචාරය
- **2015.08.31** - ඇෆ්ගනිස්ථාන ජනාධිපති හමිඩ් කර්සායි මැතිතුමන්ගේ සංචාරය

## 02. වෙනත් උත්සව අවස්ථාවන්

- **විශිෂ්ඨ සේවා විභූෂණ සම්මාන පිරිනැමීම**
  ආරක්ෂක අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද මෙම උත්සවය සඳහා අවශ්‍ය ශාලා/ආසන /සංග්‍රහ/අලංකරණ පහසුකම් මෙම අංශය මඟින් සපයන ලද අතර, අදාළ අමාත්‍යාංශය විසින් වියදම් දරන ලදී.

- **පරිසර නියමු ජනාධිපති පදක්කම් ප්‍රදානය**
  කොටුව ජනාධිපති මන්දිරයේ පැවති මෙම උත්සවය සඳහා සියලු පහසුකම් මෙම අංශය මඟින් සපයන ලද අතර, මධ්‍යම පරිසර අධිකාරිය විසින් අදාළ වියදම් දරන ලදී.

## 03.අක්තපත්‍ර ප්‍රදානය කිරීමේ උත්සව අවස්ථාවන්

- **2015.04.29** වන දින ජනාධිපති කාර්යාලයේදී අක්තපත්‍ර ප්‍රදානය කරන ලද රටවල්
  - ➢ බහරේන්
  - ➢ හංගේරියාව
  - ➢ එංගලන්තය
  - ➢ ප්‍රංශය
- **2015.05.12** වන දින ජනාධිපති කාර්යාලයේදී අක්තපත්‍ර ප්‍රදානය කරන ලද රටවල්
  - ➢ දකුණු සූඩානය
  - ➢ පාකිස්ථානය
- **2015.07.07** වන දින ජනාධිපති කාර්යාලයේදී අක්තපත්‍ර ප්‍රදානය කරන ලද රටවල්
  - ➢ කෙන්යාව
  - ➢ ගහනාව
  - ➢ ජපානය
  - ➢ සිංගප්පූරුව
- **2015.09.18** වන දින ජනාධිපති කාර්යාලයේදී අක්තපත්‍ර ප්‍රදානය කරන ලද රටවල්
  - ➢ ඉක්වදෝරය
  - ➢ ඇල්ජේරිය
  - ➢ නෝර්වේ
  - ➢ තුර්කිය

- **2015.11.05** වන දින ජනාධිපති කාර්යාලයේදී අක්තපත්‍ර ප්‍රදානය කරන ලද රටවල්
    - කසකස්ථානය
    - සයිබීරියාව
    - කුවේට්

අතිගරු ජනාධිපතිතුමා විසින් අක්තපත්‍ර ප්‍රදානය කිරීමේ අවස්ථා











- අතිගරු ජනාධිපතිතුමා විසින් නිරන්තරව පෞද්ගලික පරිහරණය සඳහා භාවිතා නොකළද ජනාධිපති කාර්යාලය භාරව පවතින ජනාධිපති මන්දිරවල ඓතිහාසික වටිනාකම නොනැසෙන පරිදි ඒවායේ පෞරාණික බව ආරක්ෂා කරමින් නඩත්තු කටයුතු පවත්වාගෙන යාම හා ඒ සඳහා අවශ්‍ය සියලු පහසුකම් සැපයීම, අධීක්ෂණය හා පසුවිපරම් කටයුතු මෙම අංශය මඟින් නිරතුරුවම සිදු කරනු ලබයි.



*ජනාධිපති මන්දිරය - කොළඹ*



*ජනාධිපති මන්දිරය - මහනුවර*



*ජනාධිපති මන්දිරය - නුවරඑළිය*

# 07. මානව සම්පත් සංවර්ධන අංශය

### *හැඳින්වීම*

ජනාධිපති කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ බඳවා ගැනීම් /ස්ථාන මාරු /උසස් කිරීම් /විනය පාලනය සම්බන්ධ ආයතනික කටයුතු සහ කාර්ය මණ්ඩලයේ ඵලදායීතාව ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියා කිරීම.

### *පොදු අරමුණු / කාර්යයන්*

- ජනාධිපති කාර්යාලයේ කාර්යමණ්ඩලය බඳවා ගැනීම, ස්ථානමාරු කිරීම, උසස් කිරීම් හා විනය පාලනය සම්බන්ධ ආයතන කටයුතු
- ජනාධිපති කාර්ය මණ්ඩලය සඳහා මු.රෙ. 71 යටතේ තනතුරු ඇති කිරීමට අදාළ කටයුතු
- ජනාධිපති කාර්යාලයේ සහ අනෙකුත් කාර්යමණ්ඩලයට බඳවා ගනු ලබන නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීනව පවත්වා ගෙන යාම
- ජනාධිපති කාර්යාලයේ කාර්යමණ්ඩලයේ නිලධාරීන්ගේ/ සේවකයින්ගේ ආරක්ෂක නිශ්කාෂණ වාර්තා ලබාගැනීම සම්බන්ධ කටයුතු
- අනුමත සේවක සංඛ්‍යා විස්තර සකස්කිරීම හා යාවත්කාලීනව පවත්වාගෙන යාම
- ජනාධිපති කාර්යාලයේ සංවිධාන ව්‍යුහය පවත්වාගෙන යාම
- ජනාධිපති කාර්යමණ්ඩලයට බඳවාගෙන ඇති රාජ්‍ය සේවයේ ස්ථිර/ තාවකාලික නිලධාරීන්ගේ කාර්ය සාධන වාර්තා ඇගැයීම් කටයුතු
- ජනාධිපති කාර්යමණ්ඩලයට බඳවාගෙන ඇති නිලධාරීන් සඳහා දේශීය/විදේශීය පුහුණු හා සංවර්ධන කටයුතු සංවිධානය කිරීම
- රජයේ නිලධාරීන් සඳහා ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය යටතේ ලබාදිය හැකි නිවාස, දේපළ ණය, ආපදා ණය ඇතුළු වෙනත් ණය මුදල් නිර්දේශ කිරීම/ අනුමත කිරීම
- ජනාධිපති කාර්යමණ්ඩලයේ නිලධාරීන්ගේ නිවාඩු දුම්රිය බලපත්‍ර, අනුග්‍රහ දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර ලබාදීමට අදාළ කටයුතු

- අග්‍රහාර රක්ෂණ වන්දි ලබාදීම නිර්දේශ කිරීම
- ජනාධිපති කාර්යමණ්ඩලයේ නිලධාරීන්ගේ නිවාඩු, අතිකාල දීමනා, ගමන් වියදම් හා අනෙකුත් දීමනා අනුමත කිරීමට අදාළ කටයුතු
- කාර්ය මණ්ඩලයට අයත් නිලධාරීන්ගේ ඵලදායිතාව ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියා කිරීම
- ගුවන්තොටුපල පර්යන්ත විශේෂ පහසුකම් ලබාගැනීමට හිමිකම් ලබන ජනාධිපති කාර්යාලයේ කාර්යමණ්ඩලයේ නිලධාරීන් සඳහා එම පහසුකම් සැලසීම සම්බන්ධ කටයුතු
- විදේශ රාජකාරී ගමන් බලපත්‍ර නිකුත් කිරීමට අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීම සහ වීසා බලපත්‍ර ලබාගැනීමට ඉල්ලුම් කිරීමේදී සේවය සහතික කිරීම
- අතිගරු ජනාධිපතිතුමාගේ විදේශ සංචාරවලදී සහභාගී වන ජනාධිපති කාර්යමණ්ඩලයේ නිලධාරීන්ට විදේශ ගමන් සඳහා හිමි දීමනා සහ ඒ ආශ්‍රිත වියදම් ගෙවීම
- තීරු බදු රහිත වාහන බලපත්‍ර නිකුත් කිරීමට අදාළ රාජකාරී
- පුස්තකාලයට අදාළ පරිපාලන කටයුතු
- එක් භාෂාවකට වැඩි භාෂා ගණනක ප්‍රවීණතාවය ඇති රාජ්‍ය නිලධාරීන්ට දිරි දීමනා ගෙවීම සම්බන්ධ කටයුතු හා රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අදාළ කටයුතු
- පැමිණීමේ හා පිටවීමේ සටහන් තබා ගැනීම සහ ඇඟිලි සලකුණු යන්ත්‍ර සම්බන්ධව අධීක්ෂණය
- චක්‍රීය සේවයේ යොදවන නිලධාරීන්ගේ හා කණිෂ්ඨ සේවකයින්ගේ මාසික චක්‍රීය වැඩසටහන් පිළියෙල කිරීම

## *2015 වර්ෂයේ සාක්ෂාත් කරගැනීම්*


- බඳවා ගැනීම් අනුයුක්ත කිරීම්, ස්ථාන මාරු කිරීම්, විශ්‍රාම ගැනීම් හා විනය පියවර ගැනීම පිළිබඳ රාජකාරි අදාළ කාලය තුළ පත්වීම් හා අනුයුක්ත කිරීම් 326 ක්ද විශ්‍රාම ගැනීම් 39ක් ද ස්ථානමාරු කිරීම් හා ආපසු මුදා හැරීම් 510ක් හා අග්‍රහාර වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම 59 ක්ද සිදු කර ඇත.

## *2015.12.31 දින දක්වා කාර්ය මණ්ඩලය*

**අනුමත කාර්ය මණ්ඩලය : 1496**
**සේවයේ නියුක්ත කාර්ය මණ්ඩලය : 871**

## *2015.12.31 දිනට කාර්ය මණ්ඩලයේ ස්වභාවය*

| ස්ථිර | තාවකාලික | කොන්ත්‍රාත් | අනුයුක්ත | එකතුව |
|---|---|---|---|---|
| 537 | 198 | 53 | 83 | 871 |




## *දේශීය හා විදේශීය පුහුණු අවශ්‍යතා සැපයීම*

### විදේශීය පුහුණු

**විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මඟින් විදේශ පුහුණු පාඨමාලා සඳහා අනුමැතිය ලැබ එම පුහුණු පාඨමාලා සඳහා 2015.01.01 දින සිට 2015.12.31 දින දක්වා සහභාගී වූ මාණ්ඩලික නිලධාරීන් සංඛ්‍යාව 10 කි.**

## දේශීය පුහුණු

**ජනාධිපති කාර්යාලයේ සෑම අංශයකම / ඒකකයකම සිටින ද්විතීයික හා ප්‍රාථමික මට්ටම්වල නිලධාරීන්ගේ/සේවකයන්ගේ දැනුම කුසලතා හා ආකල්ප වර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන් / වැඩමුළු පහත පරිදි පවත්වා ඇත.**

| අනු අංකය | 2015.01.01 සිට 2015.12.31 දක්වා පවත්වන ලද දේශීය පුහුණු පාඨමාලා | පුහුණුලාභීන් කණ්ඩායම | සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | සේවාරම්භක පුහුණු එක් දින වැඩමුළුව | නවක රාජ්‍ය කළමනාකරණසහකාර නිලධාරීන් | 65 |
| 02 | ඵලදායීතාවය තුළින් සේවා විශිෂ්ඨතාවය පිළිබඳ වැඩමුළුව | රියදුරන් සඳහා | 133 |
| 03 | "ආකල්ප සංවර්ධනය තුළින් තෘප්තිමත් රාජ්‍ය සේවකයෙක්" පුහුණු වැඩමුළුව | ජනාධිපති මාධ්‍ය අංශයේ නිලධාරීන් | 90 |
| 04 | නවක කාර්යාල සේවක සේවකයින් දැනුවත් කිරීමේ වැඩමුළුව | නවක කාර්යාල සේවක සේවකයින් | 38 |
| 05 | ආකල්ප ඵලදායීතාවය තුළින් සේවා විශිෂ්ඨත්වය පිළිබඳ ජාතික වැඩමුළුව | අතිගරු ජනාධිපතිතුමාගේ සමීප ආරක්ෂක අංශයේ නිලධාරීන් | 125 |
| 06 | යහපාලනය හා නායකත්වය පිළිබඳ ජාතික වැඩමුළුව | අතිගරු ජනාධිපතිතුමාගේ සමීප ආරක්ෂක අංශයේ නිලධාරීන් | 140 |

# 08. ආයතන සම්බන්ධීකරණ අංශය

## හැඳින්වීම

ආයතන සම්බන්ධීකරණ ඒකකය මඟින් අතිගරු ජනාධිපතිතුමාගේ අධීක්ෂණය යටතේ පවතින ස්වාධීන කොමිෂන් සභා/ අමාත්‍යාංශ/ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා සහ ආයතනයන්හි ආයතනික හා පරිපාලන කටයුතු සම්බන්ධීකරණය කිරීම සිදු කරනු ලැබේ. එසේ සම්බන්ධීකරණය කරනු ලබන ආයතන සංඛ්‍යාව 21ක් වන අතර, කිසියම් ආයතනයකට ඇතුළත් නොවන විවිධ කටයුතුද මෙම අංශය මඟින් සිදු කරනු ලැබේ.

## පොදු අරමුණු/ කාර්යයන්

- අතිගරු ජනාධිපතිතුමාගේ අධීක්ෂණය යටතේ පවතින අමාත්‍යාංශයන්හි සම්බන්ධීකරණ කටයුතු නොපමාව සිදු කිරීම.
- 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ ස්ථාපිත කරන ලද ස්වාධීන කොමිෂන් සභා වෙත පහසුකම් සැපයීම හා සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.
- ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා, කමිටු සහ කාර්යසාධක බලකායන්හි ප්‍රතිපත්තිමය, ආයතන හා පරිපාලන කටයුතු සම්බන්ධයෙන් ලැබෙන ලිපි සඳහා කඩිනමින් පිළිතුරු සැපයීම.
- අතිගරු ජනාධිපතිතුමාගේ අධීක්ෂණය යටතේ පවතින අනෙකුත් ආයතනයන්හි ආයතනික, පරිපාලන හා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- අතිගරු ජනාධිපතිතුමා වෙනුවෙන් ගරු අග්‍රාමාත්‍යතුමා විසින් පිළිතුරු සැපයිය යුතු සියළුම පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා අදාළ අමාත්‍යාංශ, ආයතන හා අංශ සම්බන්ධීකරණය කොට පිළිතුරු සැපයීම.
- අතිගරු ජනාධිපතිතුමාගේ අධීක්ෂණය යටතේ පවතින අමාත්‍යාංශවල ( අතිගරු ජනාධිපතිතුමන් විසින් කරනු ලැබූ පත්කිරීම් හැර) හා අමාත්‍යාංශයන් යටතට නොගැනෙන ස්වාධීන ආයතනවල විදේශ නිවාඩු හා දිවයිනෙන් බැහැර යාමට අදාළ කටයුතු සඳහා අනුමැතිය ලබාදීමට කටයුතු කිරීම.
- සුවිශේෂ තැනැත්තන් සඳහා රාජ්‍ය තාන්ත්‍රික බලපත්‍ර නිකුත් කිරීම හා ද්විත්ව පුරවැසිභාවය ප්‍රදානයට අදාල කටයුතු.
- ඉදිරිපත්වන මහජන පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම
- වාර්ෂික විගණන කටයුතු ඉටු කිරීම.

## 2015 වර්ෂයේදී සාක්ෂාත් කර ගැනීම්

| ආයතනය | ඉටු කරන ලද කාර්යභාරය | එකතුව |
|---|---|---|
| **අතිගරු ජනාධිපතිතුමා අමාත්‍යධූරය හොබවනු ලබන අමාත්‍යාංශවල අවශ්‍ය අවස්ථාවලදී සම්බන්ධීකරණ කටයුතු කිරීම** | | |
| ආරක්ෂක අමාත්‍යාංශය | - | - |
| මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | විවිධ කටයුතු | 02 |
| ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය | ආයතන කටයුතු | 07 |
| **19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද ස්වාධීන කොමිෂන් සභා වල සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම** | | |
| මැතිවරණ කොමිෂන් සභාව | කටයුතු ආරම්භ කර නැත. | |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව | විදේශ නිවාඩු අනුමත කිරීම් | 07 |
| | විවිධ ඉල්ලීම් | 03 |
| ජාතික පොලිස් කොමිෂන් සභාව | සේවය දීර්ඝ කිරීම් | 08 |
| | වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම | 2013 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම |
| | විවිධ ඉල්ලීම් | 05 |
| | ලේකම්ගේ නිවාඩු අනුමත කිරීම | 08 |
| විගණන සේවා කොමිෂන් සභාව | කටයුතු ආරම්භ කර නැත. | |
| ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | ආයතන කටයුතු | 25 |
| | මහජන පැමිණිලි | 08 |
| | විදේශ නිවාඩු අනුමත කිරීම් | 19 |
| | ගොඩනැගිල්ලක් මිලදී ගැනීම | 10 |
| | බඳවා ගැනීම් පරිපාටිය අනුමත කිරීම | 11 |
| | කාර්ය මණ්ඩල පැමිණිලි | 04 |
| | වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම | 2012 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම |

| | | |
|---|---|---|
| අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | විදේශ නිවාඩු අනුමත කිරීම් | 06 |
| | ආයතන කටයුතු | |
| | අල්ලස් කොමිෂන් සභාවට ගොඩනැගිල්ලක් ලබා ගැනීම සම්බන්ධ කටයුතු | 04 |
| | විවිධ පෙත්සම් | 01 |
| | වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම | මෙතෙක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකරන ලද සියළුම වර්ෂයන්ට අදාල වාර්තා එවන මෙන් දන්වා යවා ඇත. |
| මුදල් කොමිෂන් සභාව | ආයතන කටයුතු | 10 |
| | කාර්යාල සංකීර්ණය ඉදිකිරීම | 05 |
| | විදේශ නිවාඩු අනුමත කිරීම් | 07 |
| සීමා නිර්ණය කොමිෂන් සභාව | කටයුතු ආරම්භ කර නැත. | |
| ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව | කටයුතු ආරම්භ කර නැත. | |
| **අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරනු ලැබ ඇති පරීක්ෂණ කොමිෂන් සභා, ජනාධිපති කාර්ය සාධක බලකායන් සහ ආයතනවල සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම** | | |
| අමාත්‍ය මණ්ඩල කාර්යාලය | විදේශ නිවාඩු අනුමත කිරීම් | 03 |
| | ආයතන කටයුතු | 16 |
| මැතිවරණ දෙපාර්තමේන්තුව | 2015 ජනාධිපතිවරණය සම්බන්ධ කටයුතු | 02 |
| | 2015 පාර්ලිමේන්තු මැතිවරණය සම්බන්ධ කටයුතු | 33 |
| | දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙත නිල නිවාස ලබා දීම | 02 |
| | විදේශ නිවාඩු අනුමත කිරීම් | 24 |
| | ආයතන කටයුතු | 21 |
| | මු.රෙ.71 යටතේ නව තනතුරු ඇති කිරීම | 03 |
| විගණකාධිපති දෙපාර්තමේන්තුව | විදේශ නිවාඩු අනුමත කිරීම් | 17 |
| | ආයතන කටයුතු | 43 |
| | විගණන අධිකාරි තනතුරු සඳහා බඳවා ගැනීම සඳහා වන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සම්බන්ධයෙන් කටයුතු කිරීම | 06 |

| | | |
|---|---|---|
| | විගණන පරීක්ෂක, අතිරේක විගණකාධිපති, සහකාර විගණකාධිපති තනතුරු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් කටයුතු කිරීම | 08 |
| | විශ්‍රාම ගැන්වීම් | 03 |
| | විවිධ ආයතනවලට අදාල විගණන විමසුම් | 06 |
| | විවිධ පෙත්සම් සම්බන්ධයෙන් කටයුතු කිරිම | 22 |
| අධිකරණ සේවා කොමිෂන් සභාව | ආයතන කටයුතු | 02 |
| | වාර්ෂික වාර්තා | 2013,2014 වර්ෂයන්ට අදාල වාර්ෂික වාර්තා එවන මෙන් දන්වා යවා ඇත. |
| ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව | ආයතන කටයුතු | 21 |
| | මාණ්ඩලික නිලධාරීන් සඳහා වූ කාර්යසාධන ඇගයීම | 3 |
| බරපතල වංචා, දූෂණ, රාජ්‍ය සම්පත් වරප්‍රසාද බලය සහ අධිකාරිය අනිසි ලෙස භාවිතා කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා වන ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව. | බිල්පත් පියවීම | 79 |
| | ආයතන කටයුතු | 44 |
| | විවිධ කටයුතු | 30 |
| අතුරුදහන් වූවන් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිෂන් සභාව | ආයතන කටයුතු | 23 |
| | සුළු මුදල් අග්‍රිමය | 38 |
| | බිල්පත් පියවීම | 49 |
| | වැටුප් ගෙවීම | 14 |
| | මහජන හමු පැවැත්වීම | 99 |
| රාජ්‍ය වත්කම් ආපසු ලබා ගැනීම පිළිබඳ විශේෂ ජනාධිපති කාර්ය සාධක බලකාය | ආයතන කටයුතු | 05 |
| ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව | විදේශ නිවාඩු | 48 |
| | වීසා ලබාදීම් හා අනුමත කිරීම් | 98 |
| | ආයතන කටයුතු | 20 |
| | විවිධ කටයුතු | 35 |
| ශ්‍රී ලංකා පදනම | විදේශ නිවාඩු අනුමත කිරීම් | 26 |
| | ආයතන කටයුතු | 15 |

| | | |
|---|---|---|
| | වාර්ෂික වාර්තා | 2012,2013,2014 වර්ෂයන්ට අදාල වාර්ෂික වාර්තා එවන ලෙස දන්වා ලිපි යවා ඇත. |
| | ශ්‍රී ලංකා පදනමට අයත්ව තිබූ ශ්‍රී ලංකා රූපවාහිනී අභ්‍යාස ආයතනය සම්බන්ධ ලිපි කටයුතු | 01 |
| | සහනදායී පදනම මත වාහන ආනයනය | 01 |
| පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය | ආයතන කටයුතු | 09 |
| | කාර්යාලය ස්ථාපිත කිරීම සඳහා ගොඩනැගිල්ලක් ලබා දීම සම්බන්ධ ඉල්ලීම | 01 |
| | වාර්ෂික වාර්තා | 2012,2013හා 2014වර්ෂයන්ට අදාල වාර්ෂික වාර්තා කැඳවීම සඳහා ලිපි යොමු කර ඇත. |
| එස්.ඩබ්ලිව්.ආර්.ඩී.බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම, | ආයතන කටයුතු | 21 |
| | විවිධ ඉල්ලීම් | 2 |
| පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය | ආයතන කටයුතු | 26 |
| | ක්‍රියාත්මක නොවූ නිර්දේශ | 15 |
| ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය | ආයතන කටයුතු | 37 |
| නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ රඟහල | නඩත්තු කටයුතු | 87 |
| | විදුලි බිල් නිරවුල් කිරීම | 31 |
| | වතුර බිල් නිරවුල් කිරීම | 30 |
| | දුරකථන හා අන්තර්ජාල නිරවුල් කිරීම | 15 |
| | පුවත්පත් බිල් නිරවුල් කිරීම | 12 |
| | මධ්‍යස්ථානය වෙන් කර ගැනීම | 25 |
| | පවිත්‍රතා කටයුතු සම්බන්ධ ලිපි | 12 |
| | ප්‍රසම්පාදන කමිටු පත් කිරීම | 19 |
| | සුළු මුදල් අග්‍රිමය | 12 |
| | විවිධ කටයුතු | 80 |

| | | |
|---|---|---|
| | කාර්ය මණ්ඩලය | 12 |
| | ගොඩනැගිලි කටයුතු | 14 |
| **අතිගරු ජනාධිපතිතුමා විසින් අධීක්ෂණය කරනු ලබන වෙනත් ආයතනවල සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම** | | |
| උපාය මාර්ගික ව්‍යවසාය කළමනාකරණ ආයතනය | ආයතන කටයුතු | |
| | විවිධ කටයුතු | |
| **විවිධ කටයුතු** | | |
| පාර්ලිමේන්තු ප්‍රශ්නවලට පිළිතුරු අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම. | | 07 |
| පළාත් ප්‍රධාන අමාත්‍යවරුන්ගේ විදේශ නිවාඩු අනුමැතිය ලබාදීමට කටයුතු කිරීම | විදේශ නිවාඩු අනුමත කිරීම් | 20 |
| | පළාත් සභා වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්න | 4 |
| | දිවයිනෙන් බැහැරවීම් සම්බන්ධ විමසීම් | 6 |
| රාජ්‍ය තාන්ත්‍රික බලපත්‍ර ලබාදීම | | 02 |
| ශ්‍රී ලංකා පාර්ලිමේන්තු නිලධාරීන්ගේ විදේශ නිවාඩු | | 02 |

# 09. ප්‍රතිපත්ති සම්බන්ධීකරණ හා ප්‍රගති සමාලෝචන අංශය

## *හැඳින්වීම*

අතිගරු ජනාධිපතිතුමාගේ නියෝග සහ ජනාධිපති ලේකම්ගේ උපදෙස් මත ජනාධිපති අතිරේක ලේකම් එම්. කිංස්ලි ප්‍රනාන්දු මහතාගේ ඍජු අධීක්ෂණය යටතේ ප්‍රතිපත්ති, සම්බන්ධීකරණ හා ප්‍රගති සමාලෝචන අංශය ක්‍රියාත්මක වේ.

## *පොදු අරමුණු/කාර්යයන්*

- ප්‍රතිපත්ති සම්පාදනය පහසුකරණය හා සම්බන්ධීකරණය කිරීම
- දිස්ත්‍රික් සංවර්ධන කටයුතු "මෛත්‍රී පාලනයක් - ස්ථාවර රටක්" ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව සිදුවන්නේදැයි තහවුරු කිරීම.
- "දියුණු හා වගකීම් සහගත රාජ්‍ය අංශයක්" "මෛත්‍රී පාලනයක් - ස්ථාවර රටක් "ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව අන්තර් අමාත්‍යාංශ හා සම්බන්ධීකරණය
- සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් අධීක්ෂණය සහ ප්‍රගති සමාලෝචන කටයුතු
- සමාජ, ආර්ථික හා සංස්කෘතික ගැටලු සහ සමාජ අවශ්‍යතා පිළිබඳ අධ්‍යයනයන් කිරීම
- ප්‍රතිපත්ති සම්පාදනය සඳහා අවශ්‍ය දත්ත හා තොරතුරු එක්රැස් කිරීම, විශ්ලේෂණය කිරීම හා අවශ්‍යතාවය පරිදි වාර්තා සැපයීම
- පෝෂණ වැඩසටහන සම්බන්ධ සියලු පාර්ශවකරුවන් අතර සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීමට සහාය වීම, මෙහි ප්‍රධාන අරමුණ වනුයේ වයස අවුරුදු 5 ට අඩු දරුවන් අතර මිටි බව සහ බර අඩුතාවය 40%කින් අවම කිරීම සහ කෘෂවීම 5%කට අඩු සංඛ්‍යාවක් දක්වා අවම කිරීම මෙන්ම අධිබර දරුවන්ගේ ප්‍රතිශතය තවදුරටත් වර්ධනය නොවීම සඳහා කටයුතු කිරීම, අඩු බර දරු උපත් හා කාන්තාවන් අතර අඩු බර හා අධි බර පවතින මට්ටම්වලින් 30% දක්වා අඩුකර ගැනීම ,නිරක්තය පවතින මට්ටමෙන් 50% කින් අඩු කිරීම.

## *2015 වර්ෂයේ සාක්ෂාත් කර ගැනීම්*

**2015 වර්ෂයේදී ඉහත අරමුණු ඉටු කරගැනීම සඳහා මෙම අංශය මඟින් සංවිධානය කරන ලද රැස්වීම් සහ වැඩසටහන් ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.**

| කාරණය | රැස්වීම්/ක්‍රියාකාරකම් |
|---|---|
| අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් | 15 |
| ජනාධිපති ලේකම්ගේ ප්‍රධානත්වයෙන් | 12 |
| ජනාධිපති අතිරේක ලේකම්ගේ ප්‍රධානත්වයෙන් | 24 |
| වෙනත් | 09 |
| එකතුව | 60 |

**මෙහිදී,**

### *1. සංවර්ධන ව්‍යාපෘති ප්‍රගති සමාලෝචනය*

**මේ යටතේ සියලුම අමාත්‍යාංශවල 2015 වර්ෂයේ මුල් කාර්තු 02 හි දේශීය හා විදේශීය අරමුදල් යොදවා ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති 714 ක ප්‍රගති සමාලෝචනය අදාළ නිලධාරීන් ගෙන්වා සිදුකරන ලදී.**

### *2. විශේෂ දිස්ත්‍රික් සම්බන්ධීකරණ රැස්වීම*

**ජාතික සංවර්ධන සැලසුම්වලට අනුකූලව දිස්ත්‍රික් මට්ටමේදී රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන ආයතන මඟින් ක්‍රියාත්මක කරනු ලබන සියලුම සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පසුවිපරම් කිරීමේ අරමුණින් පොළොන්නරුව, අනුරාධපුරය හා මහනුවර යන දිස්ත්‍රික්කවල අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් විශේෂ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පවත්වන ලදී. එම කමිටු රැස්වීම්වල පසුවිපරම් කටයුතු අඛණ්ඩව සිදුවෙමින් පවතී. එසේම මහනුවර නගර සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා විසින් විශේෂයෙන් සොයා බැලීමට දන්වනු ලැබූ හෙයින් ඒ සම්බන්ධයෙන් මූලික පසුවිපරම් රැස්වීම් 3 ක් පවත්වන ලද අතර, එමඟින් ගැටළු රාශියක් නිරාකරණය කරන ලදී.**

### 3. *අමාත්‍යාංශ ප්‍රතිපත්ති සම්බන්ධීකරණය*

අමාත්‍යාංශවල පවතින ගැටළුකාරී ප්‍රශ්න නිරාකරණය කරදීමට හා සමහර වෘත්තීය සමිතිවල ගැටළු නිරාකරණය කර දීමට මැදිහත්වී අදාළ පාර්ශවයන් ගෙන්වා සාකච්ඡා පැවැත්වීම සිදු කරන ලදී. මේ යටතේ අමාත්‍යාංශවල සාමාන්‍ය පරිපාලනයේදී මතුවන ගැටළු සහ ජාතික මට්ටමේ මැදිහත්වීම් වලදී පැවරෙන වගකීම පිළිබඳව සාකච්ඡා හා පසුවිපරමද, වෘත්තීය සමිතිවල දුක්ගැනවිලි සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමාගේ මැදිහත්වීම අවශ්‍ය අවස්ථාවන්හිදී ඉටු කරන ලද රාජකාරීද ඇතුළත් වේ. මේ සම්බන්ධ සෘජු මැදිහත්වීම් අවස්ථා 36 කි.

### 4. *මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන*

ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ මාසය 2015.07.08 දින සිට 2015.08.09 දින දක්වා ප්‍රකාශයට පත්කරන ලද අතර, මෙම අංශයේ උපදෙස් මත දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 ක සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වැඩසටහන් 3776 ක් සංවිධානය කරන ලද අතර එමඟින් පුද්ගලයින් 418984 දෙනෙකු දැනුවත් කිරීම මෙම අංශයේ අධීක්ෂණය මත සිදු කරන ලදී. මීට අමතරව සියලුම අමාත්‍යාංශ, පළාත් සභා සහ පොලිස් දෙපාර්තමේන්තුව මඟින් වැඩසටහන් 6049 ක් යටතේ පුද්ගලයින් 705447 ක් දැනුවත් කිරීම මෙම අංශයේ උපදෙස් මත සිදු කරන ලදී.

### 5. *පෝෂණ වැඩසටහන*

#### *2015 වර්ෂයේදී ඉටු කරන ලද ක්‍රියාකාරකම්*

- පෝෂණය සඳහා වන බහු ආංශික ක්‍රියාකාරී සැලැස්ම යටතේ එතෙක් ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් සමාලෝචනය
- සියලුම අමාත්‍යාංශ ලේකම්, පළාත් ප්‍රධාන ලේකම්, දිස්ත්‍රික් ලේකම් හා පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂකවරුන්ගේ සහභාගීත්වයෙන් ජාතික පෝෂණ මෙහෙයුම් කමිටුව ජනාධිපති ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීම,
- ජාතික, පළාත් දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය මට්ටමින් පෝෂණය සඳහා වන මෙහෙයුම් කමිටු ස්ථාපිත කිරීම
- ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් පෝෂණ ප්‍රවර්ධන කමිටු ස්ථාපිත කිරීම

<u>අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීම්</u>

| | | |
|---|---|---|
| මැයි 08 | - | මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික මෙහෙයුම් කමිටුව<br>ජනාධිපතිතුමාගේ ශ්‍රවණාගාරය |
| මැයි 11 | - | ජාතික ව්‍යවසන කළමනාකරණ සභාව<br>ජනාධිපතිතුමාගේ ශ්‍රවණාගාරය |
| මැයි 14 | - | ජාතික වකුගඩු නිවාරණ අධීක්ෂණ කමිටුව<br>ජනාධිපතිතුමාගේ ශ්‍රවණාගාරය |
| මැයි 22 | - | කොළඹ හා තදාසන්න නගරවල යටිතල පහසුකම් සංවර්ධනය<br>ජනාධිපතිතුමාගේ ශ්‍රවණාගාරය |
| ජුනි 23 | - | විශේෂ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම<br>- පොළොන්නරුව<br>දිස්ත්‍රික්කය - ජනාධිපතිතුමාගේ සම්මන්ත්‍රණ ශාලාව |
| ජුනි 25 | - | දේශීය ආදායම් මාණ්ඩලික නිලධාරීන්ගේ සාකච්ඡාව<br>ජනාධිපතිතුමාගේ ශ්‍රවණාගාරය |
| ජූලි 02 | - | පරිසර හානි සම්බන්ධයෙන් පරිසරවේදීන් සමඟ සාකච්ඡාව<br>ජනාධිපතිතුමාගේ ශ්‍රවණාගාරය |
| ජූලි 02 | - | පරිසර හානි සම්බන්ධයෙන් පරිසරවේදීන් සමඟ සාකච්ඡාව<br>ජනාධිපතිතුමාගේ ශ්‍රවණාගාරය |
| ජූලි 09 | - | මත්ද්‍රව්‍ය නිවාරණ මාසය ප්‍රකාශයට පත් කිරීමේ ජාතික<br>උත්සවය, ජා-ඇළ නගර සභා ක්‍රීඩාංගනය |
| ජූලි 10 | - | සත්ත්ව හිංසනය වැළැක්වීම පිළිබඳ සාකච්ඡාව<br>ජනාධිපතිතුමාගේ ශ්‍රවණාගාරය |
| අගෝස්තු 31 | - | මත්ද්‍රව්‍ය වැටලීම් හා පාලන කටයුතු සම්බන්ධ විශේෂ<br>සාකච්ඡාව<br>ජනාධිපතිතුමාගේ ශ්‍රවණාගාරය |
| ඔක්තෝබර් 15 | - | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම අනුරාධපුර<br>උතුරුමැද පළාත් සභා ශ්‍රවනාගාරය<br>දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම මහනුවර - මහනුවර<br>ජනාධිපති මන්දිරය |
| ඔක්තෝබර් 16 | - | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම - පොළොන්නරුව |
| ඔක්තෝබර් 30 | - | කැබිනට් රැස්වීම |
| දෙසැම්බර් 22 | - | 2015 නත්තල් වැඩසටහන - ජනාධිපති මන්දිරය |

## ජනාධිපති ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීම්

| | | |
|---|---|---|
| අප්‍රේල් 30 | - | රාජ්‍ය පොසොන් උත්සවය සංවිධාන ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම - භෝජනාගාරය |
| මැයි 12 | - | වකුගඩු රෝග නිවාරණ ලේකම්වරුන්ගේ අනුකමිටු රැස්වීම ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය |
| ජුනි 03 | - | වකුගඩු රෝග නිවාරණය සම්බන්ධයෙන් දායකත්වය දක්වනු ලබන පෞද්ගලික අංශයේ ව්‍යාපාරික සාකච්ඡාව ලේකම්තුමාගේ කාර්යාලය |
| ජුනි 17 | - | මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික වැඩසටහන සම්බන්ධයෙන් පැවති සාකච්ඡාව - භෝජනාගාරය |
| ජූලි 10 | - | වකුගඩු නිවාරණය සම්බන්ධයෙන් පැවති සාකච්ඡාව ලේකම්තුමාගේ කාර්යාලය |
| ජූලි 23 | - | චීන ආධාර යටතේ ලබා දුන් විදුලි ජනක යන්ත්‍ර බෙදාදීම සම්බන්ධයෙන් පැවති සාකච්ඡාව - ලේකම්තුමාගේ කාර්යාලය |
| නොවැම්බර් 26 | - | පානම ප්‍රදේශයේ ඉඩම් සම්බන්ධ රැස්වීම ලේකම්තුමාගේ නිල කාර්යාලය |
| නොවැම්බර් 27 | - | පෝෂණය සඳහා වූ ජාතික කමිටු රැස්වීම සිනමන් ග්‍රෑන්ඩ් හෝටලය |
| නොවැම්බර් 30 | - | මහනුවර දිස්ත්‍රික් කමිටු රැස්වීම - ප්‍රධාන භෝජනාගාර ශාලාව |
| දෙසැම්බර් 14 | - | අධිකරණ වෛද්‍ය සේවා ප්‍රවර්ධනය කිරීම සම්බන්ධ රැස්වීම ලේකම්තුමාගේ නිල කාර්යාලය |

## ජනාධිපති අතිරේක ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීම්

| | | |
|---|---|---|
| මැයි 06 | - | පෝෂණය සඳහා වූ බහු ආංශික ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධයෙන් සංවර්ධන පාර්ශ්ව කරුවන් සමඟ සාකච්ඡාව ස්ටෑන්ඩර්ඩ් චාටර්ඩ් ගොඩනැගිල්ල |
| මැයි 07 | - | වකුගඩු රෝග නිවාරණ තාක්ෂණික අනු කමිටු රැස්වීම |
| මැයි 08 | - | පෝෂණය සඳහා වූ බහු ආංශික ක්‍රියාකාරී සැලැස්ම අමාත්‍යාංශ සම්බන්ධීකාරකවරුන්ගේ සාකච්ඡාව ස්ටෑන්ඩර්ඩ් චාටර්ඩ් ගොඩනැගිල්ල |
| මැයි 14 | - | රාජ්‍ය පොසොන් උත්සවය සංවිධාන ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම - භෝජනාගාරය |
| මැයි 26 | - | විදේශ ණය / ආධාර ව්‍යාපෘති පූර්ව ප්‍රගති සමාලෝචන සාකච්ඡාව භෝජනාගාරය |
| මැයි 27 | - | සංවර්ධන ව්‍යාපෘති පූර්ව ප්‍රගති සමාලෝචන සාකච්ඡාව ස්ටෑන්ඩර්ඩ් චාටර්ඩ් ගොඩනැගිල්ල |

මැයි 28 - සංවර්ධන ව්‍යාපෘති පූර්ව ප්‍රගති සමාලෝචන සාකච්ඡාව
ස්ටැන්ඩර්ඩ් චාටර්ඩ් ගොඩනැගිල්ල

මැයි 29 - විදේශ ණය ආධාර ව්‍යාපෘති පූර්ව ප්‍රගති සමාලෝචන
සාකච්ඡාව
භෝජනාගාරය

ජුනි 01 - සංවර්ධන ව්‍යාපෘති පූර්ව ප්‍රගති සමාලෝචන සාකච්ඡාව
ස්ටැන්ඩර්ඩ් චාටර්ඩ් ගොඩනැගිල්ල

ජුනි 03 - සංවර්ධන ව්‍යාපෘති පූර්ව ප්‍රගති සමාලෝචන සාකච්ඡාව
ස්ටැන්ඩර්ඩ් චාටර්ඩ් ගොඩනැගිල්ල

ජුනි 05 - ජාතික පශු සම්පත් මණ්ඩලයට අයත් ඉඩම් පිළිබඳ සාකච්ඡාව
භෝජනාගාරය

ජුනි 10 - තක්සේරුකරුවන්ගේ වැටුප් විෂමතාවය සම්බන්ධ සාකච්ඡාව
ස්ටැන්ඩර්ඩ් චාටර්ඩ් ගොඩනැගිල්ල

ජුනි 12 - සංවර්ධන ව්‍යාපෘති /විදේශ ණය ආධාර ව්‍යාපෘති ඇගයීම්
සාකච්ඡාව
ජාතික අයවැය දෙපාර්තමේන්තුව ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව ස්ටැන්ඩර්ඩ් චාටර්ඩ් ගොඩනැගිල්ල

ජුනි 25 - ළදරු හා ළමා වර්ධනය පිළිබඳ අධ්‍යනය සම්බන්ධ සාකච්ඡාව
ස්ටැන්ඩර්ඩ් චාටර්ඩ් ගොඩනැගිල්ල

අගෝස්තු 03 - කොළඹ පිටත වටරවුම් මාර්ගයේ කඩුවෙල, කඩවත අතර කොටස විවෘත කිරීමේ උත්සව සංවිධාන කටයුතු සම්බන්ධ රැස්වීම - ප්‍රධාන භෝජනාගාරය

අගෝස්තු 05 - පෝෂණය සම්බන්ධ බහු ආංශික සැලැස්ම ක්‍රියාත්මක කිරිමේ
රැස්වීම - ස්ටැන්ඩර්ඩ් චාටර්ඩ් ගොඩනැගිල්ල

අගෝස්තු 05 - තක්සේරුකරුවන්ගේ වැටුප් විෂමතා සම්බන්ධ රැස්වීම
ස්ටැන්ඩර්ඩ් චාටර්ඩ් ගොඩනැගිල්ල

අගෝස්තු 10 - ශ්‍රී ලංකා දේශීය පාවහන් නිපදවන්නන් සහ සම් භාණ්ඩ
කර්මාන්තකරුවන් සමඟ පැවති රැස්වීම
ස්ටැන්ඩර්ඩ් චාටර්ඩ් ගොඩනැගිල්ල

අගෝස්තු 13 - පෝෂණය සම්බන්ධ බහු ආංශික සැලැස්ම ක්‍රියාත්මක කිරිමේ
රැස්වීම - ප්‍රධාන භෝජනාගාරය

අගෝස්තු 13 - බුද්ධිමය දේපළ කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල් ප්‍රධානීන් පත්
කිරීමට අදාල රැස්වීම - ලේකම්තුමාගේ කාර්යාලය

ඔක්තෝබර් 02 - විමර්ශන කටයුතු සඳහා අවශ්‍ය සහය ලබා ගැනීමේ රැස්වීම
ලේකම්තුමාගේ නිල කාර්යාලය

නොවැම්බර් 23 - පෝෂණය සම්බන්ධ සාකච්ඡාව - ස්ටැන්ඩර්ඩ් චාටර්ඩ් ගොඩනැගිල්ල
දෙසැම්බර් 08 - කතෝලික දේවස්ථාන හා වෙනත් ගැටළු සම්බන්ධ රැස්වීම ප්‍රධාන භෝජනාගාර ශාලාව
දෙසැම්බර් 14 - පෝෂණය සම්බන්ධ අමාත්‍යාංශ සම්බන්ධීකාරකවරුන්ගේ රැස්වීම - ප්‍රධාන භෝජනාගාර ශාලාව
දෙසැම්බර් 15 - වර්ල්ඩ් විෂන් ආයතනය සමඟ නියාමන කමිටු රැස්වීම ස්ටැන්ඩර්ඩ් චාටර්ඩ් ගොඩනැගිල්ල

<u>ජනාධිපති ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීම්</u>

ඔක්තෝබර් 26 - ආරක්ෂක මූලස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම සම්බන්ධ රැස්වීම විදේශ රැකියා අමාත්‍යාංශය
නොවැම්බර් 16 - ආයතනවල කළමනාකාරීත්වය විධිමත් කිරීම සම්බන්ධ රැස්වීම
විදුලි සන්දේශ නියාමන කොමිෂන් සභාව
නොවැම්බර් 17 - ආරක්ෂක මූලස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම සම්බන්ධ රැස්වීම
විදේශ රැකියා අමාත්‍යාංශය
දෙසැම්බර් 02 - ආරක්ෂක මූලස්ථාන ගොඩනැගිල්ල සම්බන්ධ රැස්වීම ස්ටැන්ඩර්ඩ් චාටර්ඩ් ගොඩනැගිල්ල

<u>වෙනත් රැස්වීම්</u>

අගෝස්තු 03 - වකුගඩු රෝග නිවාරණය සම්බන්ධයෙන් පැවති සාකච්ඡාව ස්ටැන්ඩර්ඩ් චාටර්ඩ් ගොඩනැගිල්ල
අගෝස්තු 11 - ජාතික මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධයෙන් පැවති සාකච්ඡාව සෙමා ගොඩනැගිල්ල
අගෝස්තු 13 - YMCA ගොඩනැගිල්ල සම්බන්ධ සාකච්ඡාව ස්ටැන්ඩර්ඩ් චාටර්ඩ් ගොඩනැගිල්ල
අගෝස්තු 13 - ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ නිලධාරීන් සමඟ වීන ආධාර යටතේ ලබා දුන් විදුලි ජනක යන්ත්‍ර බෙදා දීම සම්බන්ධ රැස්වීම
අගොස්තු 27 - වකුගඩු රෝග නිවාරණ අංශය සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කිරීම සම්බන්ධ රැස්වීම

# 10. මූල්‍ය කළමනාකරණ අංශය

## හැඳින්වීම

ජනාධිපති කාර්යාලයට අදාළ සියලුම මූල්‍ය කළමනාකරණ කටයුතු ඉටු කිරීම.




## පොදු අරමුණු/කාර්යයන්

- ස්ථිර, තාවකාලික, අනියම්, කොන්ත්‍රාත් හා අනුයුක්ත නිලධාරීන්ගේ මාසික වැටුප්, දීමනා හා පාරිශ්‍රමික ගෙවීම
- නිලධාරීන්ගේ අතිකාල දීමනා හා ගමන් වියදම් දීමනා ගෙවීම
- ජනාධිපති කාර්යාලය වෙනුවෙන් වූ සේවා සහ සැපයීම්වලට අදාළ ගෙවීම් කිරීම
- මාසික ගිණුම් සාරාංශ හා බැංකු සැසඳුම් පිළියෙල කිරීම හා මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම
- වාර්ෂික විසර්ජන ගිණුම පිළියෙල කිරීම හා මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම
- වාර්ෂික අයවැය පිළියෙල කිරීම හා මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම
- අයවැය කාරක සභා අවස්ථාවට අදාළ කටයුතු
- කාර්යාලයීය ගිණුම් භාණ්ඩාගාර ගිණුම් සමඟ සැසඳීම
- වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත ප්‍රතිපාදන නිදහස් කිරීම
- නිල විදේශ සංචාරයන් හා නිලධාරීන්ගේ පුහුණු සඳහා වන විදේශ සංචාරයන්ට අදාල කටයුතු


## 2015 වර්ෂය සඳහා වන මුළු ප්‍රතිපාදන ප්‍රමාණය සහ මුළු වියදම

| විස්තරය | පුනරාවර්තන | මූලධන (රු.මි.) |
|---|---|---|
| මුළු ප්‍රතිපාදනය | 2,194 | 1,334 |
| මුළු වියදම | 2,116 | 1,191 |
| % | 96.4 | 89.3 |



## 2014 හා 2015 වර්ෂවල මුළු වියදම සැසඳීම

| වර්ෂය | පුනරාවර්තන | මූලධන (රු.මි.) |
|---|---|---|
| 2014 | 4,693 | 5,183 |
| 2015 | 2,116 | 1,191 |



# 11. අභ්‍යන්තර විගණන අංශය




## *හැඳින්වීම*

**ජනාධිපති කාර්යාලය හා ඒ යටතේ ඇති
සියලුම ආයතනවල අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සහ
ජනාධිපති ලේකම්වරයා විසින් පවරනු ලබන
විශේෂ අභ්‍යන්තර විගණන විමර්ශන කටයුතු සිදු කිරීම සඳහා
ජනාධිපති ලේකම්වරයා යටතේ
පිහිටුවා ඇති අංශයකි.**

## *පොදු අරමුණු/ කාර්යයන්*

- ජනාධිපති කාර්යාලයේ සහ ජනාධිපති කාර්යාලය යටතේ ඇති සියලුම ආයතනවල මුදල් කටයුතු පිළිබඳව පවත්වන අභ්‍යන්තර පාලන ක්‍රමයට සහභාගී වීම. එම කටයුතුවල වැරදි හා වංචා වැළැක්වීමට සහ අනාවරණය කර ගැනීමට භාවිතා කරනු ලබන අභ්‍යන්තර සෝදිසියෙහි විධිමත්බව හා ප්‍රමාණවත්බව පිළිබඳව අඛණ්ඩ සමීක්ෂණයක් හා ස්වාධීන ඇගයීමක් පවත්වාගෙන යාම.

- වැඩ, යෝජනා ක්‍රම හා ව්‍යාපෘති යන මේවායේ ප්‍රගතිය සොයා බැලීම සම්බන්ධයෙන් ජනාධිපති ලේකම්වරයාට සහාය වීම .

## *2015 වර්ෂයේ සාක්ෂාත් කරගැනීම්*

| *අනු අංකය* | *සැලසුම* | *තත්ත්වය* | *ඵලදායීතා ප්‍රතිශතය* |
|---|---|---|---|
| **01** | ජනාධිපති කාර්යාලයේ ප්‍රවාහන අංශයේ මූල්‍ය පාලනය හා පරිපාලන කටයුතු | සමාප්ත | 100% |
| **02** | ජනාධිපති කාර්යාලයේ ප්‍රසම්පාදන අංශයේ 2014 වර්ෂයට අදාල මිලදී ගැනිම් | සමාප්ත | 100% |
| **03** | ජනාධිපති කාර්යාලයේ ගබඩා කළමනාකරණය සහ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය | සමාප්ත | 100% |
| **04** | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය | සමාප්ත | 100% |
| **05** | 2015 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ගෙවීම් වවුචර්පත් පරීක්ෂා කිරීම | ජනවාරි සිට සැප්තැම්බර් දක්වා | 66.6% |
| **06** | ඩොංගල් මගින් අන්තර්ජාල පහසුකම් ලබාදීම හා චන්ද්‍රිකා රූපවාහිනී සම්බන්ධතා ලබාගැනීම | සමාප්ත | 100% |
| **07** | ජනාධිපති අරමුදල | සමාප්ත | 100% |
| **08** | ජනාධිපති අරමුදල ස්වයංකරණය පිළිබඳව සකස්කරමින් පවත්නා මෘදුකාංගය | සමාප්ත | 100% |
| **09** | සරප්ගේ මුදල් හා මුදල් පොත පරීක්ෂාව | සමාප්ත | 100% |
| **10** | ජේ.ආර්.ජයවර්ධන ඓතිහාසික පර්යේෂණ, ලේඛනාගාරය හා පුස්තකාල මධ්‍යස්ථානය | සමාප්ත | 100% |
| **11** | උපායමාර්ගික ව්‍යවසාය කළමනාකරණ ආයතනය | සමාප්ත | 100% |
| **12** | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම (පැවැත්වීමට යෝජිත) රැස්වීම් - 04 | සමාප්ත | 50% |

# 12 . ජනාධිපති අරමුදල

*මෙහෙවර*
*ජීවිත තර්ජන ඇති රෝගවලට ප්‍රතිකාර කිරීමටත්, ආගම් පෝෂණය කිරීමටත්, අධ්‍යාපනික ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමත්, ජාතිය හා ජනතා සුභසිද්ධිය වෙනුවෙන් කැපී පෙනෙන සේවාවන් කරන ලද තැනැත්තන් ඇගැයීම සඳහාත් කාර්යක්ෂම හා ඵලදායක මූල්‍ය දිරිදීමනා සහ ආධාර සැපයීම*

## *හැඳින්වීම*

අතිගරු ජනාධිපතිතුමා ඇතුළු පාලක මණ්ඩලයේ ප්‍රතිපත්තිමය තීරණ මත ජනාධිපති ලේකම් ඇතුළු ජනාධිපති අරමුදලේ කාර්ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට ජීවිත තර්ජිත රෝගාබාධයන් සඳහා වෛද්‍යාධාර ලබාදීම, සුදුසුකම් සපුරා ඇති අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට අ.පො.ස. (උසස් පෙළ) හැදෑරීම සඳහා මූල්‍යාධාර ලබාදීම හා වෙනත් ව්‍යාපෘති සඳහා ද මූල්‍යාධාර පිරිනැමේ. එමෙන්ම සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් ලැබෙන වාර්ෂික ආදායමෙන් 50% ක මුදලක් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත ලබාදීමද ජනාධිපති අරමුදලේ කාර්යභාරයකි.

## *පොදු අරමුණු/ කාර්යයන්*


1. දරිද්‍රතාවයට සහන සැලසීම
2. අධ්‍යාපනය හෝ ඥාණය වර්ධනය කිරීම
3. ආගම නංවාලීම
4. ජාතිය වෙනුවෙන් සේවයක් කර ඇති තැනැත්තන්ට ප්‍රදානයන් කිරීම
5. ජනාධිපතිවරයාගේ හා පාලක මණ්ඩලයේ මතය අනුව මහජනතාවගේ සුභ සිද්ධිය උදෙසා කාර්යයන් ඉටු කිරීම

## 2015 වර්ෂයේ සාක්ෂාත් කරගැනීම්

**2015 වර්ෂයේදී ජනාධිපති අරමුදල වෙත සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන්, ස්ථාවර තැන්පතු පොලී මුදල් හා වෙනත් ආදායම් වශයෙන් රුපියල් මිලියන 1906.85 ක් ලැබී ඇත.**

### Sources of Income - 2015

| Income | Amount (Rs. M) |
|---|---|
| Proceeds from Development Lotteries Board | 1750.91 |
| Interest Income | 155.72 |
| Miscellaneous Income | 0.22 |
| **Total** | 1906.85 |





1

**2015 වර්ෂයේදී ජනාධිපති අරමුදල වෙත ලැබුණු ආදායම වෛද්‍යාධාර සඳහා, මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදල සඳහා, අධ්‍යාපන හා ශිෂ්‍යත්ව සඳහා, වෙනත් විශේෂ ව්‍යාපෘති සඳහා, සුභසාධන කටයුතු සඳහා, ආගමික කටයුතු සඳහා, සංස්කෘතික කටයුතු සඳහා, ක්‍රීඩා හා කලා කටයුතු සඳහා පහත ආකාරයට රුපියල් මිලියන 1826.93 ක් වියදම් කර ඇත.**

## Categories of Expenditure – 2015

| Categiries | Amount (Rs. M) |
|---|---|
| Medical Treatment | 900.56 |
| Mahapola Higher Education Trust Fund. | 800.00 |
| Scholarship Scheme & Education | 89.81 |
| Other Special Projects | 20.00 |
| Welfare Activities | 8.56 |
| Religious Activities | 3.65 |
| Cultural Activities | 2.75 |
| Sports and Arts | 1.60 |




3

ජනාධිපති අරමුදලේ ආයෝජන ලෙස රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතු ලෙස රුපියල් මිලියන 1,735 ක් ආයෝජනය කර ඇති අතර, භාණ්ඩාගාර බැඳුම්කර ලෙස රුපියල් මිලියන 338 ක් ආයෝජනය කර ඇත.

# 13. සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය

*හැඳින්වීම*

අතිගරු ජනාධිපතිතුමන්ගේ “මෛත්‍රී පාලනයක් - ස්ථාවර රටක්” ප්‍රතිපත්ති ප්‍රකාශනයේ “යහපත් ආර්ථික ශක්තියකින් හෙබි යහගුණයෙන් සපිරි සදාචාර සම්පන්න සමාජයක් හා යහපාලනයට පරමාදර්ශයක් වන රටක්” නිර්මාණය කර ගැනීම පිළිබඳව සංකල්ප ගණනාවක් අන්තර්ගතය. එම සංකල්ප ක්‍රියාවට නංවමින් ශ්‍රී ලංකාව වර්තමානයේ මුහුණදී සිටින සංවේදී ගැටළුවලට පිළියම් යොදනු පිණිස අතිගරු ජනාධිපතිතුමාගේ සුවිශේෂී අවධානය මත විශේෂ ජාතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා 2015 වසරේ මැද භාගයේදී සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය පිහිටුවන ලදී.

මෙම අංශය යටතේ පහත සඳහන් ප්‍රධාන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී.

I. ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන
II. පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන
III. මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික වැඩසටහන
IV. වකුගඩු රෝග නිවාරණ ජාතික වැඩසටහන

ඉහත සඳහන් විෂයයන් ක්‍රියාවට නංවන අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධ වෙමින් ජනාධිපති කාර්යාලයේ සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය යටතේ කාර්යය සාධන බලකායන් හතරක් පිහිටුවා මෙම වැඩසටහන් මෙහෙයවීම ආම්භ කරන ලදී.

එම බලකායන් මඟින් සිදු කරනු ලබන ප්‍රධාන කාර්යයන්:

- එක් එක් ජාතික වැඩසටහන් පිළිබඳව නිශ්චිත කාල වකවානුවක් සහිතව ජාතික වැඩසටහන් සැලසුම් කිරීම
- අන්තර් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන අතර මනා සම්බන්ධීකරණය
- නීතිමය හා ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධව මැදිහත් වීම
- නිලධාරීන්ගේ හා රටේ සමස්ත ප්‍රජාවගේ ආකල්පමය පරිවර්තනයක් ඇති කිරීම
- සියලුදෙනාම ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කිරීම
- නිරන්තර පසු විපරම
- අධීක්ෂණය හා ප්‍රගති සමාලෝචනය

## *ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන 2016 – 2018*

### *පසුබිම*

ශ්‍රී ලංකාව ප්‍රධාන ආහාර වර්ග ආනයනය සඳහා වාර්ෂිකව රුපියල් බිලියන 200 ක් පමණ වැය කරයි. එහෙත් ආනයනය කරනු ලබන එම ආහාර වලින් වැඩි ප්‍රමාණයක් දේශීයව වස විසෙන් තොරව, ගුණාත්මකව නිෂ්පාදනය කරගැනීමේ හැකියාව ඇති අතර, සත්ත්ව නිෂ්පාදන මෙන්ම මත්ස්‍ය නිෂ්පාදනද තවදුරටත් වැඩිකර ගැනීමේ හැකියාව පවතී. වාර්ෂිකව වැයවන ආනයන වියදම අඩුකර ගනිමින් දේශීයව නිපදවිය හැකි සියලුම ආහාර වර්ග උපරිම වශයෙන් මෙරටෙහි නිෂ්පාදනය කර ගැනීම කාලීන අවශ්‍යතාවයක් බවටද පත්ව ඇත.

තවද ශ්‍රී ලංකාවේ ආහාර පරිභෝජන තත්ත්වයන් සලකා බලන විට පෝෂණවේදීන්ගේ නිර්දේශයන්ට අනුව ඒක පුද්ගල දෛනික එළවලු හා පළතුරු පරිභෝජනය ග්‍රෑම් 200 බැගින් වියයුතු වුවත් එය ග්‍රෑම් 100 ක පමණ මට්ටමක පවතී. එමෙන්ම ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය දිනකට ග්‍රෑම් 100 ක් වියයුතු වුවත් එය දිනකට ග්‍රෑම් 40 ක් පමණ වීමද ඒක පුද්ගල කිරි ආශ්‍රිත නිෂ්පාදන පරිභෝජනය ද දිනකට මිලි ලීටර් 100 ක් වුවත් එය පහළ මට්ටමක පැවතීමත් ශ්‍රී ලංකාවේ ජනතාවගේ පෝෂණ මට්ටම කෙරෙහි බලපෑමක් ඇතිකර තිබේ.

මෙම කරුණු සැලකිල්ලට ගෙන දේශීයව නිෂ්පාදනය කළ හැකි ආහාර වර්ග මෙන්ම සත්ත්ව හා මත්ස්‍ය නිෂ්පාදනද ප්‍රමාණාත්මකව ඉහළ නංවමින් ගුණාත්මකව නිෂ්පාදනය කර ස්වයංපෝෂිත ඉලක්ක කරා ළඟා වීම හා එමඟින් විශාල විදේශ විනිමයක් රට තුළ ඉතිරිකර ගැනීමේ අපේක්ෂාවෙන් පාර්ශවකාරී ආයතන සමඟ සම්බන්ධ වී ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන 2016 – 2018 කාලය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලදී. මෙම ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය එකඟතාවය ලබා ගැනීම සඳහා සකස් කරන ලද අමාත්‍යමණ්ඩල සංදේශය (කැබිනට් පත්‍රිකා අංක 15/1391/701/008) සඳහා 2015.10.14 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එකඟතාවය ලබා දෙන ලදී.

ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන මඟින් පහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීමට සැලසුම් කරන ලදී.

### *මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණු වන්නේ*

- ❖ කෘෂි පාරිසරික කළාප පදනම් කරගත් බෝග නිෂ්පාදන වැඩසටහනක් හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම මඟින් රටේ සමබර සංවර්ධනයක් ඇති කිරීම.
- ❖ දේශීය වශයෙන් නිෂ්පාදන කළ හැකි ආහාර වලින් රට ස්වයංපෝෂිත කිරීම සහ ඒ මඟින් ආහාර ආනයනය සඳහා වැය වන විශාල විදේශ විනිමය ප්‍රමාණයක් ඉතිරිකර ගැනීම.
- ❖ ආහාර නිෂ්පාදනයේදී රසායනික පොහොර හා පළිබෝධ නාශක භාවිතය අවම කොට පරිසර හිතකාමී ක්‍රම අනුගමනය කිරීම මඟින් ගුණාත්මක ආහාර ද්‍රව්‍ය සුලබ කිරීම.

- ❖ මත්ස්‍ය නිෂ්පාදනය, එහි තත්ත්වය, ගුණාත්මකබව සහ සෞඛ්‍ය ආරක්ෂිත බව පිළිගත් සම්මතයන් දක්වා ඉහළ නැංවීම මඟින් රටේ ආහාර සුරක්ෂිතතාව හා පෝෂණ තත්ත්වය ඉහළ නැංවීමට දායක වීම.

- ❖ නිෂ්පාදනය කරන ආහාර කාර්යක්ෂමව ප්‍රවාහනය, බෙදා හැරීම හා අතිරේක ආහාර සංචිත විධිමත්ව කළමනාකරණය කිරීම මඟින් ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම.

- ❖ නිෂ්පාදන කාර්යයේදී ගුණාත්මක යෙදවුම්, යෝග්‍ය තාක්ෂණික හා යාන්ත්‍රික ක්‍රම භාවිතාකර නිෂ්පාදන ඵලදායිතාව උපරිම කිරීම හා නිෂ්පාදන පිරිවැය අවම කිරීම.

- ❖ දේශීය ආහාර නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ සියළු ආයතන අතර මනා සම්බන්ධීකරණයක් ඇති කිරීම හා පාසැල් ප්‍රජාව, ගොවි සංවිධාන ඇතුළු සිවිල් සංවිධාන සහ මහජනතාවගේ එදිනෙදා ජීවිතයට මෙම වැඩසටහන බද්ධ කරවීම.

## *2015 වසරේදී සිදු කරන ලද ප්‍රධාන කාර්යයන්*

**2015.07.20 -** ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන සම්බන්ධව අතිගරු ජනාධිපතිතුමන්ගේ සංකල්පය ඉදිරිපත් කළ පළමු රැස්වීම.

**2015.08.05 -** ජනාධිපති කාර්යාලයේදී ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන පිළිබඳ පළමු වැඩමුළුව පැවැත්වීම.

**2015.09.21 -** ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන ( 2016 – 2018 ) සම්බන්ධව අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කිරීම.

**2015.10.05 -** අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි මුළු රටම පිබිදෙන සුවිශේෂී වැඩසටහන් මාලාවක් මඟින් මෙම ජාතික වැඩසටහන ක්‍රියාවට නැංවීම කිළිනොච්චිය වඩ්ඩකච්චිහිදී ආරම්භ කිරීම.







**මෙම ජාතික වැඩසටහනට සමගාමීව දිස්ත්‍රික් මට්ටමින් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් විවිධ වැඩසටහන් රැසක් එදින පැවැත් වූ අතර, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ජනාධිපති කාර්යාලය විසින් සපයන ලදී. දිස්ත්‍රික්ක 21 ක් සඳහා ලබා දුන් මුළු ප්‍රතිපාදන රු. 2,395,397/= කි.**

**2015.10.05 දින පවත්වන ලද ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහනට සමගාමීව දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වූ වැඩසටහන්**

| *දිස්ත්‍රික්කය /ස්ථානය* | *ක්‍රියාකාරකම්* | *ජනාධිපති කාර්යාලයෙන් දරන ලද වියදම රු.* |
|---|---|---|
| **කොළඹ**<br>දිස්ත්‍රික් පුහුණු කෘෂිකර්ම මධ්‍යස්ථානය, ගබඩාවත්ත, හෝමාගම | ➢ පළතුරු පැල 50 ක් සිටුවීම සහ පවුල් 10 කට කුකුල් පැටවුන් 100 ක් බෙදාදීම.<br>➢ අක්කර 55 ක කුඹුරුයායේ බිම් සකස් කිරීම ආරම්භ කිරීම.<br>➢ පාරම්පරික වී වර්ග (කහවණු හා කොට්ටියාරම්) බුසල බැගින් බෙදාදීම. | 85,000 |
| **ගම්පහ**<br>දිවුලපිටිය, බෝලගල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය | ➢ බෝලගලදී අක්කර 16 ක පළතුරු ගම්මානයක් පිහිටුවීම සඳහා ජම්නාරං පැල 2000ක් බෙදා දීම. | 135,486 |
| **කළුතර**<br>හොරණ කනන්විල පළතුරු බෝග හා සංවර්ධන ආයතනය | ➢ පළතුරු පැල රෝපණය, බිත්තර වී බෙදා දීම, පොල් පැල, කුකුල් පැටව්, සාදික්කා පැළ තෝරාගත් ගොවීන්ට බෙදා දීම, පාසැල් ගෙවතු සඳහා කෘෂි උපකරණ ලබාදීම. | 119,880 |

| | | |
|---|---|---|
| **මහනුවර**<br>මළුවේගම යාය, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ➢ වප් මඟුල් උත්සවය පැවැත්වීම.<br>➢ වගා ණය සහ කෘෂිකාර්මික උපකරණ බෙදා දීම.<br>➢ ගොවි දරුවන් සඳහා ළමා ඉතුරුම් ආරම්භ කිරීම.<br>➢ කෘෂි ව්‍යාපාරික ණය ලබා දීම හා සාම්ප්‍රදායික බීජ වී ලබා දීම, තෝරාගත් ග්‍රාමීය පාසල් ළමුන් සඳහා දියර කිරි ලබා දීම.<br>➢ ගොවි විශ්‍රාම වැටුප් ලබා දීම.<br>➢ වැස්සි පැටව් ඇතිදැඩි කිරීමේ ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභීන් 10 කට ආධාර ලබාදීම. | 69,000 |
| **මාතලේ,**<br>මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ➢ අඹ, දෙළුම් වැනි පළතුරු පැළ රෝපණය කිරීම.<br>➢ කිරි ගොවීන් 05 දෙනෙකුට සංකේතාත්මකව චෙක්පත් ප්‍රධානය.<br>➢ උකුවෙල, ඉඹුල්පිටිය මහා විද්‍යාලයීය ඉඩමේ වගා කිරීම.<br>➢ අක්කර 02 ක භූමියක අඹ, ගම්මිරිස්, පළතුරු පැළ සිටුවීම.<br>➢ ගෙවතු වගා වැඩසටහන ආරම්භ කිරීම. | 60,800 |
| **නුවරඑළිය**<br>මහකුඩුගල විහාරස්ථානය | ➢ බීජ අර්තාපල් නිෂ්පාදන වැඩසටහන ක්‍රියාත්මක කිරීම.<br>➢ ඉදිරි කන්නය සඳහා බීජ අර්තාපල් ලබා දීම. | 52,525 |
| **ගාල්ල**<br>ලබුදූව රජයේ ගොවිපල | ➢ ඌන සංවර්ධිත දේශීය පළතුරු පැල රෝපණය කිරීම.<br>➢ පොල්පැල 500, කුරුඳු පැල, ගම්මිරිස් පැල, නව අභිජනන බිත්තර වී, කාබනික පොහොර සුදුසු ගොවීන්ට බෙදාදීම සහ කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන ක්‍රියාත්මක කිරීම. | 128,600 |
| **මාතර**<br>කඹුරුගමුව කොටවිල,නුගගහවත්ත ක්ෂේත්‍රයේ | ➢ ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන සම්බන්ධව දැනුවත් කිරීම හා පරිසර හිතකාමී තාක්ෂණ ක්‍රම පිළිබඳව දේශනයක් පැවැත්වීම.<br>➢ ආරම්භ කර ඇති අන්නාසි වගාව තව දුරටත් පුළුල් කිරීම.<br>➢ ඌන සංවර්ධිත පළතුරු පැළ සිටුවීම.<br>➢ වැල් දොඩම් වගාව අලුතින් ස්ථාපනය කිරීම.<br>➢ කාබනික පොහොර නිෂ්පාදනය කිරීම ආදර්ශනය.<br>➢ ගොවි කාන්තා වැඩසටහනක් තුළින් දේශීය ආහාර නිෂ්පාදනය ආදර්ශනය කිරීම<br>➢ ගෙවතු වගා උපකරණ කට්ටල සංකේතවත් ලෙස බෙදා දීම. | වියදම ඉදිරිපත් කර නොමැත |
| **හම්බන්තොට**<br>සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බැදිගම්තොට ග්‍රාමය. | ➢ පළතුරු පැළ බෙදා දීම. (පැණි දොඩම් පැළ 3000ක්, දිවුල් පැළ 1000) | 197,500 |

| | | |
|---|---|---|
| **යාපනය**<br><br>පෙරියවිලන්, සන්දිලිපෙ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය . | ➢ පෙරියවිලන් ප්‍රදේශයේ පැපොල් පැළ 550 ක් රෝපණය කිරීම. | 160,000 |
| **මන්නාරම**<br><br>කට්ටකඩාන්තාකුලම්, නානන්තන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ➢ පළතුරු පැල 50 ක් සිටුවීම. | වියදම ඉදිරිපත් කර නොමැත |
| **වව්නියාව**<br><br>මුරුගනුර් වව්නියා. | ➢ අක්කර භාගයක අන්නාසි වගාව සිදුකිරීම. | 64,865 |
| **මුලතිව්**<br>ඔඩ්ඩුසුඩාන්හි ක්ෂේත්‍රයේ | ➢ ඔඩ්ඩුසුඩාන් ප්‍රදේශයේ රටකජු සිටුවීම. | 72,000 |
| **අම්පාර**<br>දමන ප්‍රා.ලේ. කොට්ඨාශයේ පහළලන්ද කරාණ වෙල්යායේ | ➢ පහළලන්ද කරාන වෙල්යායේ තෙවන කන්නයේ අක්කර 150 මුං ඇට වගාවේ අස්වනු නෙලීම.<br>➢ දමන වාරිමාර්ග කොට්ඨාශයේ RB4 කෙත්ඇළ මාර්ගය වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් ශුද්ධ පවිත්‍ර කිරීම.<br>➢ ගල්ඔය නවෝද්‍යා ව්‍යාපෘතිය යටතේ වතුර පොම්ප බෙදා දීම, ගංවතුරෙන් හානියට පත් වූ ගොවීන්ට කෘෂි රක්ෂණ වන්දි මුදල් චෙක්පත් ලබා දීම. | 66,030 |
| **ත්‍රිකුණාමලය**<br>මනිරාසකුලම්, කින්නියා | ➢ ආදර්ශන වගාවන් ලෙස බඩ ඉරිඟු හා රට කජු සිටුවීම.<br>➢ බඩ ඉරිඟු බීජ, කිකිළි පැටවුන් 10 බැගින්, කිරිගව ආහාර, පළතුරු පැල තෝරාගත් ගොවීන්ට බෙදා දීම.<br>➢ පළතුරු පැළ භූමියේ රෝපණය කිරීම. | 106,800 |
| **මඩකලපුව**<br>රජයේ බීජ සහතික කිරීමේ සහ රෝපණ ද්‍රව්‍ය සංවර්ධනය කිරීමේ මධ්‍යස්ථානය, කරදියනාරු, එරාවුර්පත්තු ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය. | ➢ වී, බඩඉරිඟු, රටකජු, කව්පි, උඳු, මුං ඇට, තල, සෝයා බෝංචි, ලොකු ලූනු, කුරක්කන්, මිරිස්, එලවළු සහ පළතුරු යන බෝග වල නිෂ්පාදනය වැඩිකිරීමට ක්‍රියා කිරීම. | වියදම ඉදිරිපත් කර නොමැත |
| **කුරුණෑගල**<br>නිකවැරටිය ප්‍රා. ලේ. කොට්ඨාශය, බලගොල්ලාගම. | ➢ මහ කන්නය ආරම්භ කිරීමේ ශ්‍රමදානය.<br>➢ ආහාර නිෂ්පාදන ජාතික වැඩ සටහන පිළිබඳ ගොවීන් දැනුවත් කිරීම. | 180,000 |

| | | |
|---|---|---|
| **පුත්තලම**<br>දංකොටුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය, තුලාවල ග්‍රාමය. | ➢ තුලාවල ග්‍රාමයේ දැව බෝග හා අනෙකුත් ආහාර බෝග වගා කිරීමේ වැඩසටහන.<br>➢ තෝරාගත් ස්ථානයක පරිසර හිතකාමී ගෙවත්තක් සකස් කිරීම. | 116,340 |
| **අනුරාධපුර**<br>නාච්චාදුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය පාවක්කුලම ගමේ. | ➢ වී වගාවේ පැරෂුට් ක්‍රමය පිළිබඳ ගොවීන් දැනුවත් කිරීම.<br>➢ ප්‍රා.ලේ.කොට්ඨාශයේ පොදු ස්ථානයන්හි බද්ධ පළතුරු පැළ සිටුවීම, ආදර්ශ ගෙවත්තක් ස්ථාපනය කිරීම.<br>➢ කාබනික පොහොර භාවිතය දිරිගැන්වීම. | 290,000 |
| **පොළොන්නරුව**<br>පොළොන්නරුව දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය. | ➢ බීජ ගොවිපල පිහිටි වැවට මත්ස්‍ය පැටවුන් 30,000ක් මුදා හැරීම.<br>➢ දේශපාලන නායකයින්, රාජ්‍ය නිලධාරීන්, ගොවීන්ගේ සහභාගිත්වයෙන් හමුවක් පැවැත්වීම.<br>➢ කෘෂිකාර්මික සේවා සැපයීම වෙනුවෙන් සංවිධානය කර තිබූ ප්‍රදර්ශනය හා වැඩමුළුව විවෘත කිරීම. | 160,000 |
| **බදුල්ල**<br>මීගහකිවුල, කෝමාරිකා ඇළ ව්‍යාපාරයේ පලාවත්ත වෙල්යාය | ➢ ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහනට සමගාමීව විවිධ වැඩසටහන්. | 129,500 |
| **මොණරාගල**<br>වැල්ලවාය සහ සියඹලාන්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල | ➢ පැණිබීම සඳහා ආදේශකයක් ලෙස දිස්ත්‍රික්කය පුරා තැඹිලි පැළ සිටුවීම.<br>➢ සියඹලාණ්ඩුව - යන්ත්‍රානුසාරයෙන් අක්කර 1ක බඩඉරිඟු බීජ සිටුවීම.<br>➢ වී යාය වැඩසටහන යටතේ ගොවීන් සඳහා බිත්තර වී ලබා දීම.<br>➢ වැල්ලවාය - අක්කර 1ක ක්ෂේත්‍රයක රටකජු සිටුවීම.<br>➢ ශ්‍රී ලංකා කර්මාන්ත සංගම් සමූහය යටතේ රටකජු නිෂ්පාදකයින්ගේ ප්‍රාදේශීය සංගමය පිහිටුවීම. | 56,000 |
| **රත්නපුර**<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය රත්නපුර | ➢ බටාත බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානයෙන් ලබා ගත් පහත සඳහන් එළවළු බීජ ඇතුලත් කුඩා කට්ටල ගෙවතු වගාවන් සඳහා ගොවීන් වෙත ලබා දෙන ලදි.<br>ලබා දෙන ලද මුළු බීජ ප්‍රමාණය:<br>බණ්ඩක්කා බීජ 500g, පතෝල බීජ 600g, මෑ බීජ 1335g, මාළු මිරිස් බීජ 300g, රාබු බීජ 250g, බෝංචි බීජ 730g, දඹල බීජ 490g, වැටකොලු බීජ 10g | 81,071 |
| **කෑගල්ල**<br>වරකාපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, දැදිගම වෙල්යාය . | ➢ වප් මඟුල් උත්සවයක් පවත්වා ලියදි 3ක සීසෑම.<br>➢ පළතුරු පැළ සහ කෘෂි යන්ත්‍රෝපකරණ බෙදා දීම. | 64,000 |

## දිස්ත්‍රික් වැඩසටහන් පැවැත්වීම - 2015.10.05

මාතලේ





යාපනය







මුලතිව්





**2015.11.09** - අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් දේශපාලන නායකත්වය හා සියලු පාර්ශවකාරී ආයතන සමඟ ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන පිළිබඳ දැනුවත් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ සාකච්ඡාවක් ජනාධිපති මන්දිරයේදී පවත්වන ලදී.







**2015.11.13** - කෘෂි ව්‍යාපාර සංවර්ධන ජාතික වැඩසටහන ( NADEP ) ජනාධිපති කාර්යාලයේ සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශයට පවරා ගැනීම.

**2015.11.25** - වස විසෙන් තොර තිරසාර ගොවාතැන ප්‍රවර්ධනය සඳහා 2015 වසරේ මාස් කන්නයේදීම සාම්ප්‍රදායික දේශීය බිත්තර වී සපයා ගැනීමට කි.ග්‍රෑ. 1 ක් රු.70/= බැගින් මිලදී ගෙන එම බීජ වී අදාල ගොවීන්ට නොමිලේ ලබා දීමටත්, අවාරයේ බෝග වගාව ප්‍රචලිත කිරීමට අවශ්‍ය බීජ, රෝපන ද්‍රව්‍ය හා උපකරණ අදාල ගොවි සංවිධාන වලට නොමිලේ ලබා දීමත් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ( කැබිනට් පත්‍රිකා අංක 15/1331/701/008 ) ඉදිරිපත් කරන ලදී. මේ සඳහා 2015.12.02 පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දෙන ලදී.

**2015.12.09** - වස විසෙන් තොර ගොවිතැන ප්‍රවර්ධනය කිරීමේ වැඩපිළිවෙල යටතේ 2015/2016 මහ කන්නයේදී සාම්ප්‍රදායික වී වර්ග සහ අතුරු බෝග වගා කිරීමේ කටයුතු වෙනුවෙන් දිස්ත්‍රික්ක 10 ක් සඳහා ප්‍රතිපාදන නිදහස් කරන ලදී.

***2015 / 2016 මහ කන්නයේ පාරම්පරික දේශීය බිත්තර වී හා අතුරුබෝග වගා කිරීමේ කටයුතු සඳහා දරන ලද වියදම්.***

| දිස්ත්‍රික්කය | වැය වූ මුදල (රු.) |
|---|---|
| ත්‍රිකුණාමලය | 4,397,400 |
| අම්පාර | 191,940 |
| මුලතිව් | 3,700,000 |
| වව්නියාව | 1,704,570 |
| පොළොන්නරුව | 119,700 |
| අනුරාධපුර | 8,050,595 |
| පුත්තලම | 1,373,435 |
| කුරුණෑගල | 2,105,120 |
| කිළිනොච්චිය | 702,300 |
| **එකතුව** | **22,345,060** |

**දේශීය බිත්තර වී වගා කිරීම**

**දේශීය පාරම්පරික වී වගාව ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය යටතේ දිස්ත්‍රික්ක 8 ක, 2015 දෙසැම්බර් වනවිට වගාකර ඇති භූමි ප්‍රමාණය අක්කර 9065 ක් පමණ වන අතර බෙදාදුන් දේශීය බිත්තර වී ප්‍රමාණය 272,428 Kg වේ.**

| *දිස්ත්‍රික්කය* | *වගා කර ඇති භූමි ප්‍රමාණය (අක්කර)* | *දේශීය බිත්තර වී ලබාදුන් ප්‍රමාණය (කි.ග්‍රෑ)* |
|---|---|---|
| ත්‍රිකුණාමලය | 2094.000 | 62,820 |
| අම්පාර | 376.500 | 11,295 |
| මුලතිව් | 1050.300 | 31,509 |
| වව්නියාව | 795.750 | 24,351 |
| පොළොන්නරුව | 444.375 | 13,331 |
| අනුරාධපුර | 2649.100 | 79,473 |
| පුත්තලම | 650.500 | 19,515 |
| කුරුණෑගල | 1004.490 | 30,134 |
| එකතුව | **9065.015** | **272,428** |

**2015.12.21 -** ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහනට අදාළව හොඳම ගොවියා තේරීම සඳහා අවශ්‍ය නිර්ණායක තීරණය කිරීමේ සාකච්ඡාව පැවැත්වීම හා අවශ්‍ය මූලික කටයුතු සංවිධානය කරන ලදී

## *පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන*

### *පසුබිම*

ජනගහනය වර්ධනය, අවිධිමත් නාගරීකරණය හා සංවර්ධනය, ජනතාවගේ ජීවන රටාව වෙනස් වීම හේතුවෙන් මෑතක සිට කැලිකසල අවිධිමත් ලෙස අපහරණය, පරිසර දූෂණය, වනපෙත් කපා හෙළීම, භූමි හායනය වැනි පරිසර ගැටලු රාශියක් සීඝ්‍ර ලෙස වර්ධනය වී වර්තමානයේදී බරපතල ගැටළු බවට පත් වී ඇත. ඉහත කී ගැටළු ද ඇතුළත් පාරිසරික ගැටළු විසඳීම සඳහා පාර්ශවකාරී සියලු ආයතන සමඟ එක්ව ප්‍රධාන උපාය මාර්ග සහ ඊට අදාළ ක්‍රියාකාරකම් අන්තර්ගත වන පරිදි පරිසර සංරක්ෂණය සඳහා තුන් අවුරුදු ජාතික වැඩසටහන (2016-2018) “පුනරුදය” යන තේමාව යටතේ සකස් කරන ලදී. මෙම වැඩසටහන 2015 ඔක්තෝබර් මස සිට ක්‍රියාත්මක කිරීම සඳහා වූ ප්‍රතිපත්තිමය එකඟතාවය ලබා ගැනීම සඳහා සකස් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය (කැබිනට් පත්‍රිකා අංක - 15/1390/701/007) සඳහා 2015.10.14 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එකඟතාව ලබා ගන්නා ලදී.

"පුනරුදය" පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන මඟින් සාක්ෂාත් කර ගැනීමට සැලසුම් කරන ලද ප්‍රධාන අරමුණු:

- ❖ ශ්‍රී ලංකාවේ තිරසර පැවැත්ම සඳහා අවශ්‍යවන මුළු භූමි ප්‍රමාණයෙන් 32% ක් පමණ ඉහළ නැංවීම සමඟ වන සම්පත් සංරක්ෂණය හා සංවර්ධනය කිරීම. ("වනරෝපා" හා "වනසරණ" වැඩසටහන්)
- ❖ තිරසර කසළ කළමනාකරණයක් තුළින් 2018 වන විට නිකසළ ජීවන පරිසරයක් නිර්මාණය කිරීම. ("නිකසළ ලංකා", "නිකසළ පුරවර" හා "සුනිල සයුර" වැඩසටහන්)
- ❖ ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත් තිරසර උපයෝජනය, සංරක්ෂණය හා කළමනාකරණය තුලින් ජීවනප්‍රිය පරිසර පද්ධතියක් ස්ථාපිත කිරීම ("හායන සායන" , "ක්ෂේම භූමි" , "කැනීම් භූමි පුනරුත්ථාපනය" , "දේශගුණ අනුහුරු තිරසාර ගම්මාන" , "පසන් නගර හා පසන් ගම්මාන" හා "ජන දිවි රකින - ජල රැකවරණ" , "සාර නගර" හා "ජනවරණ රැකවරණ" වැඩසටහන්)
- ❖ පරිසර සංරක්ෂණය සඳහා මහජනතාව සවිඥානිකව සවිබල ගැන්වීම ("ජන අඩහැරය" වැඩසටහන)
- ❖ පරිසර සංරක්ෂණ කටයුතු කළමනාකරණයට ප්‍රශස්ත ආයතනික පද්ධතියක් ස්ථාපිත කිරීම හා ඒකාබද්ධ පරිසර ප්‍රවර්ධනයක් ගොඩනැගීම ("පද්ධති ප්‍රතිනිර්මාණය" වැඩසටහන)
- ❖ මෙම වැඩසටහන ජාතික මට්ටමෙන් මෙහෙයවීම, අධීක්ෂණය, ප්‍රගති සමාලෝචනය ජනාධිපති ලේකම් ඇතුළු අමාත්‍යාංශ ලේකම්වරුන් හා අදාල ආයතන ප්‍රධානීන්ගේ කමිටුවක් තුළින් සිදු කිරීම. එසේම, පළාත් හා දිස්ත්‍රික්ක මට්ටමේදී අමාත්‍යාංශ හා ආයතනවල පළාත් හා දිස්ත්‍රික්ක මට්ටමේ නිලධාරීන්ගෙන් සහ අනෙකුත් පාර්ශවකරුවන්ගෙන් සැදුම්ලත් කමිටුවලින් ඉහත සඳහන් කර ඇති ජාතික මට්ටමේ සියලු කාර්යයන් ක්‍රියාත්මක කිරීම.

## *2015 වසරේදී සිදු කරන ලද ප්‍රධාන කාර්යයන්*

**2015.07.21** - අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති කාර්යාලයේදී පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන පිළිබඳව මූලික රැස්වීම පැවැත්වීම.

**2015.07.30** - තුන් අවුරුදු ජාතික සැලැස්ම සැකසීම පිළිබඳ වැඩමුළුව ජනාධිපති කාර්යාලයීය භෝජනාගාර ශාලාවේදී පැවැත්වීම.

**2015.09.19** - අන්තර්ජාතික වෙරළ පිරිසිදු කිරීමේ දිනය ගාලු මුවදොර අභියසදී අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීම.









**2015.09.21 -** “පුනරුදය” පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන (2016-2018) සඳහා වූ අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කිරීම.

- **2015.10.11 -** “වන රෝපා” ජාතික රුක් රෝපණ වැඩසටහන නවදෙවිට, මහවැලි රක්ෂිතයේදී පැවැත්වීම.











- **2015.10.13 -** එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල යටතේ ක්‍රියාත්මක වන හරිත දේශගුණ අරමුදල පිළිබඳ සාකච්ඡාව ජනාධිපති ලේකම් කාර්යාලයේදී පැවැත්වීම.
- **2015.10.14 -** ශ්‍රී ලංකාව තුළ ඇස්බැස්ටස් නිෂ්පාදනය හා භාවිතය තහනම් කිරීම සම්බන්ධව ගෙන ඇති තීරණය පිළිබඳව, ජනාධිපති ලේකම් කාර්යාලයේදී පැවැත්වූ පරිසර සංරක්ෂණය පිළිබඳ වැඩසටහනකදී සාකච්ඡා කිරීම.
- **2015.11.17 -** කොළඹ හා සියලු ප්‍රධාන නගරයන්හි කැළිකසළ ප්‍රතිචක්‍රීකරණය හා විනාශ කිරීමේ ව්‍යාපෘති යෝජනාව පිළිබඳ සාකච්ඡාව පිළිබඳ සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශයේදී පැවැත්වීම.
- **2015.11.19 - Higher Level Ministerial Committee on preparation of a project proposal for the Green Climate Fund** රැස්වීම ජනාධිපති ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති කාර්යාලයේදී පැවැත්වීම.
- **2015.12.02 - 2016** ජනවාරි **01** වන දා සිට මයික්‍රෝන් **20** ට අඩු පොලිතීන් භාවිතය තහනම් කිරීමට අදාළ තීරණ ගැනීම.

- **2015.12.29 -** අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් 2015.10.13 දින විශ්ව විද්‍යාල ආචාර්යවරුන් සමඟ පැවති සාකච්ඡාවේදී තීරණය වූ පරිදි පරිසර සංරක්ෂණයට අදාල විශේෂිත අදහස් හා යෝජනා ලබා දීම සඳහා විශ්ව විද්‍යාල ආචාර්ය වරුන්ගේ විද්වත් කමිටු රැස්වීමක් පැවැත්වීම.







## මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික වැඩසටහන

### පසුබිම

මත්ද්‍රව්‍ය භාවිතය දැනට දශක කීපයක් පුරා අප රට මුහුණ දී ඇති බරපතල ගැටලුවකි. ශ්‍රී ලංකාවේ අඩු ආදායම් ලාභී පවුල්වල ආදායමෙන් 1/3 ක් මද්‍යසාර හා දුම්වැටි සඳහා වැය කරන බවත්, සෞඛ්‍ය වියදමින් 22% කට වඩා සෘජුවම මද්‍යසාර, දුම්වැටි භාවිතා කර රෝගී වූවන් වෙනුවෙන් වැය කරන බවත්, සමීක්ෂණ මඟින් හෙළිවී ඇත. මීට අමතරව මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන්ගේ පවුල් වල අනෙකුත් සාමාජිකයින් ද ආර්ථිකමය හා සමාජීය වශයෙන් ගැටළු රැසකට මුහුණදෙයි. මෙම අභාග්‍ය සම්පන්න තත්වයෙන් රට මුදවා ගැනීම සඳහා “මතින් නිදහස් රටක්” වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරනු ලැබේ.

මත්ද්‍රව්‍ය ඉල්ලුම අවම කිරීම මෙන්ම සැපයුම අවම කිරීම පිළිබඳවද අවධානය යොමු කරමින් පහත පරිදි ප්‍රධාන අංශ 03 ක් යටතේ මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.

- ප්‍රතිපත්ති හා නීති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම
- ප්‍රතිකාර හා පුනරුත්ථාපනය
- නිවාරණය

අතිගරු ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක වන මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්යය සාධන බලකාය විසින් මත්ද්‍රව්‍ය නිවාරණයට අදාල රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සම්බන්ධීකරණය කරමින් "මතින් නිදහස් රටක්" වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම සිදුකරනු ලබයි.ඒ සඳහා අවශ්‍ය දැනුම හා ආකල්ප අදාළ කණ්ඩායම්වලට ලබා දීමටත් එමගින් මත්ද්‍රව්‍ය භාවිතය අවම වූ සමාජයක් ගොඩනැගීම උදෙසාත් විද්වතුන් රැසකගේ අදහස් සැළකිල්ලට ගනිමින් සකස් කළ ජාතික ප්‍රතිපත්තිය හා වැඩපිළිවෙල සඳහා 2015.07.08 දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.

*මෙම මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනේ අරමුණු වන්නේ*

- 2014 වසරට සාපේක්ෂව වසර 2020 වන විට ශ්‍රී ලංකාවේ නීති විරෝධී මත්ද්‍රව්‍ය නිෂ්පාදනය, ප්‍රවාහනය හා අලෙවිය අවම වශයෙන් 80% කින් අඩු කිරීම.
- 2014 වසරට සාපේක්ෂව 2020 වසර වන විට ඒක පුද්ගල මද්‍යසාර භාවිතය අවම වශයෙන් 25% කින් අඩු කිරීම.
- 2014 වසරට සාපේක්ෂව 2020 වන විට දුම්කොළ නිෂ්පාදන භාවිතය අවම වශයෙන් 50% කින් අඩු කිරීම.
- නවකයන් මත්ද්‍රව්‍ය භාවිතය ඇරඹීම වැළැක්වීම.
- දුම්කොළ හා මද්‍යසාර සෘජු හෝ වක්‍ර ප්‍රචාරය සහ එම සමාගම්වල සමාජ සත්කාරක වැඩසටහන් සම්පූර්ණයෙන් නතර කිරීම.
- නිවෙස්වල දී, සේවා ස්ථානවල දී හා පොදු ස්ථානවලදී අන් අය විසින් මත්ද්‍රව්‍ය භාවිතා කිරීම හේතුවෙන් භාවිතා නොකරන්නන්ට වන හානිය අවම කිරීම සහ එබඳු ගැටළුවලින් තොර පරිසරයක ජීවත් වීමට භාවිත නොකරන්නන්ට ඇති අයිතිය තහවුරු කිරීම.
- මත්ද්‍රව්‍ය භාවිතයෙන් වන සෘජු හා වක්‍ර හානිය පිළිබඳව නිවැරදිව සහ විධිමත්ව ජනතාව දැනුවත් කිරීම.

## *2015 වසරේ සිදුකරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්*

- **ජාත්‍යන්තර දුම්වැටි විරෝධී දින වැඩසටහන යටතේ 2015 මැයි 31 දින සිට ජුනි 06 දක්වා දුම්වැටි නිවාරණ සතියක් ප්‍රකාශයට පත්කිරීම**

- **2015 - ජුනි මාසය ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ මාසය වශයෙන් ප්‍රකාශයට පත්කිරීම.**

- **අමාත්‍ය මණ්ඩල සංදේශ පීඑස්/සීපී/17/2015 යටතේ ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ ප්‍රතිපත්තිය හා ක්‍රියාකාරී වැඩපිළිවෙළ 2015.07.07 වන දින එළිදැක්වීම.**

- **2015.07.09 - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 13ක් ආවරණය වන පරිදි මත්ද්‍රව්‍ය නිවාරණ පළමුවන දිස්ත්‍රික් වැඩසටහන ගම්පහ දිස්ත්‍රික්කයේ ජා-ඇළ දී අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.**






- **2015.07.29 දින රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 19/2015 යටතේ රාජ්‍ය ආයතන තුළ මත්ද්‍රව්‍ය භාවිතය තුරන් කිරීම.**

- **අමාත්‍ය මණ්ඩල තීරණ - 15/1658/719/038 යටතේ මුදල් අමාත්‍යාංශය මඟින් 2015.11.04 දින සිට ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය/ ආනයනය/ අපනයනය කරනු ලබන සියලුම මත්පැන් වර්ග සඳහා නව ආරක්ෂිත ලේබලයක් (ස්ටිකරයක්) හඳුන්වා දීම.**

- **2015.09.18 - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 19ක් ආවරණය වන පරිදි මත්ද්‍රව්‍ය නිවාරණ දෙවන දිස්ත්‍රික් වැඩසටහන ගාල්ලේ දී අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.**





- **2015.11.16 -** ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 11ක් ආවරණය වන පරිදි මත්ද්‍රව්‍ය නිවාරණ තෙවන දිස්ත්‍රික් වැඩසටහන කෑගල්ලේදී අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.





## වකුගඩු රෝග නිවාරණ ජාතික වැඩසටහන

### පසුබිම

1990 දශකයේදී පමණ මෙරට මූලික වශයෙන්ම රජරට ප්‍රදේශයෙන් හඳුනාගත් මෙම මූලය අවිනිශ්චිත නිදන්ගත වකුගඩු රෝගය මේ වන විට ලංකාවේ විවිධ ප්‍රදේශවල ව්‍යාප්ත වී ඇත. මෙම රෝගය උතුරු මැද පළාත, ඌව පළාත, වයඹ පළාත, උතුරු පළාත, මධ්‍යම පළාත සහ නැගෙනහිර පළාත යන පළාත්වල වැඩිවශයෙන් ව්‍යාප්ත වී ඇත. දිස්ත්‍රික්ක වශයෙන් සලකා බැලීමේදී මෙම රෝගය ප්‍රධාන දිස්ත්‍රික්ක 11ක (අනුරාධපුරය, පොළොන්නරුව, කුරුණෑගල, මාතලේ, වව්නියාව, බදුල්ල, හම්බන්තොට, අම්පාර, මොණරාගල, මුලතිව්, ත්‍රිකුණාමලය) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 60ක ජනතාවට මෙම රෝගය ප්‍රධාන ගැටලුවක් බවට පත්ව ඇත. සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 2015 දෙසැම්බර් වන විට අවදානම් ප්‍රදේශවල ජීවත්වන පුද්ගලයින් සඳහා සිදුකරන ලද පරීක්ෂාවෙන් (Screening) වාර්තා වී ඇති මෙම රෝගීන් සංඛ්‍යාව 20,828 කි.

මෙම රෝගයට මූලික වන හේතූන් නිශ්චිතව හඳුනාගෙන නොමැති අතර අනුමාන හේතූන් ලෙස කෘෂි රසායන හා රසායන අවශේෂයන්, ජලයේ අඩංගු බැර ලෝහ (ආසනික්, කැඩ්මියම්, ඊයම්), අවශ්‍ය ප්‍රමාණයට පානීය ජලය නොගැනීම, විජලනය හා අධික හිරු රශ්මියට නිරාවරණය වීම, වතුරේ අධිකව ෆ්ලෝරයිඩ් අඩංගු වීම, ජලයේ ඝනත්වය (කැල්සියම්, මැග්නීසියම්) යන කරුණු පර්යේෂණ මඟින් හඳුනා ගෙන ඇත.

මෙම ජාතික ප්‍රශ්නය විසඳීම සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ මඟපෙන්වීම යටතේ 2015 වසරේ වකුගඩු රෝග නිවාරණ ජනාධිපති කාර්ය සාධක බලකාය පිහිටුවනු ලැබූ අතර අනිකුත් පාර්ශවකාරී ආයතන සමඟ සම්බන්ධ වී "වකුගඩු රෝග නිවාරණ ජාතික වැඩසටහන" පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලදී.

1. රෝග නිවාරණය සඳහා චර්යා ප්‍රවර්ධනය
2. රෝගීන් පෙර හඳුනා ගැනීම
3. රෝගීන්ට ප්‍රතිකාර කිරීම
4. රෝගියා, පවුල සහ ප්‍රජාව සඳහා සුබසාධනය
5. පිරිසිදු පානීය ජලය සම්පාදනය
6. සෞඛ්‍ය ආරක්ෂිත ආහාර සහ පෝෂණය
7. සක්‍රිය නිරීක්ෂණ පද්ධතියක් ස්ථාපනය කිරීම
8. සමීක්ෂණ, පර්යේෂණ හා ප්‍රතිපත්ති සම්පාදනය

### *2015 වර්ෂයේ සිදු කරන ලද ක්‍රියාකාරකම්*

- සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශය හා ජනාධිපති මාධ්‍ය ඒකකය සමඟ සම්බන්ධ වී දයාරත්න රටගෙදර මහතාගේ ප්‍රධානත්වයෙන් වකුගඩු රෝගය පිළිබඳ පෝස්ටර්, බැනර්, කටවුට්, වීදි නාට්‍ය මඟින් අදාළ ප්‍රදේශවල ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- නිදන්ගත වකුගඩු රෝගය තුරන් කිරීමේ වැඩසටහනෙහි සහ වකුගඩු රෝග වළක්වාලීම සඳහා වන KIND අරමුදලේ සන්නාමනාම තානාපතිවරුන් ලෙස ප්‍රවීන ක්‍රිකට් ක්‍රීඩකයින් වන තිලකරත්න ඩිල්ෂාන් මහතා සහ මුත්තයියා මුරලිදරන් මහතාත් EAP Holdings ආයතනයේ සභාපති මනෝ තිත්තවැල්ල මහතා හා ගෝල්ෆේස් හෝටලයේ සභාපති සංජීව් ගාඩ්නර් මහතාත් 2015 සැප්තැම්බර් මස 16 වන දින පත් කිරීම. මෙම පත් කිරීම තුළින් ප්‍රධාන වශයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා නායකත්වය ලබා ගැනීම හා KIND අරමුදල සඳහා මූල්‍ය දායක අවස්ථා ඇති කර ගැනීමට ඔවුන්ගෙන් උපරිම සහාය ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.

- වකුගඩු රෝග නිවාරණ ජාතික වැඩමුළුව 2015 දෙසැම්බර් 16 වන දින පෙ.ව. 8.30 ට සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය ගරු අමාත්‍ය වෛද්‍ය රාජිත සේනාරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ගාලු මුවදොර හෝටලයේදී පැවැත්වුනි. වකුගඩු රෝග නිවාරණ පාර්ශවකරුවන්ගේ මෙහෙයුම් එළිදැක්වීම එදිනම ප.ව. 3.00 ට අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ගාලු මුවදොර හෝටලයේදී පැවැත්වුනි.





*සන්නාම නාම තානාපතිවරුන් පත්කිරීම*



*වකුගඩු රෝග නිවාරණ ජාතික වැඩමුළුව 2015 දෙසැම්බර් 16, ගාලු මුවදොර හෝටලයේදී*

- 2015.08.24 දින සිට 2015.08.28 දින දක්වා මුලතිවු දිස්ත්‍රික්කයේ වැලිඔය ප්‍රදේශයේ ජංගම පිරික්සුම් සායන පැවැත්වීමට අවශ්‍ය සහාය ලබාදීම.

- මාළිගාවත්ත රෝහල වකුගඩු රෝහලක් ලෙස වැඩිදියුණු කිරීම සඳහා ගොඩනැගිලි අළුත්වැඩියා, කාර්යය මණ්ඩල අඩුපාඩු, ඖෂධ හා අනෙකුත් උපකරණවල අවශ්‍යතා හඳුනාගෙන අදාළ අවශ්‍යතා සම්පූර්ණ කිරීමට කටයුතු කිරීම.

- චීන රජයේ අනුග්‍රහය යටතේ වකුගඩු රෝගීන් සඳහා පොළොන්නරුව ප්‍රදේශයේ වකුගඩු රෝහලක් ඉදිකිරීම සඳහා 2015.08.14 දින චීන තානාපතිතුමන් සමඟ සාකච්ඡාකොට මූලික කටයුතු ආරම්භ කිරීම.

- වකුගඩු රෝගීන් හා ඔවුන්ගේ පවුල්වල සුබසාධනය සඳහා 2015 වසර අවසානය වන විට විවිධ සුබසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආරම්භ කෙරිණි. ඒ අනුව කොරියානු රජයේ ආධාර මත රෝගීන්ගේ ප්‍රවාහන කටයුතු සඳහා බස් රථයක් ලබාදීම, වකුගඩු රෝගීන්ගේ සුභසාධන කටයුතු සඳහා නිරෝගා ලොතරැයිය ආරම්භ කිරීම, වකුගඩු රෝගීන් සඳහා මූල්‍යාධාර ලබා දීම, වකුගඩු රෝගීන්ගේ දූ දරුවන් සඳහා අධ්‍යාපනික ශිෂ්‍යත්වය ලබා දීම යනාදිය ප්‍රධාන වශයෙන් සිදුකෙරිණි.




- 2015.12.31 දින ලන්ඩනයේ වෙසෙන ශ්‍රී ලාංකිකයින් විසින් වකුගඩු අරමුදල් රැස්කිරීමේ විශේෂ ව්‍යාපෘතියක් සැලසුම් කිරීම.

- වකුගඩු රෝගීන් සඳහා පිරිසිදු පානීය ජලය සම්පාදනය කිරීම සඳහා ප්‍රතිආශ්‍රැතිකරණ ජල පද්ධතියක් ස්ථාපනය කර වැලිඔය ජනතාවට ලබා දීම, මැදිරිගිරිය ප්‍රදේශයට ජල පද්ධතියක් ලබාදීම, පාසල් සඳහා පිරිපහදු කරන ලද ජලය ලබාදීම, වගා ළිං ලබාදීම හා බවුසර් මඟින් ජලය ලබාදීම සිදුකරන ලදී. එසේම ජපන් තාක්ෂණය යටතේ හඳුන්වා දුන් BIO-BRICKS ජල පිරිපහදු ක්‍රමය පරීක්ෂණාත්මකව ක්‍රියාත්මක කිරීම සඳහා වැලි ඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා ශ්‍රී ලංකා යුධ හමුදාව එක්ව කටයුතු කර ඇත.





- වකුගඩු රෝගයට හේතුවන මූලය සොයා ගැනීම සඳහා පර්යේෂණ කටයුතු දිරිමත් කළ අතර, කාර්යය සාධන බලකාය විසින් විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන සම්බන්ධීකරණ ඒකකය (COSTI) හා ඒකාබද්ධව පර්යේෂණ කටයුතු විධිමත් කිරීමට 2015 වසර අවසාන වන විට සැලසුම් කරන ලදී.

# 14. මහජන සම්බන්ධතා අංශය

## *හැඳින්වීම*

අතිගරු ජනාධිපතිතුමා වෙත යොමුවන මහජන ඉල්ලීම් (විශේෂයෙන් දේශපාලනමය ඉල්ලීම්)ඉටු කිරීම සම්බන්ධයෙන් අදාළ කටයුතු සිදු කරනු ලැබේ. අතිගරු ජනාධිපතිවරයා වෙත යොමු කරන ඉල්ලීම් සෘජුවම මෙම අංශයට යොමු කිරීමට මහජනයාට අවස්ථාව සැලසෙන අතර, ඒ සම්බන්ධව අවධානය යොමු කළයුතු අංශ වෙත යොමු කර සහන සැලසීම සිදු කෙරේ.

## *පොදු අරමුණු/කාර්යයන්*

- මෙම අංශයේ ප්‍රධාන අරමුණු වනුයේ ඉදිරිපත් වන මහජන ඉල්ලීම් වලින් දේශපාලනමය ඉල්ලීම් විවිධ අංශයන් වෙත යොමු කර ඒවාට හැකි උපරිම අන්දමින් අවධානය යොමු කොට අවශ්‍ය විසඳුම් ලබා දීම.

- ප්‍රධාන ඉල්ලීම් වන රැකියා, නිවාස, ඉඩම්, පාසල්වලට ළමුන් ඇතුළත් කිරීම, ආගමික ආයතනවලට ආධාර ඉල්ලීම්, ජනාධිපති අරමුදලින් ඉක්මනින් ප්‍රතිපාදන ලබා ගැනීමට කරනු ලබන ඉල්ලීම්, ස්ථාන මාරු, පොදු පහසුකම් සම්බන්ධයෙන් කරන ඉල්ලීම් ආදිය ප්‍රතිඵලදායක ලෙස අදාළ අංශ වෙත යොමුකොට ඒවායේ ප්‍රගතිය පිළිබඳව පසුවිපරම් සිදු කිරීම.

## *2015 වර්ෂයේ සාක්ෂාත් කරගැනීම.*

1. ජනතා හිතවාදී විශිෂ්ටතම රාජ්‍ය සේවාවක් සහතික කිරීම උදෙසා රාජ්‍ය ආයතනවලට අවශ්‍ය නායකත්වය ලබා දීම හා මෙහෙයවීමට කටයුතු කර ඇත.

2. මහජන ඉල්ලීම්, දුක්ගැනවිලි, පැමිණිලි හා යෝජනාවලට අවශ්‍ය විසඳුම්,අදාළ රාජ්‍ය ආයතන මෙහෙයවීම හා මැදිහත්වීම තුළින් කඩිනමින් ලබා දීමට කටයුතු කර ඇත.

3. හඳුනාගත් තීරණාත්මක ගැටලුවලට තිරසාර විසඳුම් සපයන ව්‍යාපෘති ඇරඹීම හා සංවිධානය පිණිස අදාළ රාජ්‍ය ආයතන මෙහෙයවීම හා ඊට මැදිහත්වීමට කටයුතු කර ඇත.

4. ආගමික නායකයන් ඇතුළු පූජ්‍ය පක්ෂය පොදු මහජන කටයුතු සම්බන්ධයෙන් යොමු කරනු ලබන ඉල්ලීම්, අදහස් හා යෝජනා පිළිබඳ කටයුතු කර ඇත.

5. උද්ඝෝෂණ හා විරෝධතා පැවැත්වීමෙන් අනතුරුව අතිගරු ජනාධිපතිතුමා හෝ ජනාධිපති ලේකම් වෙත භාර දීමට ගෙන එනු ලබන සන්දේශ භාර ගැනීම හා ඒ සම්බන්ධ ඉදිරි කටයුතු සිදු කිරීමට කටයුතු කර ඇත.

6. අතිගරු ජනාධිපතිතුමාගේ සහ ජනාධිපති ලේකම්ගේ අවධානය යොමු විය යුතු කරුණු පිළිබඳ වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

7. මහජන පීඩාවක් ඉදිරියේදී ඇතිවිය හැකියැයි උපකල්පනය කරනු ලබන කරුණු පිළිබඳ අධ්‍යනය කර ජනාධිපති ලේකම් වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

8. මහජන ගැටලු අවම කළ හැකි නව ක්‍රමවේදයන් පිළිබඳ අධ්‍යනය කිරීම හා ජනාධිපති ලේකම් වෙත වාර්තා කිරීමට කටයුතු කර ඇත.

9. 2016.01.08 දින අතිගරු ජනාධිපතිතුමාගේ ධූරයේ වර්ෂ පූර්ණය නිමිත්තෙන් අරඹන ලද "ජනපතිට කියන්න" මහජන දුක්ගැනවිලි කළමනාකරණ අන්තර් ජාල අඩවිය පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.

10. 1919 දුරකථන අංකය මඟින්, තැ.පෙ.1323 යටතේ අතිගරු ජනාධිපතිතුමා වෙත යොමුවන සියලුම මහජන/ආයතනික ඉල්ලීම්, ගැටළු නිරාකරණය කිරීමේ වගකීම දරණ ආයතන ප්‍රධානීන් වෙත මහජන දුක්ගැනවිලි කළමනාකරණ දත්ත පද්ධතිය ඔස්සේ යොමු කිරීම, අවශ්‍ය ප්‍රගති හා පසුවිපරම් වාර්තා කැඳවීම තුළින් විසඳුම් ලබාදීමට මැදිහත්වීම සහ අදාළ මැදිහත්විම තුළින් අපේක්ෂිත මහජන සේවාව ලද බව සනාථ කර ගැනීමට කටයුතු කර ඇත.

# 15. මාධ්‍ය අංශය

### *හැඳින්වීම*

අතිගරු ජනාධිපතිතුමාගේ / ජනාධිපති කාර්යාලයේ පැවැත්වෙන විශේෂ රැස්වීම් /සාකච්ඡා /උත්සව පිළිබඳ අනෙකුත් මාධ්‍ය ආයතන වෙත නිරවද්‍යතාවයෙන් හා වගකීමෙන් යුතුව තොරතුරු ලබා දීම

### *පොදු අරමුණු /කාර්යයන්*

- වීඩියෝ ඒකකයේ කාර්යයන් උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව කටයුතු කිරීම
- ජාත්‍යන්තර මාධ්‍ය හා පර්යේෂණ ඒකකයේ කාර්යයන් උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව කටයුතු කිරීම
- කර්තෘ ඒකකයේ කාර්යයන් උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටු කිරීම
- ඡායාරූප ඒකකයේ කාර්යයන් උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටු කිරීම
- නව මාධ්‍ය ඒකකයේ කාර්යයන් උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටු කිරීම

### *2015 වර්ෂයේ සාක්ෂාත් කර ගැනීම්*

| අයිතම | ඉටු කරන කාර්යයන් පිළිබඳ විස්තර |
|---|---|
| 1. ජාතික වැඩසටහන් සංවිධානය කිරීම | ජනාධිපති කාර්යාලය මඟින් හා වෙනත් ආයතන මඟින් සංවිධානය කරනු ලබන ජාතික වැඩසටහන් සජීවීව හෝ පසු විකාශනය සඳහා මාධ්‍ය විකාශන කටයුතු සංවිධානය කිරීම අධීක්ෂණය කිරීම, විකාශනය සඳහා යොමු කිරීම |
| 2. විශේෂ ව්‍යාපෘති - කර්තෘ ඒකකය | ජනාධිපති විශේෂ ව්‍යාපෘති අංශය මඟින් නිකුත් කරන ලද ප්‍රකාශන සඳහා සංස්කරණ සහය ලබාදීම.<br><br>දෛනික දේශීය හා විදේශිය මාධ්‍ය මගින් ශ්‍රී ලංකාව පිළිබඳව ප්‍රචාරය කර ඇති ප්‍රවෘත්ති පිළිබඳව ජනාධිපතිතුමා දැනුවත් කිරීම. |

| | |
|---|---|
| වීඩියෝ ඒකකය | වකුගඩු,මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික වැඩසටහන් මඟින් මහජනතාව දැනුවත් කිරීමේ ප්‍රචාරක පට නිර්මාණය වැඩමුළු පවත්වා විකාශය කිරීම.<br><br>අතිගරු ජනාධිපතිතුමා සහභාගී වන නිල උත්සවවල මාධ්‍ය ආවරණ දර්ශන පුස්තකාල ගත කිරීම සඳහා ජාතික ලේඛනාගාර දෙපාර්තමේන්තුවට යැවීම. |
| **3.** දේශීය හා විදේශීය මාධ්‍ය ආයතන සම්බන්ධීකරණය කිරීම හා ප්‍රවෘත්ති නිවේදන නිකුත් කිරීම | දේශීය විදේශීය මාධ්‍ය ආයතනවලට නිකුත් කරන ලද පණිවිඩ හා ප්‍රවෘත්ති නිවේදන සහ ඒ හා සම්බන්ධ ඡායාරූප යැවීම. |
| **4.** අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිරූපය ගොඩනැංවෙන ආකාරයට ගරු ජනාධිපතිතුමා සහ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ විශේෂාංග ලිපි/ ප්‍රකාශන පල කිරීම | ගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිරූපය ගොඩනැංවෙන අයුරින් ඡායාරූප සකසා පල කිරීම.<br><br>මුල සිට මේ දක්වා සංවර්ධන ව්‍යාපෘතිවල ගරු ජනාධිපතිතුමා සහභාගී වූ අවස්ථා ඉස්මතු වන පරිදි විශේෂ ඡායාරූප පිටු පුවත්පත්වල සහ පොත්පත් සඟරාවල පල කිරීම. |
| **5.** විශේෂිත සම්මන්ත්‍රණ සහ සාකච්ඡා ආදිය පැවැත්වීම | දේශීය /විදේශීය උත්සව /රැස්වීම්, විශේෂ පුවත්පත් සාකච්ඡා ආදිය විධිමත් පරිදි විකාශය සඳහා ජනාධිපති මාධ්‍ය අංශය සහ අවශ්‍ය අවස්ථාවලදී බාහිර මාධ්‍ය ආයතන කැඳවා කටයුතු සංවිධානය කිරීම |
| **6.** ප්‍රදර්ශන | ගරු ජනාධිපතිතුමාගේ කීර්තිය ඔප් නැංවෙන පරිදි සියළු පැතිකඩ ඔස්සේ සිදුවන රටේ සංවර්ධනය පිළිබඳ ඡායාරූප ප්‍රදර්ශන පැවැත්වීම. |
| **7.** දෛනික වාර්තාකරණය | දෛනික දේශීය හා විදේශිය මාධ්‍ය මගින් ශ්‍රී ලංකාව පිළිබඳව ප්‍රචාරය කර ඇති ප්‍රවෘත්ති පිළිබඳව ජනාධිපතිතුමා දැනුවත් කිරීම. |

| |
|---|
| **8.** අවශ්‍ය අවස්ථාවලදී වැඩමුළු / පුහුණු වැඩසටහන් සඳහා කාර්ය මණ්ඩලය යොමු කිරීම ( ධාරිතා සංවර්ධන ) |
| **9.** දෛනික දේශීය හා විදේශීය මාධ්‍ය මගින් ශ්‍රී ලංකාව පිළිබඳව ප්‍රචාරය කර ඇති ප්‍රවෘත්ති පිළිබඳ ජනාධිපතිතුමා දැනුවත් කිරීම |
| **10.** අතිගරු ජනාධිපතිතුමාගේ කථා සහ දේශන සඳහා අවශ්‍ය දත්ත රැස් කිරීම |

# 16. ප්‍රතිසන්ධාන අංශය

## *හැඳින්වීම*

ප්‍රතිසන්ධාන අංශය ආරම්භ කරන ලද්දේ 2015 ජුනි මස සිට ක්‍රියාත්මක වන පරිදිය. සෑම පුරවැසියකුටම සමාන අවස්ථාවන් සැලසෙන, විවිධත්ව හා ජාතික අනන්‍යතාවයට ගරු කරන එකමුතු භාවයෙන් ජීවත්වියහැකි ස්ථාවර දේශයක් ගොඩනැගීමත්, මූලික මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා කර ගනිමින් ජාතික සමගිය හා සංහිඳියාව ඇති කිරීමේ ක්‍රියාවලියට අදාළව කටයුතු කිරීමට මූලික දායකත්වයක් ලබා දීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. මෙම අංශය ජනාධිපති කාර්යාලයේ මග පෙන්වීම මත හිටපු ජනාධිපතිනි ගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ මෙහෙයවීම හා මඟපෙන්වීම යටතේ ක්‍රියාත්මක වේ.

## *පොදු අරමුණු/කාර්යයන්*

- මෙම අංශයේ ප්‍රධාන අරමුණු වනුයේ ජාතික සමඟිය හා සංහිඳියාව ඇති කිරීම සඳහා විවිධ ජාතීන් හා ආගමික නායකයින්, සිවිල් සමාජය නියෝජනය කරන සංවිධාන සහ ජාතික පළාත් සභා සහ ප්‍රාදේශීය දේශපාලන නායකයින් සමඟ සාකච්ඡා පවත්වා ඉහත කී කාර්යයන් ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමයි.

## *2015 වර්ෂයේ දී සාක්ෂාත් කර ගැනීම*

ඉහත අරමුණු ඉටු කර ගැනීම සඳහා 2015 වර්ෂයේ මධ්‍ය භාගයේ සිට කැබිනට් ඇමතිවරුන්, රාජ්‍ය අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, පළාත් සභා හා පළාත් පාලන ආයතන නියෝජිතයින්, සිවිල් සමාජය නියෝජනය කරනු ලබන ආයතන, විවිධ ආගමික නායකයින්, ප්‍රජා මූලික සංවිධාන සමඟ මෙන්ම විදේශ තානාපතිවරුන්, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ශ්‍රී ලංකා නියෝජිතයින්, ආසියානු සංවර්ධන බැංකු හා ලෝක බැංකු නියෝජිතයින් සහ වෙනත් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල නියෝජිතයින් සමඟ සාකච්ඡා පවත්වන ලදී.

- මේ සඳහා ගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ ප්‍රධානත්වයෙන් දේශපාලන පක්ෂ සමඟ සාකච්ඡා වට කිහිපයක් පවත්වා අදාළ වන කරුණු පිළිබඳව තීරණවලට පැමිණෙන අතර එම කරුණු පිළිබඳව වාර්තාවක් සකස් කර අතිගරු ජනාධිපතිතුමාට හා අගමැතිතුමාට එම වාර්තා ඉදිරිපත් කරන ලදී.
- තවද ගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය වෙත ඉදිරිපත් කරනු ලබන විවිධ පළාත් වල මහජනතාවගේ ප්‍රශ්න සඳහා වන ලිපි 500 කට පමණ පිළිතුරු නොපමාව දන්වා යැවීම හා අදාළ ආයතන වෙත යොමු කිරීම සිදු කර ඇත.

# 17. ප්‍රවාහන අංශය

## *හැදින්වීම*



ජනාධිපති කාර්යාලයේ ප්‍රවාහන ඒකකය සතු කාර්යයන් සම්බන්ධයෙන් උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව කටයුතු කිරීම

## *පොදු අරමුණු/කාර්යයන්*

- ගරු ජනාධිපතිතුමන්ට අනුයුක්ත රථ වාහන වලට අදාල සියලු කටයුතු සිදු කිරීම.
- දෛනික ප්‍රවාහන සේවාවන් සැපයීම.
- ජනාධිපති කාර්යාලයට අයත් සියලු රථවාහන නඩත්තු කිරීම.
- ජනාධිපති කාර්යාලය සතු රථවාහන වලට අදාල රක්ෂණය, ආදායම් බලපත්‍ර, දුම් පරීක්ෂණ වාර්තා ලබා ගැනීම.
- රිය අනතුරු සඳහා රක්ෂණ වන්දි ලබා ගැනීම.
- ඉන්ධන ඇණවුම් නිකුත් කිරීම, ඉන්ධන ඇණවුම් ගෙවීම් කටයුතු සඳහා නිවැරදි තාවය පරීක්ෂා කර වවුචර් පිළියෙල කර ගිණුම් අංශයට ඉදිරිපත් කිරීම.
- වාහන අළුත්වැඩියාවන් සහ අදාල සේවාවන් සඳහා වන බිල්පත් පරීක්ෂා කර ගෙවීම් කටයුතු වෙනුවෙන් ඉදිරිපත් කිරීම.
- ඉන්ධන නිකුත් කිරීම් වලට අදාලව ධාවන සටහන් පරීක්ෂා කිරීම සහ ඉන්ධන සඳහා වැයවන පිරිවැය නිසි කළමනාකරණයක් තුළින් පවත්වාගෙන යාම.
- රථවාහන වට්ටෝරු ලේඛණය පවත්වාගෙන යාම, පවරා ගැනීම, පවරා දීම, අපහරණය කිරීම.
- ජනාධිපති කාර්යාලය වෙත බඳවා ගනු ලබන නවක රියදුරන් පුරප්පාඩු පවතින අදාල අංශ සඳහා අනුයුක්ත කිරීම.
- රියදුරන්ගේ සහ කාර්ය මණ්ඩලයේ පරිපාලන කටයුතු ඉටු කිරීම.

## 01. කාර්ය මණ්ඩලය

- ප්‍රවාහන අංශයේ සේවය කරමින් සිටි නිළධාරින් සියල්ලන්ම වෙනත් ආයතනවලට මාරුවී යාමෙන් හා විශ්‍රාම යාමෙන් පසු කාර්ය මණ්ඩලය, රාජ්‍ය සේවයට බැඳුනු නවක නිළධාරීන් හා වෙනත් රාජ්‍ය ආයතනවලින් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ස්ථාන මාරුවීම් ලැබ පැමිණි නිළධාරීන්ගෙන් සමන්විතය. ඒ අනුව දැනට කාර්යාලීය කාර්ය මණ්ඩලයේ කළමනාකරණ සහකාර නිළධාරීන් තිදෙනකු පුරප්පාඩු වී ඇත.

- සියලු රියදුරන් සඳහා ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ සහ වෘත්තීය පුහුණු අධිකාරියේ පුහුණු වැඩසටහන් පවත්වන ලදී. තාක්ෂණික හා මාර්ග නීති පිළිබඳ දැනුමට අමතරව ධනාත්මක චින්තනය හා මානසික ආතති පාලනය පිළිබඳ වැඩමුළු ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පවත්වන ලදී. මෙම සියලු පුහුණු සැසි අවසානයේ සහභාගි වූවන්ගෙන් ලැබූ ප්‍රතිචාර ඉතා යහපත් විය.

- රථවාහන හදිසි අනතුරු සඳහා වන්දි ලබාගැනීමේදි අනුගමනය කලයුතු ක්‍රියාමාර්ග පිළිබඳව රියදුරන් සහ අධීක්ෂණ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සිදු කරන ලදී.

## 02. සේවා සැපයීම

දැනට ප්‍රවාහන අංශය සතු භෞතික හා මානව සම්පත් උපයෝගී කොට ගෙන සතුටුදායක සේවාවක් ලබා දීමට කටයුතු කරන ලදී. 2015.12.30 දින වනවිට රියදුරු කාර්යය මණ්ඩලයේ රියදුරන් 15ක පමණ පුරප්පාඩු පැවතිනි. මෙම තත්වය මත පුරප්පාඩු හේතුවෙන් රියදුරන්ගේ නිවාඩු ඉල්ලීම් පාලනය කිරීමට සිදුවී ඇත.

## 03. කාර්යාලය නවීකරණය

කාර්යාලය විධිමත් අයුරින් සැකසීමේ කටයුතු සඳහා ඉල්ලීම් යොමු කරන ලද අතර, නව පරිගණක මෘදුකාංගයක් ස්ථාපිත කිරීමට නියමිතය. පරිගණක පද්ධතිය නිසි පරිදි ක්‍රියාත්මක කිරීමෙන් කලමනාකරණ තීරණ ගැනීමට අවශ්‍ය වාර්තාවන් ලබා ගැනීම, කඩදාසි භාවිතය අඩුකිරීම හා දෛනික කාර්යයන් කාර්යක්ෂම කිරීමට අපේක්ෂා කෙරේ.

## 04. රථවාහන අලුත් වැඩියා කටයුතු

රථවාහන අලුත්වැඩියා කටයුතු වලට යොමු කිරීමේදී වාහන තාක්ෂණික නිළධාරීන්ගේ පූර්ව අධීක්ෂණයකින් පසු යොමු කරන බැවින් අනවශ්‍ය අළුත්වැඩියාවන් සඳහා ඉල්ලීම් පාලනය කර ඇත. අළුත්වැඩියාවන් ඉටුකල පසුවද වාහන පරීක්ෂාවන්ට ලක්කර ඉවත් කල අමතර කොටස් නැවත භාරගෙන ගබඩා කිරීමට කටයුතු කර ඇත.

## 05. ඉන්ධන පරිභෝජනය

වෙනත් වර්ෂ වලට සාපේක්ෂව ඉන්ධන පරිභෝජනය සතුටුදායක මට්ටමකට අඩුකර ගැනීමට හැකිවී ඇත. එම විස්තර පහත දක්වා ඇත.

| වර්ෂය | ඉන්ධන වියදම (රු) |
|---|---|
| 2014 | 350,000,000.00 |
| 2015 | 120,000,000.00 |

*(ගෙවීම් කටයුතු සඳහා ගිණුම් අංශය වෙත ඉහත වවුචර් ඉදිරිපත් කර ඇති අතර ආසන්න වශයෙන් ගණනය කර ඇත.)*

## 06. රථවාහන හදිසි අනතුරු හා රක්ෂණ වන්දි ලබාගැනීමේ ප්‍රගතිය

- රිය අනතුරු අවම කර ගෙන රාජකාරියේ යෙදෙන ලෙස රියදුරන් දැනුවත් කර ඇති අතර, සිදුවන රිය අනතුරු වලදී නියමිත පරිදි රක්ෂණ වන්දි ලබා ගැනීමට කටයුතු කර ඇත.
- කාර්ය සාධන ඇගයීමේදී සහ වැටුප් වර්ධක ලබා දීමේදී නොසැලකිලිමත් රිය ධාවනය, නිර්ණායකයක් ලෙස සැලකීමට ජනාධිපති ලේකම්තුමා උපදෙස් දී ඇත.

## 07. අධි ආරක්ෂිත වාහන

අධි ආරක්ෂිත රථ නවීකරණය කර සාමාන්‍ය භාවිතයට ගත නොහැකි බැවින්, විකිණීමට හෝ පෞද්ගලික පරිහරණයට පවරාදිය නොහැක. එම රථ විනාශ කිරීමට හෝ පිළිගත් ක්‍රමවේදයන්ට අනුකූලව සාගර පරිසරයට හානිය අවම ලෙස ගැඹුරු මුහුදේ ගිල්වීම මේ දක්වා පැවති ක්‍රමවේදයයි. මීට අමතරව මෙම රථ සම්බන්ධයෙන් සැපයුම් කරුවන්ට නැවත මිලදී ගැනීමට ඇති හැකියාව පිළිබඳවද විමසන ලදී. අපනයනය කිරීමේ නැව් ගාස්තු සහ ප්‍රතිචක්‍රීය කිරීමේ වියදම රජය විසින් දරණු ලබන්නේ නම් රථ භාරගත හැකි බව බෙන්ස් මෝටර් රථ නිෂ්පාදන සමාගම දන්වා ඇත. එබැවින් පාවිච්චියට ගත නොහැකි තත්වයේ හෝ භාවිතයෙන් ඉවත්කල වෙඩි නොවදින රථ ආරක්ෂක අංශ වෙත ලබා දීම පිළිබඳව සලකා බලමින් ඇත.

## 08. නීති කටයුතු සඳහා උසාවි භාරයට පත්වූ වාහන නැවත ලබාගැනීම

අස්ථානගතවීම, හදිසි අනතුරු, අවභාවිතය හා විවිධ හේතූන් මත උසාවි වල අත්අඩංගුවට පත් කර ගාල්කර තිබූ වාහන වල නීතිමය ගැටලු නිරාකරණය කර ගැනීමෙන් පසු නැවත සේවයට එකතු කර ගැනීමට කටයුතු කරමින් පවතී.

## 09. නව මිලදී ගැනීම

අධි ආරක්ෂිත රථ හා ආපදාවන්ට ලක්වන රථ ප්‍රවාහනය කිරීමට මාසිකව අධික මුදලක් වැයවූ බැවින් ජනාධිපති කාර්යලය සඳහා Car Carriers 02ක් මිලදී ගැනීමට කටයුතු කරඇත.

## 10. විගණන විමසුම් හා වාර්තා අනුව අවශ්‍ය ක්‍රියාමාර්ගයන් අනුගමනය කිරීම.

# 18. නීති අංශය

## *හැඳින්වීම*

මෙම අංශය 2015 මාර්තු මස 18 වන දින පිහිටුවන ලද අතර, ජනාධිපති ලේකම් කාර්යාලය හා සම්බන්ධ සියලුම නීති කටයුතු මෙහෙයවීම හා උපදෙස් ලබා දීම සිදු කෙරේ.


## *පොදු අරමුණු/ කාර්යයන්*

- අතිගරු ජනාධිපතිතුමන් වග උත්තරකරු කරමින් ඉදිරිපත් කරනු ලබන මූලික අයිතිවාසිකම් නඩු සහ ජනාධිපති ලේකම් හෝ එම කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් අධිකරණයේ පවරා ඇති නඩු සම්බන්ධීකරණය සහ නියෝජනය කිරීම.
- මෙම ආයතනයේ සෑම අංශයකටම අදාල නෛතික ගැටලු සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම.
- අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලද ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා නිර්දේශ අනුව ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා වාර්තා සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කිරීම.
- ජනාධිපති කාර්යාලය විසින් වෙනත් පාර්ශ්වයන් සමඟ එළඹෙන්නාවූ ගිවිසුම් අධ්‍යයනය කර නිරීක්ෂණ හා නිර්දේශ ලබාදීම.
- අමාත්‍ය මණ්ඩල අනුකමිටු වෙත යොමු කරන නීති කෙටුම්පත් සම්බන්ධයෙන් නිරීක්‍ෂණ ලබාදීම.
- අතිගරු ජනාධිපතිතුමා විසින් යොමු කරනු ලබන ගොනු සම්බන්ධයෙන් අදාළ වාර්තා කැඳවා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.
- අමාත්‍ය මණ්ඩලය ජනාධිපති ලේකම් වෙත යොමු කරන නව අණ පනත් සම්බන්ධයෙන් අවශ්‍ය අවස්ථාවන්හිදී නිරීක්‍ෂණ ඉදිරිපත් කිරීම.

## *2015 වර්ෂයේ සාක්ෂාත් කර ගැනීම්*

➢ 2015 වර්ෂයේදී ලැබුණු නඩු ගොනු පිළිබඳ සංක්ෂිප්ත සටහන

| මුළු නඩු ගොනු සංඛ්‍යාව | 2015 අවසන් වූ නඩු ගොනු සංඛ්‍යාව | තවදුරටත් විභාග වෙමින් පවතින නඩු ගොනු සංඛ්‍යාව |
|---|---|---|
| 53 | 18 | 35 |




➢ 2015 වර්ෂයේදී ජනාධිපති කාර්යාලය විසින් වෙනත් පාර්ශවයන් සමඟ අත්සන් කරන ලද හා අධ්‍යනය කරන ලද ගිවිසුම් පිළිබඳ සංක්ෂිප්ත සටහන.

- චීන තාක්ෂණික කණ්ඩායම වෙත ලබාදී ඇති පැලියගොඩ ගබඩා සංකීර්ණයේ නව ගිවිසුම.
- ජනාධිපති ආරක්ෂක අංශයේ නේවාසික පහසුකම් සඳහා නො 1 මුදලිගේ මාවතේ අංක 07 ගොඩනැගිල්ලට අදාල බදු ගිවිසුම.
- කොළඹ 01 ජනාධිපති මාවත අංක 17 දරණ ගොඩනැගිල්ල සඳහා ආරක්ෂක සේවාවට අදාල ගිවිසුම.
- කොළඹ 01 වැතැම් වීදියේ අංක 21 දරණ ගොඩනැගිල්ට අදාල බදු ගිවිසුම.

- කොළඹ 01 සර් බාරෝන් ජයතිලක මාවතේ අංක 6 දරණ ගොඩනැගිල්ලට අදාල බදු ගිවිසුම.

- කොළඹ 01 වැතැම් වීදියේ අංක 93 දරණ ගොඩනැගිල්ලට අදාල බදු ගිවිසුම.
- කොළඹ 03 ආර්.ඒ.ද මෙල් මාවතේ පිහිටි වරිපනම් අංක 10/ සී දරණ ගොඩනැගිල්ලට අදාල බදු ගිවිසුම.
- කොළඹ 01 ජනාධිපති මාවතේ අංක 41 දරණ ගොඩනැගිල්ලට අදාල බදු ගිවිසුම.
- පැජට් පාරේ ජනාධිපති නිල නිවස අසල සනීපාරක්ෂක සේවා සැපයීමේ ගිවිසුම.
- කොළඹ 07 ලොන්ඩන් පෙදෙස අංක 30/75A දරණ ගොඩනැගිල්ලට අදාල බදු ගිවිසුම.
- කොළඹ 01 වැතැම් වීදියේ අංක 61 දරණ ගොඩනැගිල්ලට අදාල බදු ගිවිසුම.
- බණ්ඩාරණායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ 5 වන කොටස පළමු මහල සඳහා වන ගිවිසුම.
- ජනාධිපති ලේකම් හා Hayleese Agriculture Holdings Ltd ආයතනය සමඟ අත්සන් කරන ලද ගිවිසුම.

- අතිගරු ජනාධිපතිතුමා ඝාතනය කිරීමට තැත්කළ එල්.ටී.ටී.ඊ සාමාජික සිවරාජා ජෙනිවන් නැමැති සිරකරුවා 2015.12.25 වන නත්තල් දින නිදහස් කිරීමට කටයුතු සම්පාදනය කිරීම.



- වාහන සම්බන්ධයෙන් අධිකරණ කටයුතු

  - නඩු අංක B 20031/14 යටතේ GD 7209 දරණ වාහනය අධිකරණයෙන් මුදවා ගෙන ජනාධිපති කාර්යාලය වෙත ලබා දීම.
  - නඩු අංක B 139/2015 යටතේ WPKJ 0698 දරණ වාහනය අධිකරණයෙන් මුදවා ගෙන ජනාධිපති කාර්යාලය වෙත ලබා දීම.
  - නඩු අංක B 9235/2015 යටතේ WPLD 1112 දරණ වාහනය අධිකරණයෙන් මුදවා ගෙන ජනාධිපති කාර්යාලය වෙත ලබා දීම.
  - නඩු අංක B 240/16 යටතේ KB 9980 දරණ වාහනය අධිකරණයෙන් මුදවා ගෙන ජනාධිපති කාර්යාලය වෙත ලබා දීම.

- ජනාධිපති ලේකම් වෙත 2015 වසරේදී යොමු කරන ලද පහත සඳහන් නව අණ පනත් සම්බන්ධයෙන් කටයුතු කිරීම.

  - ජාතික විගණන පනත.
  - තොරතුරු දැනගැනීමේ පනත.
  - කේවල හා සමානුපාතික ඡන්ද ක්‍රමවේදයන්ගෙන් සමන්විත මිශ්‍ර මැතිවරණ ක්‍රමයක් හඳුන්වා දීම තුලින් මැතිවරණ ක්‍රමය සංශෝධනයට යෝජිත ව්‍යවස්ථා සංශෝධනය.
  - බරීරා මුස්ලිම් කාන්තා අරාබි විද්‍යාලය සංස්ථාපිත කිරීම

# 19. වෛද්‍ය සේවා ඒකකය

## *හැඳින්වීම*

ජනාධිපති ලේකම් කාර්යාලය තුළ පවත්නා වෛද්‍ය සේවා ඒකකය ජනාධිපති ලේකම්තුමා යටතේ ක්‍රියාත්මක වන අතර ගරු ජනාධිපතිතුමාගේ සහ සමීප ඥාතීන්ගේ මෙන්ම ජනාධිපති ලේකම් කාර්යාලයේ නිලධාරීන්ගේ සෞඛ්‍ය යහපත් මට්ටමක පවත්වාගෙන යාමට අවශ්‍ය උපදෙස් සහ ප්‍රතිකාර ලබා දෙනු ලබයි.

එයට අමතරව ආර්ථික දුෂ්කරතා සහිත පුරවැසියන්ගේ සෞඛ්‍ය තත්ත්වය නගා සිටුවීමට අවශ්‍ය සහන කටයුතු සැලසුම් කිරීමද මෙම ඒකකය මඟින් සිදු කරනු ලැබේ.

## *පොදු අරමුණු /කාර්යයන්*

- ගරු ජනාධිපතිතුමාගේ රථපෙළ සමඟ ගමන් ගන්නා ගිලන් රථය සක්‍රිය තත්වයෙන් පවත්වාගෙන යාමට අවශ්‍ය ක්‍රියාකාරී වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක තත්වයෙන් පවත්වාගෙන යාම.
- එම ගිලන් රථයේ නඩත්තු කටයුතු සහ සැපයුම් පිළිබඳව නිරන්තරයෙන් සොයා බලා අවශ්‍ය කටයුතු වලදී ඒ සඳහා මැදිහත්ව ක්‍රියාකිරීම.
- ගරු ජනාධිපතිතුමාගේ සෞඛ්‍ය කටයුතු මෙරටේ දී මෙන්ම පිටරට තුළදී ද සොයාබලා අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා එතුමා සමඟ ගමන් කිරීම
- කාර්යාලීය නිලධාරීන්ට යහපත් සෞඛ්‍ය තත්ත්වයක් පවත්වාගෙන යාමට අවශ්‍ය දැනුම ලබා දීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- කාර්යාලයේ නිලධාරීන්ට වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීමට උපදෙස් ලබාදීමටත්, ප්‍රතිකාර කිරීමටත් වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
- කාර්යාලයේ නිලධාරීන්ට විශේෂඥ වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා අවශ්‍ය අවස්ථාවලදී සෙසු ප්‍රධාන සෞඛ්‍ය ආයතන වෙත යොමු කිරීම
- කාර්යාලය මඟින් පොදු මහජනතාවගේ සුභ සාධනය සඳහා වරින් වර සැලසුම් කර දුෂ්කර ප්‍රදේශවලදී පවත්වනු ලබන සෞඛ්‍ය වැඩසටහන් ගුණාත්මකව පැවැත්වීම සඳහා උපදෙස් හා ක්‍රියාකාරී දායකත්වයන් අවශ්‍ය අවස්ථාවලදී ලබා දීම

රටේ අවශ්‍යතාවය අනුව කාලානුරූපීව ඇතිවිය හැකි ඕනෑම සෞඛ්‍ය කටයුත්තක් සඳහා අවශ්‍ය වැඩසටහන් සැලසුම් කර ක්‍රියාවට නැංවීම.

# 20. ජනාධිපති විමර්ශන ඒකකය

*මෙහෙවර*

*රජයේ දේපළ අයථා ලෙස පරිහරණය කිරීමෙන් සිදුවන මූල්‍ය නාස්තිය වැලැක්වීම රාජ්‍ය ආයතනවල සිදුවන වංචා දූෂණ අවම කිරීම*

## *හැඳින්වීම*

මෙම ඒකකය අභ්‍යන්තර පාලන ඒකකය යටතේ පවත්වා ගෙන යනු ලැබේ.

## *පොදු අරමුණු/ කාර්යයන්*

- රාජ්‍ය අංශයන්හි සිදුවෙතැයි චෝදනා කරනු ලබන අක්‍රමිකතා විමර්ශනය කොට නියෝග පරිදි අතිගරු ජනාධිපතිතුමාට හෝ ජනාධිපති ලේකම්තුමාට වාර්තා කිරීම.

## *2015 වර්ෂයේ සාක්ෂාත් කර ගැනීම්*

- 2015 ජනවාරි 08 වන දින වර්තමාන ජනාධිපතිතුමා පත්වීමෙන් පසුව ,එතෙක් පැවති ජනාධිපති විමර්ශන ඒකකයේ කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදුන අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු විමර්ශන නිලධාරීන් 12 දෙනෙකුගේ සේවය අවසන් කර ඇති අතර, අනුයුක්ත කර සිටි රාජ්‍ය නිලධාරීන් 06 දෙනෙකු ස්ථාන මාරු කර යවා ඇත.
- තවද, වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අනුයුක්ත නිලධාරීන් 04 දෙනෙකු මෙම ඒකකයේ විමර්ශන නිලධාරීන් ලෙසට සේවය කළ අතර ,ඔවුන් භාරයේ විමර්ශන ගොනු තබා ඇත.මේ අතර, පොලිස් දෙපාර්තමේන්තුවේ විශ්‍රාමික නිලධාරීන් දෙදෙනෙකුද, 2015 වසරේ ජූලි මස සිට විමර්ශන නිලධාරීන් ලෙසට අනුයුක්ත කර ඇත.
- 2015 වර්ෂයේ පැවති අධිකරණමය කටයුතු සහ විනය පරීක්ෂණ වෙනුවෙන් නිසි අවසරය මත ගොනු ඉදිරිපත් කර සාක්ෂි ලබා දීම සිදු කර ඇත.
- 2015 වර්ෂයට අදාලව ලැබී ඇති පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශන කටයුතු කිසිවක් සිදුකර නොමැත.

# 21. ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

## *හැඳින්වීම*

ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව වෙත ලැබෙන සියළුම පෙත්සම් පිළිබඳව කටයුතු කිරීම සිදු කරනු ලැබේ.

## *පොදු අරමුණු / කාර්යයන්*

- අංක *1904 /57* දරණ ගැසට් නිවේදනය අනුව බරපතල, වංචා දූෂණ, රාජ්‍ය සම්පත් වරප්‍රසාද බලය සහ අධිකාරිය අනිසි ලෙස භාවිතා කිරීම සම්බන්ධයෙන් විමර්ශනය

## *2015 වර්ෂයේ සාක්ෂාත් කර ගැනීම්*

- 2015.03.06 දින සිට 2015.12.31 දින දක්වා කොමිෂම වෙත ලැබුණු පෙත්සම් ප්‍රමාණය 1350 ක් වන අතර එයින් කොමිෂන් සභාව වෙත 881 ක් යොමු කරන ලද අතර විධි නියෝග අනුව ප්‍රතික්ෂේප කරන ලද සංඛ්‍යාව 602 ක් වන අතර වෙනත් ආයතන වෙත යොමු කරන ලද සංඛ්‍යාව 13 ක් වන අතර විමර්ශනය සඳහා යොමු කරන ලද සංඛ්‍යාව 246 ක් වේ.